FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

# රංගිරි ශ්‍රී ලංකා

## RANGIRI SRI LANKA NEWSPAPER



FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

ශ්‍රී.බු.ව. 2563- ක්‍රි.ව. 2020
අප්‍රේල් (බක්)

මාසික බෞද්ධ සාර සංග්‍රහය ~ අන්තර්ජාල කලාපය

17



රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය

රංගිරි ශ්‍රී ලංකා
RSL TELEVISION

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය
දේශයේ රන් හඬ

රංගිරි ශ්‍රී ලංකා
RSL RADIO

FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk

රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.




බක් මාසය සත්වයින්ගේ සිත් සතන් සනසන පියකරු, ප්‍රබෝධිත වූ මාසයක් ලෙස සැළකේ. බුදුරජාණන් වහන්සේ සුන්දර සිරිලකට දෙවන වරට වැඩම කලේ බක් මාසයේදීය. බුද්ධත්වයෙන් පස්වෙනි වර්ෂයේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩවෙසෙන බුදුරජාණන් වහන්සේ ලක්දිව චූලෝදර මහෝදර යන නාග ගෝත්‍රික රජවරුන් දෙදෙනා මැණික් පුටුවකට යුද්ධ කිරීමට සැරසෙන බව දිවසින් දුටු සේක. බුදුරජාණන් වහන්සේ ඔවුන් කෙරෙහි මහා කරුණාවෙන් බක් මස අවපසළොස්වක් පොහෝදා අළුයම ඍද්ධි බලයෙන් නාගදීපයට වැඩම කළ සේක.

චූලෝදරගේ සීයා කලුරිය කරනවිට තමා සතුව තිබුණු ඉතා වටිනා මැණික් පුටුව පුතාට නොදී චූලෝදරගේ මව වන දියණියන් හට දුන්නේය. මාමා සහ බෑනා වන චූලෝදර මහෝදරයන් අතර යුද්ධයට හේතුවූයේ මෙම මැණික් පුටුවේ අයිතිය පිළිබඳ ගැටළුවයි. බුදුරජාණන් වහන්සේ මෙම ලංකාගමනට දෙව්රම් වෙහෙර දොරටුව සමීපයෙහි කිරිපලු රුක අරක්ගෙන සිටි සමිද්ධි සුමන නම් දිව්‍ය පුත්‍රයාද කැඳවූ සේක. එම දෙව්රද තමාගේ භවනය වූ කිරිපලු රුක උදුරා තථාගතයන් වහන්සේට ඡත්‍රයක් මෙන් අල්ලාගෙන තමා පෙර ජාතියේ විසූ ස්ථානයට පැමිණියේය.

බුදුරජාණන් වහන්සේ බක් පොහෝදා උදෑසනින්ම ලංකාද්වීපයට වැඩමවා අහසෙහි සිට එහි යුධ බිමට වැද සිටි නාග ගෝත්‍රිකයින්ට අඳුරක් මවා තමන් වහන්සේ දැකීමට සැලැස්වූ සේක. එම අවස්ථාවේ සැනසීමට පත්වූ දෙපිරිසම බුදුරජාණන් වහන්සේගේ සිරිපා වැන්දහ. චූලෝදර මහෝදර නාරජවරුන් දෙදෙනා ප්‍රධාන පිරිසට සමඟිවීමේ අනුසස් වලට අදාල දහමක් දෙසූ සේක.

එම දේශනාවෙන් ප්‍රීතියට පත් නාරජවරුන් දෙදෙනා මැණික් පුටුව බුදුරජාණන් වහන්සේටම පූජා කළහ. බුදුරජාණන් වහන්සේ එම පුටුවෙහි වැඩ හිඳ දිව්‍යමය ආහාරපාන වළඳා පසුව රැස්ව සිටි නාග ගෝත්‍රිකයන් සරණ ශීලයෙහි පිහිටවූ සේක. පසුව එම මැණික් පුටුව නිධන් කර එහි දාගැබක් කරවූහ. මෙම ඓතිහාසික සිදුවීම අති මහත් බැතියෙන් සමරන පොහෝ දිනයක් ලෙස බක් පොහොය සැළකේ. මෙම උතුම් පොහෝ දිනයෙහි ලංකාවාසී බෞද්ධ ජනතාව ආමිස හා ප්‍රතිපත්ති පූජාවන්හි යෙදෙමින් අපමණ කුසල් දහම් රැස්කර ගනිති. නිවන් මඟ සාදා ගනිති.



ඇම්.ඩී.විජයවර්ධන

# සිරිලකට බොදු සුවඳ විදූ බක් පොහොය

බක් මාසය මුළු මහත් ලක්වැසියාටම සිත් පිනවන නෙත් සනසන හැඟුම්බර මාසයකි. අප්‍රේල් මාසය තුළ එළඹෙන්නේ බක් පොහොයයි. ශ්‍රී ලංකා ද්විපය දෙවන වරටත් බුදු සිරිපා පහසින් පිවිතුරු බවට පත්වූයේත් එම දම් රදාණන්ගේ සවනක් රැස් කදින් මුළු හෙලදිව ආලෝකවත් වූයේත් දහම් අමා මිහිරෙන් නොයෙක් දනා නිවී සැනහී ගියේත් බක් මාසයේය.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැඩ වසමින් ලක්දිව චූලෝදර මහෝදර නා රජුන්ගේ මිණිපළග නිසා ඇතිවූ යුද්ධය වැළැක්වීමට වෙහෙර දොරටුවේ කිරිපළු රුකෙහි සිටි දෙවියා සමඟ ඍද්ධියෙන් නාගදීපයට වැඩි සේක.

බුද්ධත්වයෙන් පස්වෙනි වර්ෂයේ සිදුවූ මේ සිද්ධිය බෞද්ධ ලක්වැසියාට ඉතා වැදගත් සිහිවටනයකි. එදා ඒ මිණි පළඟ බුදුන්ට පුදනු ලැබීය. මණි අක්ඛිත නාග රාජයා බුදුන් වහන්සේට වඩින ලෙස ආරාධනා කළේත් මේ දිනයෙහිම බව සඳහන් වේ.

මෙම චූලෝදර මහෝදර යන නා රජුන් දෙදෙනා ඥාතිකමින් මාමයි බෑණයි වශයෙනුත් සඳහන් වන්නේ. පාලි භාෂාවෙන් උදර යනුවෙන් සඳහන් වන්නේ බඩටයි. මහා යනු විශාල බවද චූල යනු කුඩා බවද අර්ථවත් වේ. එනම් කුඩා බඩ සහ මහ බඩ යන නම් වලින් අර්ථවත් වූ මෙම නාග ගෝත්‍රිකයින්ගේ පාලන බල ප්‍රදේශය විශාල ප්‍රදේශයක පැතිරී තිබුණු බව සඳහන් වේ.

මහා බල සම්පන්න මහෝදර නාගරාජ තෙමේ මුහුදේ පන්සියයක් යොදුන් නාග භවනයෙහි අධිපති කම් කරමින් සිටියේය. ඔහුගේ සහෝදරී කන්වඩමන් නම් පර්වතයෙහි නා රජු හට පාවා දෙනු ලැබුවාය. ඒ දෙදෙනාට ලැබුණු පුත්‍රයා චූලෝදර නම් විය. ගොඩ වැසි නාගයෝත් මුහුද වැසි නාගයෝත් මෙන් මහා බල සම්පන්නයෝ වූහ.

චූලෝදරගේ සීයා කළුරිය කරන කල්හි තමා සතුව තිබුණු ඉතා වටිනා මැණික් පුටුව පුතාට නොදී චූලෝදරගේ මව වන දියණියන් හට දුන්නේය.

මාමා සහ බෑණා එනම් චූලෝදර මහෝදර යන නා රජුන් දෙදෙනා අතර යුද්ධයට හේතු වූයේ මේ මිණි පළඟය. බුදුරජාණන් වහන්සේගේ මේ ගමනට දෙව්රම් දොරටුවේ කිරිපලු රුක අරක් ගෙන සිටි සමිද්ධි සුමන නම් දෙවියාද කැඳවූ සේක. ඒ දෙව් රද තමාගේ භවනය වූ කිරිපලු රුක උදුරා තථාගතයන් වහන්සේට ඡත්‍රයක් මෙන් අල්ලාගෙන තමා පෙර භවයේ විසූ ස්ථානය වන නාගදීපයට පැමිණියේය. සමිද්ධි සුමන දිව්‍යරාජයා දෙව්රම් වෙහෙරේ දොරටුවේ කිරිපලු රුක අධිගෘහිත දේවතා වන්නට පෙර ජාතියේ නාගදීපයේ මනුෂ්‍යයෙකුව ඉපිද සිටියේය. එකල කිරිපලු වෘක්ෂයක් යට වැඩසිටි දන් වළඳන පසේ බුදුවරයන් වහන්සේලා දැක උන්වහන්සේලාට පාත්‍ර පිරිසිදු කරගන්නට කොළ කඩා දුන් පින් බලේ මිනිස් තෙමේ දෙව්රම් වෙහෙරේ කිරිපලු රුකෙහි දෙවියෙකුව උපන්නේය. මහා වංශයට අනුව අපට ඉහත කතා ප්‍රවෘත්තිය දක්වීමට පුළුවන.

මෙම චූලෝදර මහෝදර යුධ ගැටුම සංසිඳවීම සඳහා බුදුරජාණන් වහන්සේ නාගදීපයට වැඩම කොට අහසෙහි සිට එම යුධබිමට වැද සිට දෙපසෙහි නාගයන් බිය ගන්වනු සඳහා මහත් ගන අඳුරක් මැවූහ. නාගයන් බියෙන් හැකිලී සිට ආලෝකයක් මවා සොම්නසට හා සැනසීමට පත් නාගයෝ සර්වඥයන් වහන්සේ දැක බුදු සිරිපා කමල් වැන්දාහ.

ලෝක නාථයන් වහන්සේ චූලෝදර මහෝදර නා රජුන් දෙදෙනා ප්‍රමුඛ දෙපක්ෂයේ පිරිස සමඟි කරවීමට සමත් ධර්මයක් ඔවුනට දේශනා කළහ. සසර ආදීනව, මක්ඛ පලාසාදීන්ගේ ආදීනව, කාකොලුක ජාතකය, එන්දක ජාතකය, ලටුකික ජාතකය, වට්ටක ජාතකය, යන මේවායින් වෛර කිරීමෙහි ඇති දෝෂයන් හා සමඟි බවේ අනුසස්ද ප්‍රකාශ කරමින් බුදුන් වහන්සේ අවවාද දුන් සේක. පසුව යුධ වැදි සිටි නාරජුන් දෙදෙනා ධර්ම කතා ශ්‍රවණයෙන් අපමණ ප්‍රීතියට පත්ව යුද්ධයට හේතු වූ මිණි පළඟ තථාගතයන් වහන්සේට පිදූහ. අහසින් බැස එහි වැඩ හුන් සර්වඥයන් වහන්සේ නාගයන් විසින් පිළිගන්වන ලද දිව්‍ය ආහාර පාන වළඳා අවසන අසූ කෝටියක් නාගයන් තිසරණ පන්සිල්හි පිහිටුවා පාරිභෝගික චෛත්‍යයක් වශයෙන් වැඳුම් පිදුම් කරනු පිණිස කිරිපලු රුක හා මිණි පළඟ නාගයන්ට පවරා දී සැවැත් නුවර දෙව්රම් වෙහෙරට පෙරළා වැඩියහ.

අවුලේගම රණවනයාගම/බමුණුගෙදර ශ්‍රී සඳහම් සෙවන බෞද්ධ මධ්‍යස්ථානාධිපති කොබෙයිගනේ පුබ්බිලිය ශ්‍රී සාරානන්ද පිරිවෙනේ නියෝජ්‍ය පරිවේනාධිපති ගලගෙදර රතනවංස හිමි



# ශික්ෂණයෙන් ඇරඹෙන බෞද්ධයාගේ ඥාන මාර්ගය

ධාර්මික ජීවිතයක් යනු හිතට එකඟව ජීවත් වීමයි. පාපකර්ම ලෙස හඳුන්වා ඇති ක්‍රියාවන් එකක්වත් හිතට එකඟව කරන්නට බැහැ. මනස සියල්ලටම ප්‍රධාන වන බැවින් කුමන හෝ කරුණක් කෙරෙහි සිත යොමුකරන විටම ඒ සඳහා ගැළපෙන ආකාරයට මනස සකස්වීම ස්වාභාවිකව සිදුවෙනවා.

"චේතයිත්වා කම්මං කරෝතී කායේන වාචාය මනසා"

යන ධර්ම පාඨයට අනුව කර්මය යනු චේතනාව මුල්කර ගෙන සිදුවන්නක් බව පැහැදිළියි. කය, වචන, මනස යන තිදොර සංවරව පවත්වා ගතයුතු බවට ඉගැන්වීමක් බුදු දහමේ පවතින්නේ ඒ නිසාය.

ඉහත කී තුන්දොර සත්වයා භාවිතා කරන්නේ තමා මුහුණ දෙන අත්දැකීම් මගින් ලබාගත් අවබෝධයන්ට අනුව සිය ප්‍රතිචාරය දැක්වීමටයි. කාය කර්ම, වාචීකර්ම, මනෝ කර්ම ලෙස දක්වා ඇති මෙම ක්‍රියා පද්ධතිය පුද්ගලයාගේ ගුණාගුණ පිළිබඳ මිණුම් දඬු නිර්මාණය කරනවා.

අපට මෙහිදී වැදගත් වන්නේ ගුණාත්මක බවින් පිරිපුන් යහපත් පෞරුෂයකින් යුක්ත මානවයෙකු නිර්මාණය කිරීමට බුදුදහම තුළින් ලැබෙන අවස්ථාවක් විමසා බැලීමටයි. මිනිසා අකුසල් නොකළ යුත්තේ ඒවා මිනිස්කමට නුසුදුසු නිසාම නොව ප්‍රති විපාක කටුක වන බැවිනි. කුසල් කළ යුත්තේ මානව ධර්ම ආරක්ෂා කර ගනිමින් අනාගතය සුවදායක වනු පිණිසයි.

"යථාපි පුප්ඵ රාසිම්හා කයිරා මාලා ගුණේ බහූ ඒවං ජාතේන මච්චේන කත්තබ්බං කුසලං බහු"

ධම්මපදයට අනුව "උපන් මිනිසාගේ වගකීම" මෙසේ දැක්විය හැකිය. යම් සේ විවිධ මල්වර්ග එක්රැස්කොට මාලාකරුවා විසින් මල් මාලා ගොතන්නේද, එසේම උපන්නාවූ සත්වයා විසින් බොහෝ කුසල් කළ යුතුය යනුවෙන් බුදුරජාණන් වහන්සේ ඉතා මැනවින් පැහැදිලි කර වදාළේ මානව චර්යාවන්හි පැවැතිය යුතු ශ්‍රේෂ්ඨත්වය සිහිපත් කර දෙමිනි.

**උත්තම මිනිසුන් ප්‍රඥාවෙන් සත්‍යය දැක කාමභෝගී දිවි මඟ අත්හැර අපිස් දිවියකට අවතීර්ණ වන්නේ නම් මේ අහිමි වී ගිය ප්‍රභාශ්වර උරුමය යළි උදා කර ගැනීමටයි.**

පසිඳුරන් මගින් සිතට ගලා එන විවිධ කාමී සංකල්ප වලට හිස නවා හදවතින් වැළඳගෙන ඒවාට අවනතව ලබාගන්නා තෘප්තිමත් බව, පෙරළා ආපසු ලබාදෙන කටුක දුක් වේදනා වලින් නිමාවක් දකින්නේ නැත.

කාම තුලාවන්හි ඇලී ගැලී විඳින තාවකාලික සුඛ වේදනා පසුව දුක්ඛ වේදනා බවට පත්වන බැවින් එවන් අසරණ තත්වයකට ඇද වැටුණ අවස්ථාවක පිහිට වීමට සරණ වීමට ඇති එකම බලවේගය කළ කුසල් පමණි. එහිදී පුද්ගලයා කුසල හීනයෙකු නම් අපා දුක් හැර කවර පිහිටක්ද?

මුලින් දැක්වූ මාලාකරුවා බුදුන් දවස විසූ දක්ෂ නිර්මාණ කරුවෙකි. ඔහු ගස්වල අතු අග පිපි සුවඳවත් මල් බොහෝ ප්‍රවේශමෙන් නෙලා ගනී. කටු අකුල්වල සුපිපි පිවිතුරු පුෂ්පයන් ඔහු නෙළා ගනී. ගඟට, වැවට හෝ විලට බැස දිවි පරදුවට තබා උපක්‍රමශීලීව දිය මත සුපිපි විකසිත පද්මයෝ නෙළා ගනී. මේ සියල්ල විවිධ වර්ණයෙන් හා විවිධ සුගන්ධයෙන් පිරිපුන්ය. පාට අනුව, හැඩය හා ප්‍රමාණය අනුව තැනට සුදුසු ලෙස මල් තබා ඔහු ගොතන මල්දාමය රජවරුන් කුමර කුමරියන් සිටු වරුන් සිටු දේවි වරුන් මිළට ගෙන පැළඳගෙන විරාජමානව සතුටු වෙති.කළ මේ ගාථා ධර්මයෙන් මැනවින් පැහැදිලි කරයි.

"සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උප සම්පදා
සචිත්ත පරියෝ දපනං
ඒතං බුද්ධානු සාසනං"

මුල් දෙපදයෙන් කියැවෙන්නේ පාපයන් නොකොට කුසල් රැස්කර යුතු බවයි. තුන්වෙනි පදයද ගැඹුරු අරුතක් ළිහිල් කොට දක්වයි. "සචිත්ත" යනුවෙන් අවධාරණය වන්නේ ස්වකීය චින්තනයයි. තමන්ගේ සිත, සිය මනස, ආදී අරුත එහි ගැබ් වී තිබේ. පරියෝදපනය යනු මනාව හික්මවා ගැනීමයි. සිත නිසා උපන් අපි සිත නිසා ජීවත්වන අපි සිතට යටත්ව විසීම සාධාරණ යැයි ඇතැම්විට සිතෙන්නට පිළිවන.

කරගත් සිත සැප ගෙන දෙන බව (චිත්තං දන්තං සුඛාවහං) මේ අනුව පැහැදිළි වේ.

ජීවිතයකට අගය හා අභිමානය සදාතනිකව ආරක්ෂා කර ගැනීමට මේ දැහැමි මඟ වගකීමෙන් යුතුව ගමන් කිරීම උපන්නාවූ සත්වයාගේ යුතුකමකි. එසේම එය මිනිසාගේ උරුමයයි.

**"පබස්සරමිදං භික්ඛවේ චිත්තං"**

යන ඉගැන්වීම මගින් සනාථ කරන්නේ අපේ සිත උපතින් ප්‍රභාශ්වර වූ පිරිසිදු වූ වස්තුවක් බවයි. ආගන්තුකව පැමිණෙන ක්ලේෂ ධර්ම මගින් එය අපිරිසිදු වන අතර එමගින් සත්වයා දුකට පමුණුවන බවයි. උත්තම මිනිසුන් ප්‍රඥාවෙන් සත්‍යය දැක කාමභෝගී දිවි මඟ අත්හැර අපිස් දිවියකට අවතීර්ණ වන්නේ නම් මේ අහිමි වී ගිය ප්‍රභාශ්වර උරුමය යළි උදා කර ගැනීමටයි.

ඒ සඳහා ද මූලික පියවර වන්නේ පස් පව් දස අකුසල් ආදියෙන් අත් මිදී සිල්වත් වීමයි. ඒ සීලය නිසා පහළ වන සමාධිය සිතට එකඟ බවක් උදාකරයි. එය චිත්තේකාග්‍රතාවය ලෙස දහමින් කියයි.

සීලය නිසා සමාධියත් සමාධිය නිසා ප්‍රඥාවත් මිනිස් සිතට උරුම කර ගන්නට හැකියාව තිබේ. මේ ත්‍රිවිධ ශික්ෂණය බෞද්ධයා නිවැරදි මඟට ගෙන යන සනාතනික මාවතයි.

එහෙත් සිතට වහල්වීම හෝ යටත්වීම යනු පසිදුරන්ගේ ඉල්ලීම් ඉටුකිරීමට වහලෙකු සේ වැඩ කිරීමයි. බුද්ධි වර්ධනයට හෝ ප්‍රඥාවේ දියුණුවකට ඉන් ඉඩක් නොමැත. සිත උපදින්නේ පසිඳුරන් අරමුණු හා ගැටීමේ ප්‍රතිඵලයක් ලෙසින් බව අපි දනිමු. ඒ සිත් වැල යදම් වැලක් සේ අපව වෙලාගෙන යටත් කරගෙන අපේ ආත්මීය නිදහසට බාධා කරන නිසයි. එය දමනය කරගත යුතු බව දහමින් කියන්නේ, දමනය

මේ නිර්මාණශීලී කලාකරුවා ආදර්ශයට ගත්විට උපන් සක්වයා හෙවත් මිනිසා සිය වගකීමක් ලෙස සලකා කුසල් දාමයන් ගෙතිය යුතු බව පැහැදිළිය.

අකුසලයන්ගෙන් අත් මිදී කුසලයන්හි යෙදී වාසය කිරීම මේ අනුව ධාර්මික ජීවිතයක් ගත කිරීම ලෙස අර්ථවත් වේ. ධාර්මික මිනිසා මොලොවත් පරලොවත් සංරක්ෂිත සත්වයෙකි. නිවන් මඟට බැස සසර දුකින් අත මිදෙන තුරු (යාව නිබ්බාන පත්තියා) දුගතිගාමී නොවී සිටිමට මග බලා ගත යුතුය. මේ බව බුදු දහම සංක්ෂිප්ත

කුරුණෑගල විශුද්ධායන විද්‍යායතන පිරිවෙන් ආචාර්ය ශාස්ත්‍රපති සාම විනිසුරු වික්‍රමසිංහ අතපත්තු



## බක් පෝදා වැදගත්කම

සම්බුද්ධත්වයෙන් පස්වෙනි වසරේදී බුදුරජාණන් වහන්සේ දෙවෙනි වරට ශ්‍රී ලංකාද්වීපයට වැඩම කරවූ උතුම් පොහෝ දිනයයි. චූලෝදර, මහෝදර යන නාරජුන් අතර මැණික් පුටුවකට ඇතිවන්නට ගිය යුද්ධය සංසිඳවීම පිණිස නාගදීපයටද වැඩම කලේ මෙම පොහෝ දිනයේදීමය. වෛර කිරීමේ ආදීනව පෙන්වා දෙමින් පිල් බෙදුන කණ්ඩායම් දෙකට දහම් දෙසා ඔවුන් සමගි කරවූයේද මෙම පොහෝ දිනයේදීය. මෙම දහම් දේශනාව පසුකාලීන සමාජ යහපතට ද හේතුවිය. ශාසනික වශයෙන් වැදගත් පොහොයක් ලෙසට පෙන්වාදිය හැකිය.

# සක්විති සැපතටත් වඩා උතුම් වූ "සෝවාන් ඵලය"



**පඨව්‍යා ඒකරජ්ජේන සග්ගස්ස ගමනේන වා සබ්බ ලෝකාධිපච්චේන සොතාපත්ති ඵලං වරං**

**සක්විති රජයට වඩා දෙව්ලෝ යාමට වඩා සියලු ලොව අධිපතිකමට වඩා සෝවාන් ඵලයම උතුම් වේ.**

මිනිස් සමාජය ගත්කළ ලොව ඇති උතුම්ම සැපත වන්නේ සක්විති රාජ සම්පත්තියයි. මුළු ලෝකයටම අධිපතිවීම සක්විති රාජ සම්පත්තියේ ස්වභාවයයි.

සුද්ධෝදන රජතුමාගේ අරමුණ වූයේද තම එකම පුතු වූ සිද්ධාර්ථ කුමාරයා සක්විති රජවෙනවා දැකීමයි. නමුදු සිද්ධාර්ථ කුමරු එම සැපත මුවින් හෙළ කෙළ පිඩක් සේ සිතා ඉවත් කොට බුදු බව පතා පැවිදි විම උදෙසා ගෙදරින් පිටත් වූ ආකාරය බුද්ධ චරිතය තුළ ඉතා ප්‍රකටය.

දීඝ නිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රය තුළින් සක්විති රාජ සම්පත්තියෙහි ස්වභාවය පැහැදිළි කොට ඇත. එහි සඳහන් පරිදි පෙර දැහැමින් රාජ්‍ය කරවන මුළු ලොවටම අධිපති සියළු සතුරන් දිනූ සත් රුවනින් යුත් දළ්හනෙමි නම් සක්විති රජෙක් පිළිබඳ කරුණු අනාවරණය වේ.

සක්විත් රජෙක් පිළිබඳ කරුණු අනාවරණය වේ. සක්විති රජවරුන්ට චක්‍ර රත්නය, හස්ති රත්නය, අශ්ව රත්නය, මණි රත්නය, ස්ත්‍රී රත්නය, ගෘහපති රත්නය හා පරිණායක රත්නය නම් වූ සප්ත රත්නයක් භුක්ති විඳීමට ලැබෙනු ඇත. එය සාමාන්‍ය සැප සම්පතක් නොව.

එම සූත්‍රයේ සඳහන් පරිදි එම සක්විති සැපත අංග සම්පූර්ණ කර ගැනීමට නම් දස සක්විතිවත් පිරීම අනිවාර්ය වේ. එසේ නොවන්නේ නම් සප්ත රත්නය අතුරුදහන් වනු ඇත. එම දස සක්විති වත් නම්,

01. දස කුසල ධර්මයෙහි පිහිටා එය ගරු කරමින් අඹු දරුවන්ද ශීලයෙහි යොදවා ඔවුන් රැකගැනීම.

02. බල සෙනඟද බලයෙහි පිහිටුවා සංග්‍රහ කොට රැකගැනීම.

03. ක්ෂත්‍රියයන්ද ශිලයෙහි පිහිටුවා රැකගැනීම.

04. බ්‍රාහ්මණ ගෘහපතියන් ද එසේම රැකගැනීම.

05. නියම්ගම් ජනපද වාසීන්ද ශිලයෙහි පිහිටුවා රැකගැනීම.

06. මහණ බමුණන්ද කළ යුතු සංග්‍රහ කොට රැකගැනීම.

07. සිවුපාවුන්ද පක්ෂින්ද රැකගැනීම.

08. ස්වකීය රටෙහි අධාර්මික ක්‍රියාවන් ඇති නොවන ලෙස කටයුතු කිරීම.

09. දුප්පතුන්ට දන්දීම.

10. ගුණවත් මහණ බමුණන් කරා පැමිණ කරුණු විමසා ඔවුන්ගේ අවවාද අනුව දහම්හි යෙදී වාසය කිරීම.

සියලුම රජවරුන්ට අධිපති වූ සක්විති රාජ සම්පත්තිය ලැබීම පහසු කාර්යයක් නොවේ. එයට බොහෝ පින් කොට තිබිය යුතුය. කඨින චීවර පූජාව පිළිබඳ විස්තර වන තැන්හි නාගිත හිමි පවසා සිටින්නේ,

" ආරපථෙ ආරපථෙ -
චක්කවත්ති සිරිංලභෙ
අසීතිංච චතුක්ඛත්තුං -
චක්කවත්ති අභොසහං"

එක ඉදිකටු පාරක් පාරක් පාසා සක්විති රජවන්නට හේතු සම්පත් තිබුණද සසර එපමණ බොහෝ කලක් නොසිටි හෙයින් 84 වාරයක් චක්‍රවර්ති රාජ්‍ය සම්පත් ලැබීමි. ඒ අනුව සලකා බැලීමේදී චක්‍රවර්ති රාජ්‍ය සම්පත්තිය සඳහා බලගතුම පිංකම් කරගත යුතුබව පැහැදිළි වේ.

එසේ වුවද බුදුහිමි දේශනා කොට ඇත්තේ එම කුමන යස ඉසුරින් පිරි සක්විති රාජ සම්පත්තියටත් වඩා සෝවාන් ඵලය උතුම් බවය. ඒ බව ධම්මපදයේ ලෝක වග්ගයට අයත් 12 වෙනි ගාථාව තුළින් පැහැදිළි වේ.

"පඨව්‍යා ඒකරජ්ජේන -
සග්ගස්ස ගමනේන වා
සබ්බ ලොකාධිපච්චේන -
සොතාපත්ති ඵලං වරං"

සක්විති රජයට වඩා දෙව්ලෝ යාමට වඩා සියලු ලොව අධිපතිකමට වඩා සෝවාන් ඵලයම උතුම් වේ.

එයට හේතුව මිනිස් දිවියේ උසස්ම සැපත වූ සක්විති රාජ සම්පත්තිය වුවද වෙනස් වීමය. එයින් නැවත දුක හටගැනීමය. නමුදු ආධ්‍යාත්මික ගුණ වගාවන් එසේ වෙනස් නොවනු ඇත. සෝවාන් වූ කෙනෙක් කිසි කලෙක අපාගත නොවනු ඇත. සුගතියක පමණක්ම ඉපදේ.

එසේ ඉපදුනත් වැඩිම ආත්ම හතක් පමණි. සෝවාන් පුද්ගලයින් වශයෙන් තිදෙනෙක් ඇතිබව පැහැදිළි වේ.
එනම්,

01. ඒකබීජ
(දෙවන භවයේදීම රහත් වන පුද්ගලයින්)

02. කොලං කොල
(2-7 අතර ආත්මයක දී රහත් වන පුද්ගලයා)
03.සත්ත ක්ඛත්තුපරම (සත්වන භවයේදී රහත් වන පුද්ගලයා)

සෝවාන් වීම යනු සසරින් එතෙර වීමේ පළමු පියවරයි. පඩිපෙළවල් 4ක් අවසානයේදී නිමාව නැත්නම් ඉලක්කය ඇත්නම් එහි පළමු පඩිය වන්නේ සෝවාන් මාර්ගයයි.

එතුළින් සෝවාන් ඵලය සිදුවේ. එය නිවන් මගේ පළමු පියවරයි. එය අසීරු කටයුත්තකි. නමුදු කෙසේ හෝ පළමු පියවර තැබිය හැකි නම් එහි අවසානය දක්වා ගමන් කිරීම අසීරු කර්තව්‍යයක් නොවේ.

සෝවාන්වීම පිළිබඳ කතා කිරීමේදී සෝතාපත්ති සිත යනුවෙන් නම් කළ හැකිය.

සෝත යනු දිය පහරයි. නිවන් නැමැති මහ සයුරට නැඹුරුව ගමන් කරන දිය පහරක් හෙයින් එයට බැස ගැනීමේ (සොත + ආපත්ති) අර්ථයෙන් එහි මුල්ම සිත ඒ නමින් හැඳින්වේ.

එම මගට බැස ගැනීමේදී බැහැර කෙරෙන කෙලෙස් මල කීපයක් ඇත. ඒවා දස සංයෝජන නමින් හැඳින්වේ. සංයෝජන නමින් හැඳින්වෙන්නේ සසර බැඳ තබන හෙයිනි.
01. සක්කාය දිට්ඨි
(ආත්ම දෘෂ්ටිය විනාශ නොවන (සත්) භවගාමී ආත්මයක් ඇත යන මිත්‍යා දෘෂ්ටියයි මගේ අපේ යනුවෙන් අල්ලා ගැනීම ද ඉන් ගම්‍යමාන වේ.)
02. විචිකිච්ඡා
(සැකය - එනම් බුද්ධාදී අට තැන සැකයයි. බුද්ධ, ධම්ම, සංඝ, ශික්ෂා, පූර්වාන්තය, අපරාන්තය, පූර්වාන්ත අපරාන්තය, පටිච්ච සමුප්පාදය යනාදී අට ගැන සැකයයි.)
3. සීලබ්බත පරාමාස
(සසරින් මිදීම උදෙසා අනවබෝධයෙන් අත්ථකිලමථානු යෝගය වැනි ඒ ඒ සිල් හා ව්‍රත අනුගමනය කිරීමෙන් ඇති කර ගන්නා චංචල ස්වභාවයයි)

සක්විති සැපතටත් වඩා සෝවාන් ඵලය උතුම් වන්නේ නිවන් මඟෙහි පළමු පියවර එය බැවිනි. සක්විති රජුත් මියගොස් අපාගත වීමට පුළුවන. එම සැපත විඳින කාලය තුළම නැවත නොයෙක් තාඩන පීඩන දුක් කරදර වලට පැමිණීමට පුළුවන. එම සැපත අහෝසි වීමට පුළුවන.

නමුදු සෝවාන් වූ උත්තමයා නැවත කිසිදු ආත්මයක නරක, තිරිසන්, ප්‍රේත අසුර යන සතර අපායෝත්පත්තියකට පත් නොවනු ඇත. අටවැනි ආත්මයක් ඔහුට උරුම නැත. සක්විති සැපත හෝ වෙනත් කුමන සැපතක් ලබන කෙනෙකු වුවද සසර තව බොහෝ කල් ගමන් කිරීමේ ප්‍රවණතාවය සුලබය.

බුදුන් දවස සත් හැවිරිදි වයසේදීම විශාකා සිටු දියණිය සෝවාන් වීම, ඊට අමතරව ඒ ඒ අවස්ථාවල දී සෝවාන් වූ අය ලෙස සේ ඡත්ත මානවක ඇතුළු පිරිස ගැරඬියෙකු පෙලූ ළමුන් පිරිස, සැවැත් නුවර වෘද්ධ බමුණා ප්‍රමුඛ දරුවන් පිරිස, රජ්ජුමාලා, අනේපිඬු සිටුගේ පුත් කාලසිටු, මිගාර සිටුතුමා ආදීන් දැක්වීමට පුළුවන. ප්‍රඥාව මුහුකුරා යැමත්, පෙර පිං බලයක් ආදි හේතූන් මත නිවන් මඟෙහි පළමු පියවරට ඔවුන් පත්වූහ. අද ලෝකය තුළ සෝවාන් වීම ඉතා දුෂ්කර කාර්යයක් වී ඇත්තේ ඇලීම්, බැඳීම්, ගැටීම්, අන්ත ලෙස පවත්වා ගෙන යෑම හේතුවෙනි. කාම ලෝකයේ අන්ධ වී සිටින සත්වයාට සසර දුක නොතේරේ.

ලෝකය හා සත්වයා දෙස ප්‍රඥාවෙන් දැක දැක බෞද්ධ ප්‍රතිපදා ඔස්සේ ගමන් කොට සෝවාන්වීම කළ යුතුව ඇත. ඒ සඳහා බුදුන් දෙසූ උතුම් දහම් මග පහුරක් කරගත යුතුව ඇත. සදා නොවෙනස් උතුම්ම සැපත වූ නිවන් මඟට යන ගමනේ එහි පළමු පියවර වූ සෝවාන් මාර්ගය ප්‍රගුණ කොට එහි ඵලයට පැමිණීමට සියල්ලෝම උත්සාහවත් වෙත්වා...!

කොබෙයිගනේ පුබ්බිලිය
ශ්‍රී සාරානන්ද පිරිවෙනෙහි
ආචාර්ය,
පූජ්‍ය ගලගෙදර රතනවංශ හිමි



# සියල්ල ඔබ අතහැර යයි සිතන්න, එය ලෝ දම වෙයි.

ඔබේ ජීවිතයේ සැහෙන කාලයක් දැනටමත් අවසන් කර ඇත. ඔබේ දෙනෙතට සිත්කලු නයනානන්දනීය දර්ශන කොතෙකුත් හමුවී ඇත.

සමහර විට දේශදේශාන්තරයන්හි මහා ධනස්කන්ධයක් වැය කර සංචාරය කරනුයේ මනඃකාන්ත දර්ශන සොයාගෙනය. ඒ සියලු දර්ශන නෙත ගැටෙන මොහොතකට පමණි. ඊට වඩා යමක් එහි නොවේ. හුදෙක් දැන් මතකයක් පමණි.

හැඟුම් දනවන මිහිරි හඬින් කණ පිනවන තැන් හොයාගෙන කොතරම් නම් ඔබ වෙහෙසෙන්න ඇද්ද? සංගීත සංධ්‍යාවන්ට ප්‍රිය සම්භාෂණ වලට සියගණනින් සහභාගී වන්න ඇති. ගුවන් විදුලි විද්‍යුත් මාධ්‍ය මඟින් නිකුත් වූ මනහර හඬට ඔබ වශීකෘත වෙලා අමන්දානන්දයට පත්වෙලා කොතෙකුත් ඉන්න ඇති. ඒ මිහිර ඒ වෙලාවට පමණි. ඊට එහා ගිය යමක් තවත් ඉතිරි වී ඇද්ද? බොඳවී යන මතක සටහනක් පමණි.

දිව පිනවන ප්‍රණීත ආහාර කෙතෙක් නම් අනුභව කර ඇද්ද? රසමසවුලෙන් යුත් දිව බොජුන් බදු අහර දිව ගා රස බලා ඇත. තළු මරා ඇත. ඒ ප්‍රණීත බව මිහිර දිවට සම්බන්ධ වෙලා තිබෙන සුළු මොහොතට පමණි. කෝ දැන් ඒ රසය. මිහිර. ඒ මොහොතකට පමණක් සීමාවූ මතකයක් ඇත් වූ යටගියාවක් පමණි. ඊට වඩා යමක් එහි ඇද්ද?

මෙසේ සියලුම ආයතන හෙවත් ඇස, කණ, නාසය, දිව, කය, මන ඉන්ද්‍රිය සම්බන්ධව මිහිර සතුට වින්දනය හොයා ගතකල ජීවිත කාලයම සිහිනයක් පමණි. ඒ ඒ අවස්ථාවලදී ලබාගත් මිහිර, සතුට, සැපත, වින්දනය, සදාකාලිකව පවත්වාගෙන යාමට කිසියම් හෝ ක්‍රමවේදයක් ලෝකය තුළ නැත. ඒ සියල්ල ස්වභාව ධර්මයට අයත්ය. අප අපේ යයි පරිහරණය කරන භෞතික වූ ගේ දොර, ඉඩ කඩම්, මිල මුදල්, හරක බාන, යාන වාහන, ඇඳුම් පැලඳුම්, කෑම් බීම් ආදී සියලු දෑ ස්වභාව ධර්මයට මිසක් ඔබට, මට අයිති නැත.

"ඔබට අයත්ය - මට අයිතිය" යනු හැඟීම් මාත්‍රයක් පමණි. දැනටමත් ඒවා අප අතහැර ගොස්ය. ඒ හැර ගිය අයිතිය ආයේ කවදාවත් නැවත නොඑනු ඇත. ඔබට අයිති නැත්නම් ඔබගේ කැමැත්ත පරිදි පරිහරණය කරන්න බැරිනම් නැවත පැමිණීමක් කිසිසේත් බලාපොරොත්තු විය නොහැකිනම් සන්තකයේ තබාගන්න බැරිනම් ගතින් සිතින් සියලුම ලෝක ධර්මයක් අත්හරින්න.

ඔබට අයිතියි කියා ඔබ බලහත්කාරයෙන් මෙතෙක් කල් ලංකරගෙන සිටීමක් ඔබට ගැලපෙන්නේ නැති නොහොබිනා ක්‍රියාවකි.

ඒ මංකොල්ලකෑමකි. "මම" කියා කෙනෙක් පනවාගෙන අයිති නැති දෙයක් බලහත්කාරයෙන් ඇඩිව ගැනීම හෙවත් "කොල්ල" කෑමකි. "මම" පනවා ගන්නා තාක්කල් ඔබ "දුක" උරුමකර ගනී.

ජීවිතය ගඟක් හා සාමානය. ගඟ පහලට ගලා බසී. ගඟේ ස්වභාවය නොදන්නා කෙනෙක් ගඟ ඉහලට හැරවීමට උත්සාහ කරයි. නමුත් ස්වභාවයෙන්ම පහලට ගලා යන ගඟ කවදාවත් ඉහලට හෙවත් උඩුගම් බලා හැරවීමට ඔහුට නොහැකිය.

ඒ නිසා නොසතුටට පත්වී කලකිරෙයි. වරද ගඟේ නොවේ. ස්වභාව ධර්මයේ වරදක්ද නොවේ. ඔහුගෙයි වරදයි. වැරදි සිතුවිල්ලක් සංකල්පයක් නිසා නොමඟ ගිය ඔහුට සැනසිල්ලක් නැත. ඒ නිසාම පසුතැවෙයි. ස්වභාවයෙන්ම උපතින්ම දඟර ගැසී වකුටුවී ඇති "බලු නගුට" උණ පුරුකේ දමා කෙලින් කිරීමට ගන්නා උත්සාහය හා සමානයි.

තුන්ලෝක ධාතුවේ සියලුම සත්වයන්ට මේ ස්වභාව ධර්මයේ යථාර්ථය තමයි ශාන්ති නායක බුදු පියාණන් වහන්සේ වදාළේ. ස්වභාව ධර්මයේ යථාර්ථය හරිහැටි නිවැරදිව තේරුම් ගතහොත් ලෝක ධර්මයන් නිසා ලැබෙන දුක නැතිකර ගත හැකිවා මෙන්ම ලෝකයෙන් එතෙරවීමේ හැකියාවද ඇතිකර ගතහැක

ඔබේ ශරීරය දිහා විමසිල්ලෙන් බලන්න. ඔබේ තරුණ සිරුර කෙමෙන් කෙමෙන් ජරාවට යනවා. ජරාවට යාම ස්වභාව ධර්මයේ ස්වභාවයයි. එහි කිසිම වැරැද්දක් නැත. ජරාවට පත්වීම ගැන ඔබ කනස්සල්ලට පත්වන්නේ ස්වභාව ධර්මය ගැන හරිහැටි දැනුවත් වී නොමැති නිසාය.

ජීවිතය ගඟක් හා සාමානය. ගඟ පහලට ගලා බසී. ගඟේ ස්වභාවය නොදන්නා කෙනෙක් ගඟ ඉහලට හැරවීමට උත්සාහ කරයි. නමුත් ස්වභාවයෙන්ම පහලට ගලා යන ගඟ කවදාවත් ඉහලට හෙවත් උඩුගම් බලා හැරවීමට ඔහුට නොහැකිය.

හරි හැටි දැනගත්තොත් කිසිසේත් පසුතැවිලි නොවනු ඇත. ජරාවට පත් නොවුයේ නම් ඔබ පුදුම වියයුතුය. කුමක් නිසාද? තවම ජරාවට දිරීමට පත් නොවීම ගැන.

පාදාන්තයේ සිට කේෂාන්තය දක්වා මෙනෙහි කරන්න. හිස මුදුනේ ඇති කෙස් ඔබගේද? නැත. කෙස් දන්නේ නැහැ තමන් හිසක් මුදුනේ ඉන්නවා කියලා. හිස දන්නේ නැහැ තම හිස මත කෙස් ඉන්නවා කියලා. කෙස් නැමැති රූපය ස්වභාව ධර්මයට අයිති දෙයක්.

එය ඔබ අතහැර දමා යනවා. කෙස් දුර්වර්ණවීම, සුදුවීම, තඹ පැහැගැන්වීම, කැඩී බිඳීයාම ඉදිරීයාම ස්වභාවයයි. ඒ එයාගේ හැටි. එයට තහංචි දාන්න ඔබට මට බැහැ. එය එතැනට අයිති නැත. එයාගේ නියම තැන එතැන නොවේ. ඒ නිසා එතැන අතහැර දමා යනවා. ඔබට අවනත නැත. අවනත නැත්නම් ඔබ වසඟයේ පවතින්නේ නැත්නම් ඔබගේ කැමැත්ත පරිදි ඉන්නේ නැත්නම් යන්න දෙන්න. ශෝක නොකරන්න. මායිම් නොකරන්න. තාවකාලිකව අටවාගත්තා පමණි. මේ ගැන නොදන්න කමට මෝඩකමට අඬනවා, දොඩනවා, පසුතැවිලි වෙනවා. යථාර්තයට මුහුණ දෙන්න. ස්වභාව ධර්මයට අනුගත වන්න.

සදාකාලිකව වැජඹෙන්න කය ස්ථිරසාර තැනක් නොවේ. එයා ඇවිත් තියෙන්නේ තාවකාලිකවයි. ඔයා එයාට එන්න කිව්වේත් නැහැ. එන්න එපා. කිව්වට අවනත වන්නේත් නැහැ. මේ නිසා ඇඬීම දෙඩීම මොනතරම් මෝඩ ක්‍රියාවක්ද? සියලුම ඉන්ද්‍රියන්ගේ ආයුකාලය ඉවර උනාම ඔබ හැර පලායනවා.

ඒ අය තාවකාලිකව අටවාගෙන සිටි අය නිසයි එහෙම යන්නේ. ඔබ මෝඩ උනාට මෙනවා කරන්නද? මෙසේ දත කට නාසය දිව කෙස් ලොම් නියපොතු හම ඇතුලු සියලුම අවයව ඒවාට මෙහි නිවහන නොවන නිසා වෙලාව ආවාම කෙමෙන් කෙමෙන් ඔබ අඬ අඬා සිටියදී යන්න යනවා. ඔබට ස්වභාව ධර්මයේ පාඩම උගන්වමින්.

ඔබේ යයි කියාගෙන උදේ සවස මැද පිරිසිදුව තබාගන්න. දත් වඩා ශක්තිමත් කරන්න මොනතරම් නම් පෝෂදායී ආහාර විටමින්, කැල්සියම් ගන්න ඇද්ද? ඔබේ රැකවරණයෙන් ඔබේ උදව්වෙන් පිහිටෙන් ආරක්ෂාවෙන් සිටිය දත් ඔබට මොනතරම් දුක්දී ඇද්ද? දවස් ගණන් නිදිමරාගෙන දත් කැක්කුම නිසා අඬ අඬා කෙදිරි ගගා ඉන්න ඇද්ද? දන්ත ආරෝග්‍ය ශාලාවල මොනතරම් කාලයක් පෝලිම්වල සිටගෙන බෙහෙත් ගන්න ඇද්ද? දත් දොස්තර මහත්ම මහත්මීන්ට මොනතරම් මුදල් ප්‍රමාණයක් වියදම් කරන්න ඇද්ද? ඒ මදිවට කුණුවෙලා, දිරලා, නරක් වෙලා අවසානයේ දී ගලවා දානවා.

මගේ මගේ යයි ආරක්ෂා කරගත් දත් දුන් දුක ඔබේ මිත්‍රයෙක්වත් ඥාතියෙක්වත් දරුවෙක්වත් හතුරෙක්වත් දෙන්න නැතුව ඇති. එසේම කණේ ලෙඩ, කටේ ලෙඩ, නාසයේ ලෙඩ, ඇසේ ලෙඩ, බඩේ ලෙඩ, හදවතේ ලෙඩ මුළු ජීවිත කාලයම ශරීරයේ එක එක ඉන්ද්‍රිය නිසා මහ දුක් ගොඩක් විඳවා ඇත. ඉදිරියේදී එය තව තවත් වැඩිවෙනවා හැර අඩුවීමක් බලාපොරොත්තු විය නොහැක.

තාවකාලිකව අටවාගත් කය ඔබ ඔබේ කරගන්න වෙර දරනවා. ඔබේ දෙනෙත් දැන් පේන්නෙ නැහැ. ඒ පෙනීම ඔබහැර පලාගොස්. දත් නැහැ. හපන්න බැහැ. දත් ඔබ හැර පලාගොස්. කණ ඇහෙන්නේ නැහැ. ඇසීමේ ශක්තිය ඔබ අතහැර ගොස්. දිවට රස දැනෙන්නේ නැහැ. රස දැනීමේ ශක්තිය ඔබ හැර පලාගොස්. ඔබ රෝගියෙක්. නීරෝගී බව ඔබ හැර පලාගොස්.

ආයේ කවදාවත් ඒවී කියා බලාපොරොත්තු වෙන්න එපා. නොලැබෙන දේකට ශෝක කිරීම මහ මෝඩකමක්. ඒ මදිවට තවත් මෝඩකමට උපත ප්‍රාර්ථනා කරනවා. භවය පතනවා. දුකට ලැබෙවායි පතනවා.

පූජ්‍ය ගම්පහ සිරි සීවලී හිමි

"අසසකො ලොකො සබ්බං පහාය ගමනීයං"
මගේ යයි ලංකරගත් සියල්ල අතහැර දමා යායුතුය.

උපනීයති ලොකෝ අද්ධුවෝ
නිරන්තරයෙන් ජරාමරණාදී කරා කැඳවයි. කිසිඳු දෙයක ස්ථිර බවක් නැත.

අත්තානො ලොකෝ
අනභිස්සරෝ
රෝග පීඩාදී දුක් වලින් බේරා ගැනීමට ආරක්‍ෂා කිරීමට පිහිටක් නැත.
අසරණයි."

15 පිටුවෙන්



# නුවණින් යුතුව යහපත් මිතුරන් හඳුනා ගනිමු

**සමාජය යනු ගතික වුවකි. පුද්ගල එකතුවකින් ගොඩ නැගුන මෙම විෂම සමාජය තුළ විවිධ පුද්ගලයන් ජීවත්වෙනු ඇත. එමෙන්ම විවිධ සමාජ සම්බන්ධතා ගොඩ නැගෙනු ඇත. මේ සමාජය තුළ අප විසින් ගොඩනගා ගන්නා ලද විවිධ සබඳතා අනුව අප පිරිහීමට ලක්විය හැකියි.**

එබඳු සමාජ සම්බන්ධතා අතර මිතුරු සබදතාවය යනු සමාජයේ ජීවත්වන සෑම පුද්ගලයකුම ගොඩනගා ගන්නා සබදතාවකි. කුඩා කළ දෙමාපිය සේවණේ සැදී වැඩෙන පුද්ගලයා අධ්‍යාපනය සඳහා ගමන් කරන ඇරඹුම ඔහු සමාජගත වීමේ ඇරඹුම වේ. එතැන් පටන් ගොඩ නඟා ගන්නා මිත්‍ර සම්බන්ධතා මියදෙන තුරාවටම විවිධ ගම්, විවිධ ප්‍රදේශ, විවිධ රටවල් යනාදියෙහි ජීවත් වන පුද්ගලයන් සමඟ ගොඩනඟා ගනු ලබයි.

එමෙන්ම මෙම මිත්‍රත්වයට ස්ත්‍රී පුරුෂ භේදයක්ද ඇත්තේ නැත. මෙලෙස ගොඩ නඟාගන්නා සම්බන්ධතා තමාගේ යහපත උදෙසා ගොඩනගා ගැනීම වැදගත් වනු ඇත. අප ඇසුරු කරන අයගේ ස්වභාවය අපේ ජීවිතයට තදින්ම බලපානු ලබනවා. ගිහි ජීවිතයේ දී පමණක් නොව පැවිදි ජීවිතයටද මෙය බලපෑම් කරනවා. ගුණධර්ම දියුණු කරන්න අශ්‍රය සියයට සියයක්ම බලපානු ලබනවා. නිසි මිතුරු ඇසුරක් නැති පුද්ගලයා අධාර්මිකව පරිහානියට පත්වන අයුරු බුදුරාජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රය තුළින් දේශනා කරනවා.

උන්වහන්සේ පෙන්වා දෙන ආකාරයට ඇතැම් යහළුවන් සිටිනවා මත්පැනට යහළු වූ අය ඔවුන් පානසඛා යනුවෙන් හඳුන්වනු ලබනවා. තවත් සමහරෙක් මුනිච්ඡාවට යහළු වෙනවා. මුනිච්ඡාවට කියන්නේ මුණ ගැහුණාම පණ දෙන්න කතා කරන පිරිසටයි. ඊට පස්සේ ඒ යහළුකම ඉවරයි. ඔවුන් සම්මියසම්මියෝ යනුවෙන් හඳුන්වනු ලබනවා. බුද්ධ දේශනාවේ සඳහන් වන්නේ අධර්මයට පත්, උතුම් දේවල් සේවනය නොකරන පුද්ගලයාගේ ජීවිතය කරුවල වේගෙන එන සඳක් වගේ පිරිහීලා යනවා යන්නයි.

ඒ අනුව අප ආශ්‍රය කළ යුතු නොකළ යුතු මිත්‍රයන් අට දෙනෙකු පිළිබඳව බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා. උන්වහන්සේ මුලින්ම පෙන්වා දෙන්නේ මිතුරු වෙසින් ළඟ දැවටෙන අමිත්‍රයෝ සිව් දෙනෙකු පිළිබඳවයි. මෙම අමිත්‍රයන් මිත්‍රයෙකුගේ වේශයෙන් සිට සිදු කරනු ලබන්නේම හතුරුකම් මොවුන් මිත්‍ර ප්‍රතිරූපකයන් ලෙසද හඳුන්වනු ලබනවා. ඔවුන් සිව්දෙනා නමින් අඤ්ඤදත්ථුහර, වචීපරම, අනුප්පියභානි, අපායසහය යන්නයි.

අඤ්ඤදත්ථුහර මිත්‍ර ප්‍රතිරූපකයාගේ ස්වභාවය වනුයේ මොහු පැමිණෙන්නේම යහළුවාගෙන් මොනවාහරි අරගෙන යන්නයි. තමා පුංචි දෙයක් රැගෙන ගොස් යහළුවාගෙන් ලොකු දෙයක් රැගෙන යාමට මොහු කටයුතු කරනු ලබනවා. නමුත් ඔහුව සොයන්නට බැහැ ඊට හේතුව ඔහු සිටිනුයේ මිත්‍රකමෙන් වීමයි. එමෙන්ම එයා තමාට බියක් උවදුරක් ඇති වූ වෙලාවට තමන්ගේ යහළුවා වෙත ගොස් උදව් ලබා ගන්නවා. නිතරම තමාගේ වැඩකර ගන්නවා. තමන්ට ප්‍රයෝජනයක් ගන්න විතරයි යාළුවාව අශ්‍රය කරනු ලබන්නේ. එවැනි ලක්ෂණ වලින් යුතු මිත්‍රයෙකුගේ වෙශයෙන් සිටින අමිත්‍රයා අඤ්ඤදත්ථුහරයි.

දෙවැනි කෙනා වචීපරමයි. මොහු වචනයෙන් පමණක් හරි හිතවත්. ඒ නිසා වචීපරම මිත්‍රයාගේ ලක්ෂණ පෙන්වා දෙන්නේ වචනයෙන්. මොහු කතා කරන්නේ පණ දෙන්න මෙනි.

"අනේ මට අසවල් දේ තිබුණානම්, මට ඔයාව කලින් හම්බවුනා නම්, මං මේ ඔක්කෝම දෙන්නේ ඔයාටනේ. මට ඔයාට මේ දෙවල් වලට ලේසියෙන් උදව් කරන්න තිබුනා. "

යනුවෙන් පවසමින් මේ විදියට අතීතය ඉස්මතු කරලා කතා කරනු ලබනවා. " මං ඉන්නේ රට යන්න මං ගිය ගමන් වෙන කිසිම දෙයක් කරන්නේ නැහැ ඔයාව ගෙන්න ගන්නවා. ඕනෑම උදව්වක් කරන්නම් මේ ඔක්කෝම කියන්නේ අනාගතය ගැන දක්වමින්. " දැන්කරන කිසිම දෙයක් නැහැ.

ඒ කියන්නේ මොහු අතීත වචනවලින් අනාගත වචනවලින් සංග්‍රහ කරනු ලබනවා. ඉතිං අසරණ වූ පුද්ගලයා හිතන්නේ මම අසරණ වූ වෙලාවේ මෙයා ඉන්නේ හරි කැක්කුමකින්. අනේ මෙයාට දැන් තිබුණා නම් දෙනවා. එත් එයාට දැන් නැනේ. ඒ නිසා අනාගතයේ දී දෙයි කියලා රැවටෙනවා. ඒ අනුව මොහු නිරත්තකේන සංගණ්හාති යන අර්ථයෙන් හඳුන්වනු ලබනවා. එනම් අර්ථයක් නැති කතා වලින් සංග්‍රහ කරනවා යන්නයි.

"මං අනෙක් අයට මේ විදිහට සලකලා තියෙනවා. මම පුළුවන් කාලයේ සැලකුවේ මෙන්න මෙහෙමයි. අසවලා අසවල් තැන ඉන්නේ මම නිසයි. "

ඉතිං මුලාවට පත්වන මිතුරා හිතන්නේ මොහු නම් හරිම ප්‍රයෝජනවත් කෙනෙක්. මෙයා තමා හැමෝටම උදව් කරන්නේ හැමෝගේම ජිවිත වලට අලෝකයක් උදාකර ඇත්තේ මොහුයි යනුවෙන් තමන් මුලා වෙනවා.

මෙම මිත්‍රයා අතීතයේදී අනාගතයේදී මෙසේ වචනයෙන් සංග්‍රහ කරන්නා සේ වර්තමානයේ දී ත් මොහු ලස්සනට පිළිතුරු දෙනවා. එනම් මොහු වර්තමාන කාලයේ තමන්ගේ ව්‍යසන දක්වනු ලබනවා. " අනේ මේ වෙලාවේ මට උදව් කරන්න විදිහක් නැහැ. මමත් මේ වෙලාවේ ඉන්නේ විශාල කරදරයක වැටිලා. ඒ වගේම ණය ගෙවන්න වෙලා." යනුවෙන් උදව්වක් ඉල්ලන්න බැරි විදිහට විස්තර කරනවා. වචීපරම මිත්‍රයාගේ ස්වභාවය වන්නේ එයයි.

ඊළඟ මිත්‍ර ප්‍රතිරූපකයා වනුයේ අනුප්පියභානි ඔහුගේ ස්වභාවය වන්නේ යහළුවා කතා කරන හැම දෙකටම අනුකූලතාවය දැක්වීමයි. මිතුරා යම්කිසි පාප ක්‍රියාවක නිරත වෙලා සිටිනවා. නැතිනම් කුමක් හෝ වරදකට, එසේ කරමින් යහළුවාට ඒ පිළිබඳ ප්‍රකාශ කරනවා. එවිට එය අනුමත කර බොහෝ හොඳ ක්‍රියාවක් යැයි ඔහුට අනුබල දෙනවා. එතකොට පෙනෙන්නේ හිතෛශී බවක්. ඔහුට අවශ්‍යත් එයයි.

ඒ නිසා අනුප්පියභානි මිතුරා එය සම්පූර්ණයෙන්ම අනුමත කරනවා. මොකද තමන් කරන වැරදි දේ යාළුවා අනුමත කරනකොට මිතුරා ඔහුට ප්‍රිය වෙනවා. අයහපත් දේට විතරක් නෙමේ මේ කෙනා යහපත් දේටත් උදව් කරනවා. ඒ නිසා තෝරා බේරා ගන්න අමාරුයි.

දානයක් දෙන්න සූදානම් වුණොත් ආ බොහෝම අගෙයි මගේ ගානෙත් දානයට අවශ්‍යය දෙවල් ලබා දෙන්නම්. යනුවෙන් පවසමින් යහපත් දෙත් අනුමත කරනවා. එතකොට හැම තිස්සේම පෙන්නේ උදව් දෙනවා වගේ. ඒ නිසා මෙම මිත්‍ර ප්‍රතිරූපකයාද හඳුනාගැනීම අසීරු වෙනවා.

යහළුවා යම් පාප ක්‍රියාවකට සූදානම් වුනොත් මොහු ඒ පාපයටත් උදව් කරනවා. ඒ වගේම පිනටත් උදව් කරනවා. ඒ වගේම මොහු යහළුවා ඉදිරියේ මුහුණට ගුණ කියනවා. එසේ ගුණ කීවත් යනකම් ඉදලා අගුණ පවසනවා

"ඔය පින් කළාට මෙන්න මෙහෙමයි පවුත් කළේ. "

යනුවෙන් පවසමින් අගුණ කියනවා. ඒ වගේම මිතුරා කළ පින්වැඩ වලට ලකුණු දාගන්නෙත් තමන්මයි.

" එයා ඉස්සර කළේ වැරදිමයි. මමයි ඔය විදිහට පින් දහම් කරන්න මඟ කියලා දුන්නේ. " යනුවෙන් තමන්ටම ලකුණු දා ගැනීම මෙම මිත්‍ර ප්‍රතිරූපකයාගේ ස්වභාවයයි.

ඊළඟ මිත්‍ර ප්‍රතිරූපකයා හරිම පැහැදිලි. එනම් අපායට පාර කපන අපාය සහයකයි. ඔවුන් යාහළුවෙක් වගේම ඉන්නවා. නමුත් යහළුවෙක් නොවේ. මේ මිත්‍ර ප්‍රතිරූපකයා හරිම භයානකයි.

ඔහු හොඳට බොන්න උදව් කරනවා. මත්ද්‍රව්‍ය පාවිච්චියට උදව් කරනවා. මත්ද්‍රව්‍ය ඔහු ගානේමයි ගෙනත් ලැස්ති කරලා දෙන්නේත්. ඒ වගේම විනෝද ගමන් යන්න ආරාධනා කරනවා. එහිදි බීමට සුදුසු පරිසරයකටයි මොහු රැගෙන යන්නේ. "මෙන්න නුඹලට මං ගානේ. "යනුවෙන් පවසා මත්ද්‍රව්‍ය ලබා දෙනවා. ඉතිං අනුවණයා රැවටෙනවා. මෙයයි සැබෑ මිතුරුකම කියලා රැවටෙනවා.

වර්තමාන සමාජයේ මෙවැනි සිදුවීම් බහුලව දක්නට ලැබෙනවා. ඒ වගේම වැරදි ගමන් බිමන් අවේලාවේ ගමන් බිමන් යන්න කතා කරනවා. සංගීත සංදර්ශන වලට එක එක විනෝද වැඩවලට යමු කියලා බලෙන්ම එක්කගෙන යනවා. "යාළුකමටනේ කියලා තමනුත් රැවටෙනවා. එදා අවේ නෑ. අද එන්නම ඕන. " යනුවෙන් පවසා කෙසේ හෝ එක්කගෙන යනවා.

ඉතිං යාලුවානේ කියලා හිතලා ගිහිල්ලා තමන් විනාශ වෙනවා. මේ විදියට මොහු එක්කගෙන යන්නේ ම වැරදි වැඩකට මොහු කෙලින්ම සහය වන්නේ අපාගත වීමටයි. මෙකී ස්වභාවයන්ගේ යුක්ත නිසා මොහු හඳුන්වන්නේ අපාය සහායක මිත්‍ර ප්‍රතිරූපකයා ලෙසයි.

ඒ.පී හර්ෂණී ප්‍රභා කුමාරි
කැලණිය විශ්වවිද්‍යාලය
ජන සන්නිවේදන අධ්‍යයන අංශය

ගුණමකුබව දුදන ගතියකි.

# ගමේ පන්සල අපේකමේ කැඩපතයි.

වළගම්බා රජු මුල්වර රජකම අහිමිව පලා යන අවස්ථාවේ 'මහා කලු සිංහලයා පැනයයි' කියමින් රජතුමාට සරදම් කළ ගිරි නම් නිඝණ්ඨයා විසූ අසපුව කඩා බිඳ දමා එහි බෞද්ධ ආරාමයක් ඉදිකොට අභයගිරිය ලෙස නම් කිරීමට වළගම්බා රජතුමා කටයුතු කළේ දෙවනවර බලයට පැමිණීමෙන් පසුවය. මෙහිදී රජතුමාට වනගතව සිට යුද්ධය මෙහෙය වීමට උපකාර කළ මහා තිස්ස හිමියන්ට කළගුණ සැළකීමක් වශයෙන් එම ආරාමය පෞද්ගලිකව පූජා කිරීමට කටයුතු කළ අතර තිස්ස හිමියෝ ද එය පෞද්ගලිකව පිළිගෙන පරිශීලනය කළහ. මෙයට මහා විහාරික භික්ෂූහු එරෙහි වූහ.

භික්ෂූ සංස්ථාවේ වර්ධනයත් සමඟ ගම් නියම් ගම්වල ඉදිවූ සංඝාවාස මුල් කාලයේ නිර්මාණය කරගනු ලැබුවේ කොළ අතු සෙවිලි කිරීමෙනි. මේ නිසා මෙම ගොඩනැගිලි 'පර්ණශාලා' ලෙස හඳුන්වන්නට වූ අතර එය කාලයාගේ ඇවෑමෙන් 'පන්සල' ලෙස සුබෝච්චාරණයට පැමිණ ඇත. මහින්දාගමනයෙන් පසුව ශ්‍රී ලාංකීය ජනතාව ප්‍රධාන කොටස් හතරක් වශයෙන් වර්ග වූහ. එනම්,

1. භික්ෂු 2. භික්ෂුණී
3. උපාසක 4. උපාසිකා

යනුවෙනි. පෙර කී ආකාරයට මහා විහාරය කේන්ද්‍රකර ගනිමින් දිවයිනේ විවිධ ප්‍රදේශවල ආරාම බිහිවූ අතර ඒවා පන්සල් ලෙස හඳුන්වන්නට විය. පන්සල ඇසුරු කරගෙන ගම විකාශනය විය. ගැමි ජනතාවගේ සෑම අවශ්‍යතාවයකටම පන්සල සම්බන්ධ විය. අදෘශ්‍යමාන බලවේගයක් මත එල්බ සිටි ශ්‍රී ලාංකික ජනතාව ඒ වෙනුවට රත්නත්‍රයේ ආශිර්වාදය ලබා ගත්හ.
ඔවුහු පන්සලේ ඇසුර ලබමින් තෙරුවන් සරණ ගිය බෞද්ධයින් බවට පත් වූහ. පංච ශීලය නිත්‍ය ශීලය ලෙස දිවි දෙවැනි කොට රැකගැනීමට උත්සුක වූහ.

"වැවයි දා ගැබයි
ගමයි පන්සලයි
නිල් ගොයමයි - කහ
සිවුරයි

සිංහල ජන සමාජයේ මූලික සංකල්ප බවට පත් විය. ගමේ පන්සල සහ ගැමියන් අතර අවියෝජනීය සබැඳියාවක් ඇති විය.

පන්සල ඉදිකර ගැනීමේ දී භික්ෂූන් වහන්සේලාගේ මූලිකත්වයෙන් ගමේ ජනතාවගේ සාමූහිකත්වයෙන් එය සිදු විය. පොදු ශ්‍රමදාන ක්‍රමයක් දක්නට ලැබුණි. අගල් කැපීම, පදනම දැමීම, ගල් කැඩීම, ගඩොල් කැපීම ආදිය ගැමියන් විසින් සිය ශ්‍රම දායකත්වයෙන් කරගත් අතර මේ සඳහා කිසිදු මුදලක් අය නොකරන ලදී. ගමේ පොහොසතාගේ සිට අන්ත දුප්පතා දක්වා සියලු දෙනා ඉතා ශ්‍රද්ධාවෙන් ගෞරවයෙන් මේ සඳහා දායක වූහ. විශාල වශයෙන් මුදල් වැයවන කාර්යයන් සඳහා ගමේ මිටි හාල්, පිං හාල් ආදිය එකතුකොට ඒවා විකුණා මුදල් ලබා ගන්නට විය. ඇතැම්හු කුඩා කණ්ඩායම් ලෙස එක් වී දුරබැහැර ගම් නියම්ගම් කරා ගොස් වී, හාල්, මුදල් ආදිය එක්රැස් කළහ. මෙම ක්‍රියාදාමය 'සම්මාදමේ යාම' ලෙස අතීතයේ සිට ආරම්භ වී වර්තමානයේ දී ඉතා සුළුවෙන් නමුත් දක්නට ලැබේ.

මෙසේ ඉදිවූ ගමේ පන්සල ආගමික මධ්‍යස්ථාන -යක් වුවත් එය වඩා අලංකාරවත් ලෙස චිත්තාකර්ෂණීයව නිර්මාණය කිරීමට බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පියා උත්සුක වූහ. ගැමියන්ගේ වන්දනා මාන කටයුතුවලට අවශ්‍ය

1. ශාරීරික
2. පාරිභෝගික
3. උද්දේසික යන

ත්‍රිවිද චෛත්‍ය අංගයන්ගෙන් පන්සල අංගසම්පූර්ණ විය.



එපමණක් නොව පටිමා, පටිමාඝර, බෝධිය, බෝධිඝර, චෛතියඝර, මහ සෑ මළු, සලපතල මළු, මුරගල්, කොරවක්ගල්, පියගැට පෙළ, සඳකඩ පහණ, ආදී අනේකවිධ වූ කලාකෘතීන් ගෙන් විහාරස්ථානය අලංකාරවත් විය.

සාම්ප්‍රදායික ගමෙහි සාමය නිර්මාණය කිරීමේ කේන්ද්‍ර ස්ථානය ලෙස ද පන්සල ක්‍රියාත්මක විය. එහි අවසානය වශයෙන් තීරණ ගනු ලැබුවේ නායක හිමිපාණන් විසිනි. පන්සලේ ඉඩම් හා කුඹුරු සීමාවන් තුළ පක්ෂියෙකු හෝ දඬුවම් කිරීම තහනම් විය. ගමේ සොරුන් හා වෙනත් අපරාධ කරන්නන් පිළිබඳ නඩු විසඳන ලද්දේ විහාරාධිපති හිමියන් විසිනි.

මොවුන් රජ වාසලට, පසු කාලයේ දී පොලිසියට ගෙන යාමට පෙර පන්සල වෙත රැගෙන යන්නට විය. බොහෝ විට මෙවැනි නඩු, ගමෙහි ආරවුල් පන්සල තුළදී ම නිරාකරණය කරගැනීමට හැකිවිය. ගමෙහි සදාචාරය එක්තැන් කළ ස්ථානය පන්සල විය.

වර්තමානයේ දී මෙන් විවිධ රෝගාබාධ සඳහා ඖෂධ ලබා ගැනීම සඳහා අතීතයේ දී රෝහල් නොතිබුණ අතර සියලු රෝගීන් යොමු කරනු ලැබුවේ ගමේ වෙදැදුරා වෙත හෝ පන්සලෙහි නායක හිමිපාණන් වෙතය. උන්වහන්සේ සිංහල වෛද්‍ය ශාස්ත්‍රය පිළිබඳ මනා අවබෝධයක් ඇත්තෙක් වූහ. බොහෝ විට ඖෂධ පැළෑටි පන්සල් භූමිය තුළ වගා කරන්නට විය. වස් කාලයේ දී බොහෝ බෙහෙත් ද්‍රව්‍ය ගැමියන් පන්සලට පූජා කළ අතර වෙද හාමුරුවෝ ඒවා නැවත ජනතා සුභසිද්ධිය සඳහාම භාවිත කළහ.

වෛද්‍ය කටයුතු පමණක් නොව ජ්‍යොතිෂ කටයුතු ද නායක හාමුදුරුන් විසින් සිදු වූ අතර ගැමි ජිවිතය හා බැඳුණු මඟුල් තුලා, නම් තැබීම, කෙස් කැපීම, අකුරු කියවීම, ගොයම් වැපිරීම, අස්වනු නෙළීම, අස්වනු ගෙන ඒම, විවාහය, රෝගී අවස්ථාව, ජීව දානය, ගෙවල් ඉදි කිරීම, නැකතට පදිංචි වීම. ගෙට ගෙවදීම, මරණය, පාංශුකූලය සහ මරණයෙන් පසුව කෙරෙන චාරිත්‍ර යනාදි සකලවිද අංගයන් හා පන්සල අනිවාර්යෙන්ම සම්බන්ධ වූ අතර ගැමියාට පන්සලෙන් තොරව සමාජ පැවැත්මක් පිළිබඳව සිතීමටවත් නොහැකි විය.

> **කෙසේ වෙතත් මෙවන් පූර්වාදර්ශයන්, මුල් කාලීනව ආරාම පොදුවේ පරිභෝජනය කළත් පසු කලෙක ඒවා පෞද්ගලිකව මෙහෙයවීමට අවශ්‍ය පසුබිම සකස් කරන්නට විය. ශ්‍රී ලංකාද්විපය පුරා ගම් නියම්ගම් තුළ පන්සල් ඉදිවන අතර ඒවායෙහි දක්නට ලැබුණේ පොදු සම්පත් පරිභෝජනය තරමක් දුරට වෙනස් වු ස්වරූපයකි.**

පන්සල හා ගම අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාවයත් සන්නිවේදනයත් අතර දැඩි සමීප බවක් දක්නට ලැබුණි. සංස්කෘතික කේන්ද්‍රස්ථානය පන්සල වූ අතර එය නායකත්වයේ කේන්ද්‍රස්ථානය ද විය. ගමෙහි අභිවෘද්ධිය පිළිබඳව සියලු තීරණ ගනු ලැබුවේ පන්සල විසින් ය. ගමේ පන්සලේ නායක හාමුදුරුවන්ගේ තීරණය ගම් වාසීන්ගේ ද අවසාන තීරණය විය. පන්සල ගමේ ප්‍රධාන සන්නිවේදන කේන්ද්‍රස්ථානය විය. පන්සලේ විවිධ කටයුතු හා සම්බන්ධව බෙර වාදන, හේවිසි වාදන, හොරණෑ වාදන, පැවතුණ අතර මෙමගින් ඇතැම්විට ගැමියෝ වේලාව පිළිබඳව තීරණයකට අවතීරණය වූහ. එපමණක් නොව උදයේ ආහාර පූජාව, දහවල් ආහාර පූජාව, දහවල් දානය, සවස ගිලන්පස හා මල් පූජාව, බෝධි පූජාව, රාත්‍රී ධර්ම දේශනය යනාදිය පිළිබඳව ද දැනුවත් වූහ. ලංකාවේ පිහිටි බොහෝ පන්සල්වල නියමිත වේලාවට

1. අලුයම් ධූරය
2. දහවල් ධූරය
3. සැන්දෑ ධූරය යන වාදන

තුන එකම මොහොතක වාදනය විය. මහනුවර ශ්‍රී දළදා මාළිගාව ප්‍රධාන කරගත් සිද්ධස්ථානවලින් පටන්ගෙන ලංකාවේ සියලුම පන්සල් තුළ මෙම සන්නිවේදන ජාලය ක්‍රියාත්මක විය.


හේවිසි ශබ්ද හා ඝණ්ටාර ශබ්ද වර්තමානයේත් පන්සල්වල ක්‍රියාත්මක වන අතර මෙය ආරම්භ වුයේ කවදාදැයි නිශ්චිතව කිව නොහැකි ය. ඝණ්ටාරය එක්තරා රිද්මයකට නාද කිරීම, නිශ්චිත වාරයක් නාද කිරීම, යනාදිය තුළින් යම් යම් අදහස් ගම්වැසියන්ට සම්ප්‍රේෂණය කෙරිණි.

දිවා කාලයේ ගොවිතැන් ආදී විවිධ කාර්යයන් හි නියැලුණ ගැමියෝ රාත්‍රී කාලයේ දී විහාරස්ථාන කරා ඒකරාශී වූහ. බුද්ධ පූජා, බෝධි පූජා යනාදියෙහි සමගි සම්පන්නව යෙදුණ ගැමියෝ එමගින් ධාර්මික ප්‍රීති සුවයක් අත් වින්දහ. සතර පෝයටම සිල් සමාදන් වූහ. මුල්කාලයේදී රජවරුන් පවා එකම ධර්ම ශාලාවේ ජනතාව සමඟ අසුන්ගෙන පසළොස්වක පොහොය දින සිල් සමාදන් වී ඇති බවට මහාවංශය සාක්ෂි දරයි. පන්සලේ නායක හිමිපාණන් තම නිවසට වැඩමවා ධර්ම දේශනා පැවැත්වීම සුලබ සිද්ධියක් විය. බොහෝ විට ගමෙහි ලියකියවිය හැකි ජනයා පන්සිය පනස් ජාතක පොත, පූජාවලිය, සද්ධර්ම රත්නාවලිය, යනාදි සම්භාව්‍ය ග්‍රන්ථ පරිශීලනය කළේ පන්සලේ පොත්ගුලෙනි. එම ග්‍රන්ථ තුළ වූ සුවිශේෂී චරිත ග්‍රාමීය ව්‍යවහාරයට ප්‍රවිෂ්ඨ වුයේ පන්සල කේන්ද්‍ර කරගෙනය. 'අනේ අනිච්චං' 'මහා මූසිලයෙක්' 'දේවදත්තයෙක්' 'බුදු වෙන්න ගියත් මාරයෙක්' 'අදින්න පුබ්බකයෙක්' 'මසුරු සිටාණ කෙනෙක්' 'කාලකණ්ණියෙක්' ආදී යෙදුම් ගැමි භාෂා ව්‍යවහාරයට එක් විය. එමගින් අපේක්ෂා කළේ අකුසලයෙහි වෙළුණු ජනයා ඉන් මුදවාගෙන කුසලයෙහි යෙදවීමයි.

වෙසක් පොහොය, ඇසල උත්සවය, අලුත් අවුරුදු චාරිත්‍ර, කඨින උත්සවය, ගිරිහණ්ඩ පූජා , පැවිදි උත්සව, උපසම්පදා උත්සව, දාන ව්‍යාපාර, ශීල ව්‍යාපාර, ශ්‍රමදාන ව්‍යාපාර, පන්සල කේන්ද්‍රකර ගනිමින් සංවිධානය විය.
මේණකොට ගෙනයි. රටේ රජතුමා පමණක් නොව

15 පිටුවෙන්

ශාස්ත්‍රපති
රුවන් ජයවීර. - ගලේවෙල



# කිංසුකෝපම සූත්‍රය

## කෑල ගසේ උපමාව

ධර්මය අවබෝධ කරනොගත් එක්තරා භික්ෂුවක් රහතන් වහන්සේලා සතර නමක් වෙත පිවිස මහණහුගේ දර්ශනය කෙතෙකින් සුවිශුද්ධ වේද? යන ප්‍රශ්නය විමසූ කල්හි දුන් පරස්පර පිළිතුරු කෙරෙහි සතුටු නොවූ හෙයින් භාග්‍යවතුන් වහන්සේ වෙත පිවිස, එම කාරණය සැලකරන ලදි. එවිට සර්වඥයන් වහන්සේ කෑල ගසක් (එරබදු ගසක්) උපමා කොට එම රහතන් වහන්සේලා දුන් පිළිතුරු නිවැරදි බව සනාථකර කළ දේශනය කිංසූකෝපම සූත්‍රයේ (සං.නි-බු.ජ 4-368) සඳහන්ව ඇත.

කෑල ගසක් (ඉන්දියාවේ ඇති එරබදු විශේෂයකි) නොදුටු පුද්ගලයෙක් කෑල ගස දැක ඇති පුද්ගලයන් සිව් දෙනෙකුගෙන් කෑල ගස කෙසේද? කියා විමසූ විට තමන් කෑල ගස දැක ඇති ආකාරය විස්තර කරයි. කෑල ගස කලින් කලට වෙනස් ස්වරූපයන් ගනී. එසේ හෙයින් පළමු පුද්ගලයා කෑල ගස දැක ඇති ආකාරය විස්තර කරයි. කෑල ගස කලින් කලට වෙනස් වන ස්වරූපයන් ගනී.

එසේ හෙයින් පළමු පුද්ගලයා කෑල ගස දාගිය කණුවක් මෙන් කළු ලෙස විස්තර කරයි. සමහර කාල වලදි කොළ හැලී පිලිස්සුන කළුපාට දණ්ඩක් මෙන් කෑල ගස දිස්වේ. දෙවන පුද්ගලයා කෑල ගස මස් වැදූල්ලක් මෙන් ලේ පාටය. ලෙස විස්තර කරයි. රතුපාට මලින් පිරීගිය කාල වලදී කෑල ගස ලේ පාට වන්නේය. තෙවන පුද්ගලයා කෑල ගස මහරී ගසක් මෙන් පැලුණු කරල් ඇත්තේය. ගැලවුණු පොතු ඇත්තේය ලෙස විස්තර කරයි. සමහර කාලවලදී කෑල ගස අසිපත් වල කොපු මෙන් පැලුණු කරල් සහ පොතු ගැලවී පවතී. සිව්වන පුද්ගලයා කෑල ගස නුගරුඛක් මෙන් ගන සෙවණ ඇත්තේය ලෙස විස්තර කරයි. සමහර කාල වලදි කෑලගස කොළවලින් පිරී පවතින බැවින් නුග රුකක් වැනිය.

එසේ ඒ ඒ මොහොතේ කෑල ගස දුටු පුද්ගලයා විස්තර කරනුයේ ඒ අවස්ථාවේ දුටු අයුරිනි. නමුත් පිළිතුරු වැරදි නැත. මන්ද? ඒ ඒ පුද්ගලයා කෑල ගස දකින අවස්ථාවේ පැවති ස්වභාවය ම ඔහු විස්තර කර ඇති බැවිනි. මෙලෙස ධර්මය අවබෝධ කරගත් රහතන් වහන්සේලා තම තමන්ගේ අවබෝධය විවිධ ආකාරයෙන් ප්‍රකාශ කර ඇත.

සිත පිරිසිදු කිරීමට නම් සියල්ල අවබෝධ කළ යුතුය. සර්වඥතා ඥාණයෙන් අවබෝධ වන සියල්ල රහතන් වහන්සේ නමකට අවබෝධ කළ නොහැක. නමුත් අවිද්‍යාව හා තණ්හාව දුරු කිරීමට අවශ්‍ය සියල්ල අවබෝධ කළ යුතුය. මෙසේ පෙර කී රහතන් වහන්සේලා තම තමන්ගේ අවබෝධය පිළිවෙලින් මෙසේ වදාරන ලදී.

- **භික්ඛු ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථගමඤ්ච යථාභූතං පජානාති** - පිරිසිදුවීමට නම්, යම් භික්ෂුවක් ස්පර්ෂ ආයතන සයෙහි සමුදය - අස්තඞ්ගමය තතුසේ දත යුතුය.

පළමු රහතන් වහන්සේ ස්පර්ෂ ආයතන සයෙහි සමුදය - අස්තඞ්ගමය කමටහන වඩා සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් යන මාර්ග ඵල වලට පත්වූ බැවින් තමන් පිරිසිදු වූ ක්‍රමය දේශනා කර ඇත. ඇස, කණ, නාසය, දිව, කය සහ මන ආධ්‍යාත්මික ෂඩායතනයි. මේවා ඇතිවී (සමුදය) ඇත්තේ වර්ණ, ශබ්ද, ගන්ධ ආදී බාහිර අරමුණු ගෙන විඳීමට ඇති කැමැත්ත හෙවත් තෘෂ්ණාව නිසාත් ඇස ආදී ආයතන ජරා, මරණ කරා යන බව අරමුණු ගෙන විඳීමට ඇති කැමැත්ත හෙවත් තෘෂ්ණාව නිසාත් ඇස ආදී ආයතන ජරා මරණ කරා යන බව නොදන්නා අවිද්‍යාව නිසාත්ය. වර්තමානයේ නැවත එසේ තෘෂ්ණාවත් අවිද්‍යාවත් ඇතිකර නොගත්තා නම් නැවත සළායතන හටනොගනී. එනම් අස්තඞ්ගමය හෙවත් නිරෝධය සිදුවේ.

- **භික්ඛු පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයඤ්ච අත්ථගමඤ්ච යථාභූතං පජානාති** - පිරිසිදුවීමට නම්, යම් භික්ෂුවක් පඤ්ච උපාදානස්කන්ධයාගේ සමුදය අස්තඞ්ගමය තතුසේ දත යුතුය.
- දෙවන රහතන් වහන්සේ රූප, වේදනා, සංඥා, සංඛාර සහ විඤ්ඤාණය යන පංච උපාදානස්කන්ධයාගේ ඇතිවීම සහ නැතිවීම හෙවත් උදය ව්‍යය දැකීමෙන් නිවනට පත්වූ උත්තමයකි. එනම් රූපයේ ඇතිවීම අවිද්‍යාව, තෘෂ්ණාව, කර්මය, ආහාර, උත්පාද ලක්ෂණය ලෙස ප්‍රත්‍ය පස් ආකාරයකින් වේදනා, සංඥා, සංඛාරවල ඇතිවීම අවිද්‍යාව, තෘෂ්ණාව, කර්මය, නාමරූප, උත්පාද ලක්ෂණය ලෙස පස් ආකාර බැගින් පංච උපාදානස්කන්ධයේ ඇතිවීමේ ප්‍රත්‍ය විසිපහක අවබෝධයෙන් සහ ඉහත ඇතිවීමේ ප්‍රත්‍ය විසිපස් ආකාරය නිරෝධයෙන් වන පනස් ආකාරයක උදයව්‍යය අවබෝධ කරගෙන නිවන සාක්ෂාත් කළ බව දක්වේ.

- **භික්ඛු චතුන්නං මහාභූතාන සමුදයඤ්ච අත්ථගමඤ්ච යථාභූතං පජානාති** - පිරිසිදුවීමට නම් යම් භික්ෂුවක් සතර මහාභූතයින්ගේ සමුදය අස්තඞ්ගමය තතුසේ දත යුතුය.
- තුන්වන රහතන් වහන්සේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන භූත රූපයන් සතරේ ඇතිවීම නැතිවීම අවබෝධයෙන් නිවන සාක්ෂාත් කළ බව දක්වේ. මෙම ස්වභාව ධර්මයේ පවතින ශක්තීන් සතර වේගයෙන් වෙනස් වේ. එකිනෙක අතර ඇති සංකලනය සෑම මොහොතකදීම වෙනස් වේ. එබැවින් මේවායින් සෑදි ඇති සියලුම රූප වෙනස් වේ. එනම් රූප එක් ස්වභාවයක සිට තව ස්වභාවයකට පත්වන බැවින් එනම් විපරිණාමයට පත්වන බැවින් තමන්ගේ යැයි ගැනීමට යෝග්‍ය නොවේ. එනම් සියලුම රූප අනිත්‍ය, දුක්ඛ, අනාත්ම බව අවබෝධයෙන් විශුද්ධිය ලැබිය හැකි බව දක්වේ.

- **භික්ඛු යං කිඤ්චි සමුදය ධම්මං සබ්බන්තං නිරෝධධම්මන්ති යථාභූතං පජානාති** - පිරිසිදුවීමට නම් යම් භික්ෂුයක් යම් ධර්මයක් හටගැනීමේ ස්වභාවය ඇතිතේ නම් ඒ සියල්ල ම නැසීයාමේ ස්වභාවය ඇති බව තතුසේ දත යුතුය.

සිව්වන රහතන් වහන්සේ සියලු ධර්මයන් හේතු ප්‍රත්‍ය නිසා හටගන්නා බවත් හේතු ප්‍රත්‍ය නිරුද්ධවීම නිසා නැසීම සිදුවන බවත් යථාභූතව අවබෝධ කරගෙන නිර්වාණය සාක්ෂාත් කළ උත්තමයෙකි. එනම් පටිච්චසමුප්පාදය අවබෝධයෙන් උන්වහන්සේ යථාර්ථය අවබෝධ කරගෙන ඇත.

පෙර අවිද්‍යාව නිසා සකස්කළ සංස්කාරය ප්‍රත්‍යයෙන් විඤ්ඤාණ, නාම රූප, සළායතන, ඵස්ස, වේදනා යන ඵලය හෙවත් විපාකය ඇතිවී ඇති බවත්, එම ඵලය නැවත දුන් අවිද්‍යාවෙන් ප්‍රත්‍යයක් නොකර ගතහොත් නැවත ඵලයක් (විපාකයක්) ඇති නොවන බවත්, අවබෝධයෙන් ඇතිවන තැනම නැතිවන බව දන්නා යථාභූත ඥාණය ඇතිවී නිවන වන බව දැක්වේ.

භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්න අසන භික්ෂුවට තවදුරටත් ධර්මය අවබෝධ වන පරිදි උපමා උපමේය ඇසුරින් ධර්මය දේශනා කළ සේක. අවසානයේ භික්ෂුව සෝතාපන්න විය. ප්‍රධාන රාජධානියේ සිටින චක්‍රවර්ති රජතුමා හොඳින් පවුරු බැඳි දොරටු හයක් ඇති ප්‍රත්‍යන්ත නුවරක රජ වූ පාප මිත්‍රයන් සමඟ එක්වී සුරාවට ලොල් වූ තමන්ගේ පුත් කුමාරයා ඉන් මුදවා ගැනිමට බලසම්පන්න යෝධයෙකු සහ පණ්ඩිත ඇමතියෙකු එම ප්‍රත්‍යන්ත නුවරට යවයි.

නුවර දොරටුවේ සිටින නුවණැති දොරටුපල්ලා විසින් හඳුනන අය පමණක් නුවරට ඇතුලු කර ගනී. නාඳුනන අය ඇතුල්කර නොගනී. යෝධයා සහ ඇමති දොරටුපල්ලාගෙන් නුවර කුමාරයා කොහේදැයි අසා ඇතුලේ සතර මං සන්ධියේ බව දැනගෙන ඇතුලු නුවරට පිවිසෙති. ඇමති, පාප මිත්‍රයන් සමඟ සුරා බොමින් සිටින කුමාරයාට ඉන් මිදී යහපත් ලෙස රාජ්‍ය පාලනය කරන ලෙස දැන්වූවත් ගණන් නොගෙන නොඇසුණා මෙන් සිටි නිසා, යෝධයා කඩුව රැගෙන කුමාරයාගේ හිසෙන් අල්ලාගෙන චක්‍රවර්තී රජතුමාගේ කැමැත්ත ඉටුකරනු, නැතිනම් තගේ හිස කපා දමන බව කියා තර්ජනය කළේය. එවිට පාප මිත්‍රයෝ පලාගියහ. කුමාරයා ද බියට පත් වී අවවාදය පිළිගත්තේය. ඉන්පසු කුමාරයාව අභිෂේක කොට හොඳින් රාජ්‍ය පාලනය කරන ලෙස දන්වා දෙදෙනා ම පැමිණි මඟට පිළිපන්හ.මෙහි චක්‍රවර්තී රජතුමා යනු සර්වඥයන් වහන්සේය. ප්‍රත්‍යන්ත රාජ්‍ය යනු අපගේ ශරීරයයි. දොරටු සය යනු සළායතනයයි. සුරාවට ලොල් වූ කුමාරයා යනු අපිරිසිදු සිතයි. දොරටුපල්ලා යනු සතියයි. පාප මිත්‍රයන් යනු පංච නීවරණයි. යෝධයා යනු සමථයයි. පණ්ඩිත ඇමති යනු විදර්ශනාවයි. සතර මං සන්ධිය යනු වස්තු රූපයයි. අවවාදය යනු නිවනයි. ආ මඟ යනු ආර්ය අෂ්ටාංගික මාර්ගයයි.

භාග්‍යවතුන් වහන්සේගේ අවවාදය වන්නේ නිවන් අවබෝධය කරන ලෙසයි. නමුත් අප ශරීරය නැමැති නුවර පංච නීවරණයන් නැමැති පාප මිත්‍රයන් සිටින නිසා සිතේ යථාභූත ඥාණය ඇති නොවේ. එබැවින් සමථය වඩා නීවරණ පහ කරමින් පළමු, දෙවන, තෙවන, සිව්වන ආදී ධ්‍යාන ඇතිකරගෙන ඒ තුළින් විදර්ශනාව වඩවා යථාර්ථය අවබෝධ කළ යුතුය. මේ සඳහා සිහිය පැවතිය යුතු අතර, ආර්ය අෂ්ඨාංගික මාර්ගයම භාවිත කළ යුතුවේ. නිවන අවබෝධයේදි සමථයත් විදර්ශනාවත් දෙකම අතහැරේ. අතහැරිය යුතු නැත. අවබෝධයෙන්ම අතහැරේ.

මේ අනුව බුදුපියාණන් වහන්සේගේ සද්ධර්මය අවබෝධ කරගැනීමේ ක්‍රම බොහොමයක් ඇත. ඒ අනුව ගමන් කරමින් නිර්වාණයම සාක්ෂාත් කරගැනීමට වීර්ය කරමු.

පූජ්‍ය මැල්සිරිපුර ධම්මකුසල හිමි
ආර්ය නිකේතනය
කන්නිමහර, වතුරුගම

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

# "සමගියම යහපති"

මානව සමාජය තුළ තිබිය යුතු උසස්ම ගුණය සමගියයි. කුඩාම සමාජ ඒකකය වන පවුලේ සිට අන්තර් ජාතික සබඳතා දක්වා සමගිය බලයක් ලෙස කැපී පෙනෙයි. සමගියට සාමය එක්වූ කල්හි සහජීවනය නම් වඩාත් උතුම් සමාජ ගුණ ධර්මය ඇතිවෙයි. "සමවායො එව සාධු" ලෙසින් සමගියම යහපති යැයි බුදුරජාණන් වහන්සේ වදාළේ ඉන් මිනිස්කමේ උදාරත්වය ප්‍රකට කරන හෙයිණි.

ඉතා සුළු දෙයින් පවා කිපෙන මිනිසා සමාජයට මහත් විපත් සලසයි. වෛරය, ක්‍රෝධය, ඉතා පහත් ගති ලක්ෂණ ලෙස බුදුරජාණන් වහන්සේ විසින් බොහෝ විට උගන්වනු ලැබ ඇත. අවිශ්වාසය, වාද විවාද ඇතිවීම, ගැටුම යනාදියද සහජීවනය බිඳ දමන කාරණා වෙති.

වර්තමාන සමාජ ක්‍රමය, ආර්ථික මෙන්ම දේශපාන ක්‍රමයද සැකසී ඇත්තේ සාමය, සමගිය මෙන්ම සහජීවනයද බිඳ දමන සංකල්පනා මුල් කොටගෙනය. ඒ තුළ හොදහැටි වෛරය තිබේ. ඒ තුල හොද හැටි ඊර්ශ්‍යාව තිබේ. එවන් සමාජයක් නිරතුරුව ගැටුම් වලින් බහුලය.

දැහැමි සමාජයක පදනම පන්සිල් සුරැකීමය. අන්‍යන්ට ගරු කිරීම, අන්‍යන්ගේ දේපල, වස්තුව ආරක්ෂා කිරීම කාමයෙන්, මුසාවෙන් ඈත්වීම මෙන්ම මත්ද්‍රව්‍ය භාවිතයෙන් මිදීම තුළින් සහජීවනය ගොඩනැංවෙයි. අහිංසාවාදී සමාජයක් බිහිවන්නේ එලෙසිණි. බුදුරජාණන් වහන්සේ "අත්තූපනායික ධර්ම පර්යාය" තුළින් පෙන්වාදෙන්නේ ද තමන් උපමා කොට අන් අයට හිංසා පීඩා කිරීමෙන් වැළකී සිටීය යන්නය. මෙය සෑම පුද්ගලයෙකුගේම ආදර්ශ පාඨය විය යුත්තකි. සෑම පුද්ගලයෙකුගේම දැක්ම විය යුත්තකි.

සහජීවනය සඳහා හේතුවන තවත් උසස් ගුණයක් වන්නේ ඉවසීමය. ඉවසීමෙන් ලැබෙනුයේ සැනසීම පමණක් නොවේ. ආත්ම විමුක්තිය ලැබීමේ මාර්ගය විවෘත වන්නේද ඉවසීම තුළිණි. බෝසත් කතා පුවතම ඉවසීම පිළිබඳව අපට බොහෝ පාඩම් කියාදෙයි.

වර්තමාන සමාජ ක්‍රමය තුළ අන් කිසිවෙකුගෙන් වත් සාමය, සමගිය, සහජීවනය හෝ ඉවසීම පිළිබඳව අවවාද හෝ ආදර්ශ ලැබිය නොහැකිය. සිහිකළ හැකි එකම මාර්ගෝපදේශකයා බුදුරජාණන් වහන්සේ පමණය. එබැවින් බුදුන් වදාළ මාර්ගය අනුගමනය කොට ජීවිතය යහපත් කරගැනීම තම තමන් විසින්ම කරගත යුතුය.

සමස්ත සමාජ දේශයම අපට පෙන්වා දෙන්නේ අයහපතය. දුසිරිතය ගැටුම්කාරිත්වය සහ ප්‍රචණ්ඩකාරිත්වයයි.

එයින් මිදීමත් දැහැමි දිවි පෙවෙතකට යොමුවීමත් අප සතුය. ජීවන විමුක්තිය සලසා ගැනීම මෙන්ම ලෞකික සන්තෘෂ්ඨිය සලසාගැනීමද අප විසින්ම උපයාගත යුතුය.

අද දහම් පත පොත බහුලය. සියලුම විද්‍යුත් සහ නව මාධ්‍යන් තුළින්ද බුදු දහම අධ්‍යයනය කළ හැකිය.

අපට මගපෙන්වීමට අපව යහමඟ කියාදෙන්නට සර්ව බලධාරී දෙවියෙකු නොමැති බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. මේ උදාවන අලුත් අවුරුද්දේ ද මේ කෙටි පණිවිඩය වඩාත් සිහියට ගන්නේ නම් මැනවි.

# සුපසන් සමාජයක් උදෙසා එකමුතු වෙමු.

දෙදෙනෙක් ඔවුනොවුන්ගේ අදහස් තේරුම් ගෙන කලකෝලාහල වලින් තොරව කටයුතු කිරීමද ගමක් තවත් ගමක් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමද රටක් තවත් රටක් සමග සහයෝගයෙන් කටයුතු කිරීමද සමාජයක් තවත් සමාජයක් සමග එකමුතුව කටයුතු කිරීම ද සමගිය ලෙස සරලව හඳුන්වාදිය හැකිය.

එමෙන්ම මෙම සෑම අංශයකම විවාද සහිත බව සහ සහයෝගයෙන් තොර ස්වභාවය අසමගිය ලෙසද හඳුන්වා දිය හැකිය. සමගිය නැති තැන පිරිහීමද සමගිය ඇති තැන සැපත සතුට දියුණුව නිරන්තරයෙන් පවති.

රටක විවිධ ආගම් විවිධ දේශපාලන පක්ෂ විවිධ ආර්ථික න්‍යායයන් මෙන්ම විවිධ අධ්‍යාපනික ක්‍රම වේදයන් පැවති නමුත් එම විවිධත්වය මතින් සැකය අවිශ්වාසය හරහා ආගම් අතර දේශපාලන පක්ෂ අතර හා ආර්ථික අධ්‍යාපන යන අංශයන්හීද අසමගිය ඇති වුවහොත් එම රටේ සමාජයේ බිඳ වැටීම පිරිහීම සිදුවේ.

මක් නිසාද යත් එම අසමගිය හරහා තම තමන්ගේ අයිතීන් වෙනුවෙන් සටන් කරන විට ජීවිත හානි දේපල හානි සිදු වන්නට බොහෝ ඉඩකඩ පවතිනා නිසා ශාක්‍ය කෝලීය දෙපිරිස රෝහිනි නදියේ ජලය වෙනුවෙන් තම අයිතීන් දිනා ගැනීම සඳහා යුද වදින්නට සැරසෙන විට බුදුරජාණන් වහන්සේ එතනට වැඩම කොට ඔවුන්ව සමගි කළේ සියල්ලටම වඩා ජීවිත වල තියන වටිනාකම පෙන්වා දෙමින් සහ සමගි සම්පන්න බවේ පවතින මහ වටිනා කම පෙන්වා දෙමින්ය.

ශ්‍රී ලාංකික සමාජය දෙස බැලීමේදී ලංකාවේ ප්‍රධාන ආගම බුද්ධාගමයි. බුදු දහමට අනුව ලංකා සමාජය හැඩගැසී ඇත. අතීතය දෙස නැවත හැරී බැලීමෙදී රටට සමාජයට යම් විපත්තියක් සමාජය දෙකඩ වීමක් සිදුවන හැම මොහොතකම බාහිර සහ අභ්‍යන්තර වශයෙන් රට ජාතිය පිරිහීමට පත්වන විට එයින් මුදවා ගැනීම සඳහා පෙරමුණ ගත්තේ බෞද්ධ භික්ෂුවයි.

රටේ පාලකයන්ට අනුශාසනා කරමින් ඔවුන් අතර පවතින අසමගිකම් දුරුකර නිවැරදි මග පෙන්වා දුන්නේ ආගමික නායකත්වය නිවැරදිව ක්‍රියාත්මක කරමින්ය. අද ද එය අඩු වැඩි වශයෙන් සිදු වුවද එම අනුශාසනාවන් පිළිගන්නා නායකයෝද අතීතයේ මෙන් වර්තමානයේ නොමැති තරම්ය. ඊට හේතුව වශයෙන් අප දකින්නේ වර්තමාන භික්ෂුව කෙරෙහි පෙර පැවති ගෞරවය හා විශ්වාසය සමාජයෙන් තරමක් දුරට ගිලිහී යෑමයි.

එයටද හේතුවක් ඇත. එනම් අද වර්තමාන භික්ෂූන් වහන්සේලාද විවිධ කණ්ඩායම් ලෙස බෙදී සිටියි. එම නිසා අසමගිව සිටින සමාජයක් සමගි කිරීමට නම් අනුශාසකයන් වන භික්ෂූන් වහන්සේලා සමගිව කටයුතු කිරීම ඉතා ප්‍රයෝජනවත්ය. භික්ෂූන් වහන්සේලාද මෙලෙස බෙදී ඇත්තේ තම පුද්ගලික පරමාර්ථ ඉටුකර ගැනීමට නොවන බවද අවධාරණය කළ යුතුය.

උන්වහන්සේලා ඒ තත්වයට පත්ව ඇත්තේ රට ජාතිය ශාසනය හමුවේ පවතින ගැටළු අභියෝග පාලකයන්ට පෙන්වා දීමට හා එයට විසඳුම් ලබාගෙන රට ජාතිය ආගම සුරක්ෂිත කිරීමටය. පාලකයන් ඒවාට ඇහුම්කන් නොදෙන නිසා විවිධ ස්වරූපයෙන් තම මතය ඉදිරිපත් කිරීමට භික්ෂූන් වහන්සේලා ඉදිරිපත්ව ඇත.

මෙම භික්ෂූන් වහන්සේලාට නිවැරදි නායකත්වයක් ලැබුනහොත් සෑම භික්ෂුවක්ම සමගි කොට බුදුරජාණන් වහන්සේගේ ධර්ම විනය පමණක් අනුගමනය කරමින් රට ජාතියද ආගමද සමගි කළ හැකිය.

"සුඛා සංඝස්ස සාමග්ගිං" යන දේශනාව පරිදි සංඝ සමගිය සංඝයාට පමණක් නොව සමස්ත සමාජයටම සුව ගෙන දෙන්නකි. රටක සමාජයක දියුණුවට බලපාන ප්‍රධානතම අංශයක් වන්නේ දේශපාලනයයි. ඕනම රටක පක්ෂ වශයෙන් බෙදී තම තමන්ගේ දේශපාලන මතය සමග පක්ෂ දේශපාලනය කිරීම සාමාන්‍ය දෙයකි. එය අප ප්‍රජාතන්ත්‍රවාදය ලෙස හඳුන්වන්නෙමු. නමුත් එම මති මතාන්තර සමග එකම රටක එකම මිනිසුන් අසමගිව ජීවත් වන්නේ නම් මොන තරම් අභාග්‍යයක්ද? එය සමාජයේ පිරිහීමයි.

අද වර්තමානයේ අපට දක්නට ලැබෙන්නේ දේශපාලන මති මතාන්තර ඔස්සේ දේශපාලකයෝ එකිනෙකාට බැන වදිමින් චෝදනා කරමින් සිටින බවක්ය. ජය ගත්තෝ සතුටකින් මෙන්ම පරාජිතයෝ වෛරය මුසුවූ දුකකින් බලය ඇති අයට අකුල් හෙලන ස්වභාවයක්ද දක්නට ලැබේ. මෙම අසමගිය එකම රටක එකම මිනිසුන් අතර නම් එම රට එම සමාජය දියුණුව කරා නොයයි. කරත්තේ බැඳි ගොනුන් දෙපැත්තට යන තාක් කරත්තය නිසි මග නොයන්නා සේ රටක් දියුණු කරන්න නම් එම රටේ පාලකයෝ ජය පරාජය සාමාන්‍ය දෙයක් සේ සලකා වෛරය පසෙකලා සහයෝගයෙන් සමගියෙන් කටයුතු කළ යුතුය.

සමාජයක් පැවැත්මට හේතුවන අධ්‍යාපන ආර්ථික ආදි අංශයන්ද මෙහෙයවනු ලබන්නේ දෙශපාලඥයාය. එම නිසා එම හැම දියුණුවකටම පාලකයන් සමගිව කටයුතු කළ යුතුය.

බුදුරජාණන් වහන්සේගේ දේශනය පරිදි මිනිසුන්ගේ ජීවිත වලට කරදර ගැටුම් අඩ දබර අසමගිකම් ඇති වීමට බලපාන කාරණා වන්නේ චන්දා, දෝසා, භයා, මෝහා යන සතර අගතීන්ය. මෙම සතර අගතියට නොවැටී සෑම කෙනෙක්ම කටයුතු කරන්නේ නම් හැම විටම සමාජයේ සිටින මිනිසුන්ට සමගිව සමාදානයෙන් වාසය කිරීමට ඉඩකට සැලසේ.

රටක සමාජයක දියුණුව භෞතික මට්ටමින් පමණක් සිදුවීම ප්‍රමාණවත් නැත. බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම පරිදි පුද්ගලයෙක් බාහිර දියුණුව මෙන්ම අධ්‍යාත්මික දියුණුවද සලසා ගත යුතුය. අධ්‍යාත්මික සමගිය නම් රාගය, ද්වේශය, මෝහය, වෛරය, ඊර්ෂ්‍යාව වැනි අකුසල සිතුවිලි වලින් තොර මනසක් ඇති කමයි.

එම අකුසල සිතුවිලි බැහැර කර කරුණාව මෛත්‍රිය හා උපේක්ෂා සහගත චේතනාවලින් යුතුව කටයුතු කිරීමට යමෙක් හුරු වන්නේ නම් ඔහුගේ අධ්‍යාත්මීය දියුණුව ඇතිවන්නා සේම එම දියුණුව සහිත පුද්ගලයාගෙන් සිදුවන ක්‍රියාවන්ද සමාජයට අහිතකර නොවේ.

එබැවින් පළමුව තමා තුළ පවතින අධ්‍යාත්මික හා බාහිර අසමගිය පිරිහීම සකස් කර ගත යුතුය. එවිට නිරායාසයෙන්ම මුළු සමාජයම සමගි සම්පන්න සුවපත් සමාජයක් බවට පත්වේ.

ශාස්ත්‍රවේදි පූජ්‍ය
කෝන්ගහවෙල සුමන හිමි

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.

## වස්සාන ගීතය...

වස්සාන ගිතයක හඩ ඇසී  බැලුවෙමි
සිරි සිරිය හරි මෑදුව හදවතට සුව  දැනුණි
මේඝ ගර්ජනාවෙන් කම්පිතව සළිත  වෙමි
වස්සාන ගිතයේ සප්ත ස්වර  නිහඬවුණි

පිපුණු මල් සියුම් පෙති නටු අගින්  ගිළිහුණා
ළදළුපත් නෙතු දැකින් හිස නවා  වැළපුණා
මහ පොළොව මහා හඩින් මහ සොවින්  වැළපුණා
වස්සාන ගිතයේ සප්ත ස්වර  ගොළුවුණා

හෙමි හෙමින් සිසිළසින් සනසවා  පිවිතේ
තිල තණ පළස මත සතපවා  පිවිතේ
පෙද වැස්ස හාදවී සමග සැඩ  මාරුතේ
අනේ අප හැඬෙව්වා නොවෙද ඔබ  හාමතේ

එම්. සිරිධම්මචාරි මෙහෙණින් වහන්සේ

## මව් තුරුලෙ සැනසෙන්න ආයෙ එන්නෙ කවදාද?

වෙල් එළියෙ දුව පැන්න
වැලි කෙළිය සිත යැව්ව
මව් තුරුලෙ සුව වින්ද
මතකයිද ඒ සමය

සිතින් සන්සුන් වෙලා
ගතින් සංවර වෙලා
මව් තුරුලෙ සැනසෙන්න
ආයෙ එන්නෙ කවදාද

බෝ මලුවෙ සිසිලසට
බුදු හිමිගෙ දයාවට
කහ සිවුරෙ බැඳීමට
නිවී ඇත ඔබේ සිත

උදලු කෙටියක් අරන්
අප්පච්චිගෙ තනියට
එදා වගෙ ආයෙ යන්න
බෑ නේද පොඩි සමිඳු

අනේ මගෙ මල්ලියේ
කියන්න ආසයි
ඒත් අද ඔබේ සිත
සන්සුන්ය, සුපසන්ය

සතර වග දුකින් මුදවා
බණ පදයක් සනසන්න
බුදුහිමිගෙ පා මුලේ
සැනසෙමුද සැමකල්ම

දුක් නිවා සැනසෙන්න
මතු භවයෙ එක්වෙන්න

දිල්රුක්ෂි අබේකෝන්

## දහමට අනුව සිතන්න.

බුදු බව ලබා ලොව සතහට දෙසූ  බණ
පසක් කරවු බව දැනෙනා කෙලෙහි  ගුණ
බුදුබව ලබන්නට පිහිටවූ බෝ  සෙවණ
කළගුණ සැලකුවේ දහමට අනුව  යන

කල්ගත වන විටදි කළ සේවය අමතක  වේ
සත් පුරුෂයන් හට එය එලෙසින් නොම  වේ
කළ සේවයට නිති ඇගැයීමක් කළ  යුතුවේ
එවිට දහම සැමදා අප අතරම  වේ

සත් පුරුෂයන් අප අතරද සිටිනු  පෙනේ
එය අප සැනසීමටද එක් හේතුවක්  ගෙනේ
දුර්ජන සිත් සතන් දුරුකර සිතට  දිනේ
උතුම් දහම් ගුණයට නිති සිහි කරනු  මැනේ

වෛරය ක්‍රෝධයෙන් සත සිත  වනසන්නේ
මෙත් බව උතුම් යැයි දහමෙහි  දැක්වෙන්නේ
කිසිදු පලක් නැති වචනය ඉවතට  ලන්නේ
පුහුදුන් ලොවේ ජය ගැනුමට එය ඉවහලක්  වන්නේ

අජන්තා ශිරෝමණී දිසානායක






## කිඹුල්වත් පුර ග

කිඹුල්වතින් එන සුලගේ සිසිල්  බවයි
ඥාතීන් වෙතට බුදු හිමියන් වැඩිය  දිනයි
දෙසුවේ දහම් රසයෙන් සැම දෙන  පිනවයි
සසර දුක් නිවාලන මඟ හෙලි  කෙරුවයි

වයසින් වැඩි අයත් දරුවන් ලවා  වැඳ
මානෙන් උදම් වී සිටි සතියක් මැදට  වැද
යමාමහ පෙළහරක් පෑවේ අහසෙ  ඉඳ
රැස්ව සිටි සැවොම වැන්දේ සාදු  නඳ

දහස් ගණන් ජනයා රැස්වී  එතන
වදිමින් සරණ ගියෙ බුදුහිමි සිටින  තැන
ශාක්‍යයන්ගේ මානය නැතිවී  නිතින
කිඹුල්වත් පුරය බැබලුනි බුදුහිමි  රැසිනි

## වනපෙතක සැදෑවක

කදුරැලි තැනිතලා සෙල් බිම්  ගෙවල්වල
දියරැලි සහ සොබාවික දිය රැදුන  ගල
සැලි සැලි තුරු ලතා කුමරුන් සමග  නල
සලු පිලි වඩන විට මිල කල හැකිද  දොල

දිනපති කිරණ හෙලුවත් තුරු හිස්  මතට
අතු ඉති අතර නොවැටෙන හරියට  බිමට
හංකිති කවන සෙවනැලි වැතිරුන  පිටට
අං ඇති සද්දන්ත ගෝනකු යයි  පෙරට

බැවුම් තැනි තලාවේ තුල ඉස්  මත්ත
පීවම් කරයි මොනවද රෑසියෝ  හැත්ත
කෝලම් කරන පැටවුන් බඩ බැද  ගත්ත
පාලම් නැතිව යයි ඒ වදුරන්  රොත්ත

කදු යා කරන බිම් පෙදෙසේ ගසක  ඇතී
හැරයා නොගිය කද අතු රිකිලි  නැතී
සිරියාවන්ත කම පෙන්නු බරව  බැතී
කොටියා වැතිර ඇත පෙන්නා නිවුන  ගතී

බර බිම තියෙන වංගෙඩි කරමින්  සද්ද
තර වුන සිරුර මතුවී වනයෙන්  හද්ද
ඉරගල වැටෙන විට පැත්තට ගම්  මැද්ද
හොර ගමනක යෙදෙන්නේ  පර්වතයක්ද

හානා හීය පොලොවේ ගොවිතැන්  නොකර
පානා අඩ හැරය නැති ගොවියෙකු  විතර
සේනා නැතිව තනිවම යන එන  බැහැර
පේනා ඌරෙකුගෙ මඩ මිස කෝ  සිරුර

තරවී බඩ පිට්ටු ගෙඩියක් දෙවෙනි  කල
බොරවී තිබුන මඩ දිය පිරී ලගන  විල
හිරවී තුලට විට හපමින් වැටෙන  කෙල
මුසුවී තිබුනි හරකුන්ගේ සමග  මල


එම්.එම්.කුලසිරි සිල්වා

## මා දුටු සමාජ කතර

අඳුරු කතරේ හමුවේ....
නොයෙක් මුහුණු හමුවේ
නොයෙක් දසුන්,
එක් කරයි නොයෙක් සිතුවිලි,
සිතෙහි කැලඹෙයි මෙලෙස
කොපමණ උත්සහ දැරුවත්,
සිතා ගැන්මට නොහැකිය....
කුරිරු සමාජය....
විටෙක විෂ සහිතය,
විටෙක විෂ රහිතය,
පෙරාගත නොහැකි චිත්ත රූපයක්....
කැළඹෙයි ගත සිත පුරා....
උඩුදුවයි මෙලෙස හද සිසාරා....
සමාජ කතර,මා නොසිතූ නොවිරූ
අමුතු ලොවක් බඳුය,
ගැටළු සහිතයි,
ගැටළු රහිතයි,
නමුත් ජීවිත අත්දැකීම් බොහොමයි,
ජීවිත මඟ සරු කරගැන්මට,
ඒ දණ්ඩක් බඳුය,
විටෙක මා සිත පවසයි....
මෙලෙස හොඳ නරක වෙන් කර ගැනීම,
තමා මත රඳා පවතියි,
මා දුටු සමාජ කතර එයයි....

සෙනාලි මධුෂිකා අඹගස්පිටිය

# බුදු පිළිමයෙන් පිළිබිඹු වන මුද්‍රා



**අප මහ බුදුරජාණන් වහන්සේගේ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන ගුණාංග නිරූපණය කරලීමට උන්වහන්සේගේ කායික ලක්ෂණයන් උපයෝගී විය.**

සාමාන්‍යයෙන් අප කිසියම් නිර්මාණයන් දෙස සුපරීක්ෂාකාරිව බලා සිටියදී ඒ තුලින් අප සිතට කිසියම් හැඟීමක් ජනිත වේ නම් එය සාර්ථක නිර්මාණයක් වන්නේය. බුද්ධ ප්‍රතිමාව ද එවැන්නකි. අද්විතීය බුද්ධ ප්‍රතිමාවක දක්නට ලැබෙන මුද්‍රාවන් පිළිබඳව තවදුරටත් විමසා බලමු.

ශීල සමාධි ප්‍රඥා වැඩීම තුලින් සිත එකඟකර ගැනීම බුදු දහමේ ඉගැන්වෙන මූලික කරුණු බව අප දනිමු. බුද්ධ ප්‍රතිමාවෙන් ඒ හැඟීම් ජනණය වීම නිරූපණය විම සිදුවී ඇත. එය චිත්‍රකලා ශිල්පීන්ගේ දක්ෂතාවය වුවද ඒ අය බෞද්ධ ප්‍රතිමා චිත්‍ර නිර්මාණයේදී නියමිත සංඥා (මුද්‍රා) උපයෝගී කොට ගෙන ඇත. අප ඒ පිළිබඳව තවදුරටත් විමසිලිමත් වෙමු.

## I. ධ්‍යාන මුද්‍රාව



සමාධි ධ්‍යාන මුද්‍රාව නමින්ද හඳුන්වනු ලබයි. සමාධි මුද්‍රාව යන්න සමාධිය චිත්ත ඒකාග්‍රතාවයයි. එනම් ශීල, ප්‍රඥා යන දෙකෙහි ප්‍රතිමූර්තියකි. අප රටේ පවතින පිළිමවල වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ ධ්‍යාන මුද්‍රාවයි. අනුරාධපුර මහමෙව්නා උයනේ තෙලා ඇති සමාධි පිළිමය ඒ සඳහා වන හොඳම සාධකයකි.


## II. අභය මුද්‍රාව



අභය මුද්‍රාවද ඉතාම ජනප්‍රිය මුද්‍රාවක් වශයෙන් විද්වතුන් පිළිගනිති. මේ තුලින් ඔප් නැංවෙන්නේ නිර්භයවය හා දානය බව පැවසේ. බුදුරජාණන් වහන්සේ සසරභය දුරුකර නිර්භයබයට පත්ව ඇති බව විද්වතුන්ගේ මතය වී ඇත. උන් වහන්සේ නිර්භයබය පෙන්වීමට බෞද්ධ සාහිත්‍යයේ ජාතක කථා තුලින් ඕනෑතරම් උදාහරණයක් ඇත. අභය මුද්‍රාවේ දකුණත ඇගිලි දිගහැර ඉදිරියට ඉදිරියට පා සිටින අතර වමත වැලමිට ලඟින් ඔසවා පසුපසට හරවා තබාගෙන ඇත.

උදාහරණයක් ලෙස බුදුරුවගල හිටි පිළිමය වෙහෙරගල හිටි පිළිමය ආදී පිළිමතුලින් ඒ ලක්ෂණයන් නිරූපිතවී ඇති බව පැහැදිලිය.

## III. වරද මුද්‍රාව



වරද මුද්‍රාව තවත් ලක්ෂණයකි. බෞද්ධ ග්‍රන්ථයන් තුලින් මෙම මුද්‍රාව විග්‍රහ වන්නේ වරදාන හා දාන නමින්ය. දකුණත් පහත්කොට ඇගිලි දිගහැර අත්ල උඩු අතට හරවා තිබීමත් වන අතර වමත මැදින් උඩට නමා ඇගිලි විහිදුවා සිටින ආකාරයක් මෙයින් පෙනේ.

බුදුන් වහන්සේ වෙත පැමිණෙන්නා වූ තැනැත්තන්ට වරදීමට උන්වහන්සේ තුල පැවති ආශ්චර්යමත් බව මින් අදහස් කරන බව විද්වතුන්ගේ මතය වී ඇත. වරද මුද්‍රාවේ උන්වහන්සේගේ මහා කරුණා ගුණය නිරූපණය වන බව අප දකින්නෙමු.

ගඩලාදෙණියේ ඇති ලෝකඩ ප්‍රතිමාවෙන් මෙම මුද්‍රාව දර්ශනය වුවත් බුරුමය ඉන්දුනීසියාව වැනි රටවල පවතින ඇතැම් බුද්ධ ප්‍රතිමා වහන්සේලා තුලින් මෙම මුද්‍රාව ප්‍රතිරූපණය වන බව බෞද්ධ පොත්පත් වලින් පැහැදිලි වෙයි.

## IV. ධර්මචක්‍ර මුද්‍රාව



ධර්ම චක්‍ර මුද්‍රාවෙහි දකුණු අත්ල පිටතට හරවා පපුව මට්ටමෙහි තබාගෙන මාපට ඇඟිල්ලේ කුඩා කවයක් සෑදෙන පරිදි එකට තබා ඇතුලට හැරුණු වම් අතේ ඇඟිල්ලක් ස්පර්ශ කරන ආකාරයයි. මෙම මුද්‍රාව තුලින් පෙන්වා දෙන්නේ බරණැස මිගදාය නුවර ඉසිපතනාරාමයේදී පවත්වන ලද 'ධම්මචක්කපවත්තන සූත්‍රය' දේශනා කල අවස්ථාවේ බව කියැවේ.

බුදු රජාණනන් වහන්සේ තමන් වහන්සේ අවබෝධ කරගත් 'ධර්ම ආඥා චක්‍රය' කෝටියක් සක්වල පවත්වන ආකාරය මෙයින් පෙන්නුම් කරන බව විද්වතුන්ගේ මතය වී තිබේ. එමෙන්ම මෙම මුද්‍රාව බෝධි සත්ව ප්‍රතිමාවල දැක්වෙන බවද කියැවේ. භූමි ස්පර්ශ මුද්‍රාව වෙතට ඊළඟට යමු.


## V. භූමි ස්පර්ශ මුද්‍රාව



බෞද්ධ සාහිත්‍යයෙහි එන මාර පරාජය මේ මුද්‍රාව තුලින් කියැවෙන බව අදහස් කරයි. උන් වහන්සේ බුදුවීමට පෙරාතුව දානාදී පාරමිතා සම්පූර්ණ කිරීම මහපොළොව සාක්ෂියක් බවට දක්ෂිණ හස්තය පොලොවට දිගු කිරීම මේ තුළින් ප්‍රකාශිත වන බවත් උගතුන්ගේ මතය වී ඇත.

දකුණු ඉන්දියාව, ඉන්දුනීසියාව, තායිලන්ත සහ ලාඕස් යන රටවල බුදු පිළිම නිර්මාණයේදී භූමි ස්පර්ශ මුද්‍රාව යොදා ගන්නා බව බෞද්ධ ග්‍රන්ථයන්හි සඳහන් වේ.

## VI. විතර්ක මුද්‍රාව



මෙයද ප්‍රතිමා නිර්මාණයේදී එක්තරා ලක්ෂණයකි. දකුණු අත මාපට ඇඟිල්ල හා දබර ඇඟිල්ල එකතු කොටගෙන ගැටළු විසදාලීමේ ස්වරූපයක් මෙයින් පිළිබිඹු වන බව සඳහන් වේ. ඉතිරි ඇඟිලි තුන දිගහැර තබා ගනිමින් අත්ල ඉදිරියට විවෘතව තබා ගැනීමත් දක්නට ලැබේ.

මෙම සලකුණු සහිත බුද්ධ ප්‍රතිමා ආසියාතික රටවල පවතින බවත් විශ්ව ශක්තිය හා ප්‍රඥාව එයින් වඩාත් පිළිඹිබු වන බවත් විද්වත්හු පවසති.

## VII. පරදුක්ඛ දුඃඛිත



පරදුක්ඛ දුඃඛිත මුද්‍රාව නමින් හැඳින්වෙන මුද්‍රාව පිළිබඳ තොරතුරු සොයා බලමු. මෙය නෙලුම් මලක් මත පා තබා නිමවා ඇති බුද්ධ ප්‍රතිමාවක ආකාරයකි. බුද්ධ ප්‍රතිමාවෙහි අනිමිස ලෝචන පූජාවේ නිරතවුණු අවස්ථාවක් ලෙස මෙය අදහස් කරයි.

මෙම මුද්‍රාවේ වැලමිටෙන් නවාගත් දෙඅත එකක් අනෙතට සිටින ලෙස ලය මත තබාගෙන සිටින අයුරු දක්වා ඇත. පොලොන්නරුවේ ගල් විහාරයෙහි හිටි පිළිමයෙහි මුද්‍රාව උදාහරණයක් ලෙස පෙන්වාදිය හැකි බව විද්වතුන්ගේ මතය වී ඇත. මෙම මුද්‍රාව පිළිබඳ විවිධ මත එලදරන බවක්ද සඳහන් වේ.

## VIII. ප්‍රතිග්‍රාහක මුද්‍රාව

පූජාවත්, දානයත්, පූජා භාණ්ඩයත් පිළිගන්වද්දී එය පිළිගන්නා ආකාරය අවස්ථාවට ගැලපෙන පරිදි දෑත් ඉදිරියට දිගුකරන විලාශය දක්වන මුද්‍රාව ප්‍රතිග්‍රාහක මුද්‍රාව ලෙස සැලකේ.

හිඳගල පිහිටි බෞද්ධ සිතුවම්වල තපස්සුභල්ලුක වෙළඳ සහෝදරයන්ගේ පූජාව දක්වන (බාර ගැනීම) සිතුවම උදාහරණයක් ලෙස පිලිගත හැකි අතර මෙවැනි පිලිගැන්වීම් දැක්වෙන අවස්ථා ඉන්දියාවෙන්ද දැකගත හැකි බව විද්වතුන් සඳහන් කරති.

කෙසේ වුවද වඩාත් සුපරීක්ෂාකාරීව බුද්ධ ප්‍රතිමා මෙන්ම චිත්‍රවලින්ද ඉහතින දැක්වූ මුද්‍රා ප්‍රතිරූපණය වන පරිදි සකස් කර ඇති නිර්මාණ අප දැක ඇති බව ඔබේ මතකයටද නැගෙනවා නිරනුමානය.

(පොතපත ඇසුරිණි)

**පද්මා එන්. කොඩිකාර**

# සිංහල හින්දු අලුත් අවුරුද්දේ සැනසෙමුද? වැනසෙමුද?



ශ්‍රී ලාංකේය ජනී ජනයා ඇඟිලි ගනිමින් බලා සිටින්නා වූ තවත් සුවිශේෂී දිනයක් අප්‍රේල් මස 14 දින උදාවනු ඇත. එකී දිනයත් සමගම ඉදිරියට දින කිහිපයක්ම සිංහල හා හින්දු ජනයා සොවින් සිටින්නට පිඹුරුපත් සලසනු නියති.

එසේ සොවින් සිටින්නට ජනයා වෙර දැරුව ද ඒ උදෙසා කරනු ලබන ක්‍රියා පිළිවෙත් නිසා සැනසීමට වඩා වැනසීමට මංපෙත් විවර වන අවස්ථා ද සුලභ ය. එබඳු කරුණු කාරණා කිහිපයක් පිළිබඳ ව සලකා බැලීම වැදගත් වනු නියත ය.

සිංහල හා හින්දු අලුත් අවුරුද්ද නියම කොටගෙන අප දනන් බොහෝ දෙන ඇති පදමට සුරාව තොල ගෑම අද දක්නට ඇති නින්දිත අමනෝඥ ක්‍රියාවකි. සිඟාලෝවාද සූත්‍රයෙහි පෙන්වා දෙන පරිදි මද්‍යපානයෙහි ආදීනව සයකි. බලා සිටිය දී ධනය වැනසීම, නොයෙක් කලාවලට පැටලීම, රෝගවලට ආයතන වීම, අපකීර්තිය වැඩි වීම, ලැජ්ජා රහිත වීම සහ ප්‍රඥාව දුබල වීම එහිලා පෙන්වා දිය හැකිය.

අවුරුදු දිනවලදී වැඩි වශයෙන් කරන්නා වූ මෙම ක්‍රියාව නිසා වෙහෙස මහන්සියෙන් උපයා සපයා ගත් ධනය විනාශ වී ගොස් අවුරුදු කල නිම වූ විට අතේ සතේ නැතිව දුක් විඳීමට සිදුවන අවස්ථා සුලභ ය. එසේම බීමතින් විවිධ කලකෝලාහලවලට ගොස් ආපදා සිදු කර ගත්තා වූ තැනැත්තන්ගෙන් ද අඩුවක් නැත. ලේ වමනය පවා දමා අධික ලෙස රෝගාතුරුව රෝහල්වලට එන්නා වූ අයගෙන් ද අඩුවක් නැති කාලයක් ලෙස අවුරුදු කාලය පෙන්වා දිය හැකිය. නිර්ලජ්ජිතව විවිධ නොමනාකම් කොට අපකීර්තියට ලක්ව ආත්ම ගෞරවය විනාශ කර ගන්නාවුන්ගෙන් ද මෙම වකවානුව පිරී ඇත එසේ හෙයින් අවුරුද්ද තුළ මත්ද්‍රව්‍ය භාවිතය නිසා සැනසෙන්නවුන්ට වඩා වැනසෙන්නවුන් සිටින බව අමතක නොකළ යුත්තකි.

තවද සිංහල හින්දු අලුත් අවුරුදු නිමිති කොට ගනිමින් විකාල චරියාවෙහි යෙදෙන්නන් හෙවත් අවේලාවේ වීථි සංචාරය කරන්නන්ගෙන් ද අඩුවක් නැත. සිඟාලෝවාද සූත්‍ර දේශනයට අනුව එවැන්නන්ට සිදුවන ආදීනව ද සයකි. තමාට රැකවරණ රහිත වීම, අඹු දරුවන් රැකවරණ රහිත වීම, වස්තුව රැකවරණ රහිත වීම, සෙස්සන්ගේ සැකයට භාජනය වීම, අභූත චෝදනාවලට භාජනය වීම සහ බොහෝ දුක් කරදරවලට භාජනය වීම එකී ආදීනවයන් ය.

අදාළ කාලය තුළ යහළු මිත්‍රාදීන් හිතවතුන් සමඟ කාලය ගත කරනවිට නිසි කාලවේලාව පිළිබඳ අවබෝධයක් නොමැති කලක් වේලාවක් නොබලා හේතුවකින් ද තොරව අවේලාවේ වීථි සංචාරය කිරීම තුළින් සතුටු වනු ඇත. එවිට තමාගේ මෙන්ම තම අඹුදරුවන්ගේ ද රැකවරණය අහිමි වී යනු ඇත. එපමණක් ද නොව තම නිවසේ තමා නොමැති හෙයින් වස්තුවේ රැකවරණය ද අහිමි වනු ඇත. එපමණකුදු නොව අවේලාවේ වීථි සංචාරය කරනවිට ඔහු සොරකමකට යන්නේ ද වෙනත් උවදුරක් සිදු කරන්නට යන්නේ ද යන්න පිළිබඳව සෙස්සන් තුළ සැකය ඇතිවනවා පමණක් නොව අභූත චෝදනාවලට ද ලක් වනු ඇත.

ඒ තුළින් විවිධ දුක් කරදරවලට ලක් වීමට ඇති ඉඩ ප්‍රස්තාව ද බොහෝ වෙයි. එසේ හෙයින් සිංහල හින්දු අලුත් අවුරුද්දේ තනිව හෝ සමූහය සමඟ එක්ව හෝ විනෝදය සැනසීම තකා අවේලාවේ වීථි සංචාරය නොකළ යුත්තේම ය. එසේ වුවහොත් සැනසීම කෙසේ වෙතත් වැනසීම නම් සිදුවනු වළකාලිය නොහැකි වනු ඇත.

මෙම කාල වකවානුව තුළ සුලභව සිදු වන්නා වූ තවත් කරුණක් ලෙස දූ කෙළිය පෙන්වා දිය හැකිය. ගෙවල් දොරවල්වල පමණක් නොව මංසන්ධියේ කඩපිලේ යනාදී විවිධ ස්ථානවල යහළු මිත්‍රාදීන් හිතවතුන් එක්ව මුදලට ඔට්ටු අල්ලමින් දූ කෙළියෙහි නිරතවීම දැකිය හැකිය. සිඟාලෝවාද සූත්‍ර දේශනයේ පෙන්වා දෙන පරිදි දූ කෙළියෙහි ද ආදීනව සයක් වේ. එනම් දිනීම නිසා අනුන් වෛර කරයි, පැරදීම නිසා තමාම ශෝක කරයි, බලා සිටිය දී ධනය නැති වෙයි,

අනුන් විසින් තමාගේ වචන නොපිළිගන්නා තත්ත්වයට පත් වේ, මිතුරු කුළුපගයන්ගේ පිළිකුලට භාජනය වේ. එසේම විවාහයට නුසුදුස්සෙක් වේ. මේ සමයෙහි දූ කෙළියෙහි නිරත වන විට යමෙක් ජයග්‍රහණය කරන මොහොතේ පරාජිතයෝ ජයග්‍රාහකයා කෙරෙහි වෛර කරති. එයින් වෛරකාරයෝ බිහි වෙති. එය සැබවින්ම යහපත් දිවියකට බාධාවකි. පරාජය වූ විට තමා තම පරාජය පිළිබඳ සිතමින් ශෝකවීම සිදු කරයි. එය මානසික පීඩාවක් වන අතර සිත සනසා ගත නොහැකිවූවන් රෝගීන් බවට පත්වීම ද නොවැලැක්විය හැකි කරුණකි.

තමා උපයා සපයා ගත් ධනය නිරපරාදේ ඔට්ටුවෙන් පැරදී අන්සතුවීම වලකාගත නොහැකිව දුප්පතෙකු බවට පත්වනු ඇත. තමා සූදුකාරයකු වන හෙයින් අනුන් තමාගේ වචන පිළි නොගන්නා අතර පිළිකුල් සහගත පුද්ගලයෙකු ලෙසින් සමාජයේ ජීවත්වීමට සිදු වීම කෙතරම් කනගාටුදායක ය. එසේ හෙයින් සතුට තකා දූ කෙළියෙහි යෙදුණ ද එය මහත් විනාශයකට හේතු වන අයුරු දිසේ.

අවුරුදු වකවානුව වනාහි නිදහස් කාල සීමාවකි. එසේ හෙයින් විවිධ අය ඇසුරු කිරීමට අවස්ථාව ලැබීම ද විශේෂ වෙයි. තමාගේ කරුමයට පව්ටු මිතුරන් ඇසුරට වැටීම ඉතාමත් හානිදායක ය.

සිඟාලෝවාද සූත්‍රයෙහි පව්ටු මිතුරන් ඇසුරෙහි ද ආදීනව සයක් දක්වා තිබෙන අතර මෙහිලා එය සනිටුහන් කිරීම වැදගත් වනු ඇත. එනම් තුමූ ධූර්තයන්ට මැදි වෙත්, තුමූ ගැනු බාලයන්ට මැදි වෙත්, තුමූ රා ගුඩ්ඩන්ට මැදි වෙත්, තුමූ මගඩියන්ට මැදි වෙත්, තුමූ වංචනිකයන්ට මැදි වෙත්, තුමූ සාහසිකයන්ට මැදි වෙත් යනු එම ආදීනවයන් ය.

එනම් පව්ටු මිතුරන් ඇසුරු කරනවිට සූදුවට යාම මත්ද්‍රව්‍යයට යාම පමණක් නොව අනාචාරයේ යාමට පවා අවස්ථාව උදා කර ගන්නා සුළු ය. එපමණකුදු නොව වංචනික හා වැඩවල ද නිරත වනවාට අමතරව සාහසිකයන් හා එක්ව සමාජවිරෝධී ක්‍රියාවල ද නිරතවීමට ඉඩ ප්‍රස්තාව ඇත. එසේ හෙයින් අවුරුදු සමයෙහි ලැබෙන්නා වූ නිදහසින් අයුතු ප්‍රයෝජන ලෙස පව්ටු මිතුරන් ඇසුර නොකළ යුත්තේම ය. එසේ වුවහොත් සැනසීම නොව වැනසීම සිදු වනු නොඅනුමාන ය.

අප අවධානයට ලක් කළේ අවුරුදු සමයන්හි කරන්නා වූ ක්‍රියා පිළිවෙත් කිහිපයක් පමණි. එකී කරුණු කාරණාවලට අමතරව සැනසීමට යැයි සිතා වැනසීමට තුඩු දෙන්නා වූ කරුණු කාරණා බොහෝමයක් ද වෙයි. එබැවින් තමා කරන්නා වූ සැම දෙයක් පිළිබඳව ද දෙවරක් සිතා බලා කටයුතු කිරීම ඉතා වටනේ ය.

මේ කරන්නා වූ කාරණය තමාටත් අන්‍යයන්ටත් වැඩදායක ද එසේ නොමැති නම් අවැඩදායක ද එසේත් නොමැති නම් කිසිවෙකුටත් ඵලක් නැද්ද යන්න සිතීම ඉතා වැදගත් ය. පුද්ගලයාගේ සතුට අවශ්‍යය වූවකි. බුදුරජාණන් වහන්සේගේ දේශනයට අනුව සතුට උතුම්ම ධනය වේ.

නමුත් සතුටු විය යුත්තේ තමාටත් අන් අයටත් හානියක් නොවන පරිදි ය. එබැවින් අවුරුදු සමයේ සතුටු වන විට ඉහත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වනු නියති. සිංහල හින්දු අලුත් අවුරුද්දේ සැනසීම හෝ වැනසීම පිළිබඳ තීරණය ගත යුත්තේ තමා විසින්ම ය.

ආර්.එන්.එච්.එම්. සමන් ජයරත්න.



# බුදු දහමට අනුව ජීවිතයේ සැපතට මඟ පාදාගන්න.

**අප මනුෂ්‍ය ජීවිතයක් ලබා ගන්නේ පූර්ව භවයන් වල කරන ලද පුණ්‍ය කර්මවල මහිමයෙනි. එසේම මනුසත්භාවය ලබා ගැනීම ලෝකයේ දුර්ලභ කරුණු පහෙන් ඉතාමත් දුෂ්කර කරුණකි.**

(දුල්ලභඤ්ච මනුස්සත්තං පටිලාභො) ඉහත පුණ්‍ය මහිමයේ බලයෙන් අපට ලැබෙන සැප සම්පත් අප විසින් පරිහරණය කළ යුත්තේ අයුතු ප්‍රයෝජන වලින් තොරව කිසිවෙකුටත් අයහපතක් සිදු නොවන ආකාරයටය. පරලොවින් ගෙන ආ පින් මහිමය වඩාත් ඔපවත් කර ගැනීමට නම් අප උට්ඨාන වීර්යෙන් යුතුව නුවණ මෙහෙයවා කටයුතු කළ යුතුය.

අලසව මෝඩ ලෙස කටයුතු කිරීමෙන් තමන් වෙත ඇති පින් බලයද පිරිහී යාහැක. සුවසේ සැහැල්ලු මනසකින් යුතුව ජීවත්වීමට අල්පේච්ඡතාව (ලද දෙයින් සතුටුවීමේ ගුණය) ප්‍රගුණ කළ යුතුය. අධික ආශාවන් අප අසහනය, කනස්සල්ල, ඉච්ඡාභංගත්වය කරා යොමු කරවන අතර ඉන් තවදුරටත් පසුතැවිල්ලට පත්වේ.

මතු සසරෙහි පින් රැස්කර ගැනීමටත් එම සංසාර සාගරයෙන් එතෙර වීමටත් අවශ්‍ය කුසල් පාරමිතා වැඩීමටත් සුදුසුම ස්ථානය වන්නේ මනුෂ්‍ය ලෝකයයි. මිනිසත් බව ලැබීම ඉතාම දුෂ්කර, දුර්ලභ කරුණක් ලෙස තථාගතයන් වහන්සේ දේශනා කොට වදාළේ ඒ නිසාවෙනි.

වෙනත් දිව්‍ය ලෝකයක සතර අපායක පමණක් නොව මෙලොව ඉපදුනත් මිත්‍යා දෘෂ්ටි කුලකයක ඉපදීමෙන් පින් රැස් කිරීමට ඇති අවකාශ ඉතාමත් විරළය.

ඒ නිසාම ක්ෂණ සම්පත්තියෙන් යුතු මිනිසෙකුව ඉපදීම දුෂ්කර කරුණක් ලෙස දේශනා කොට ඇත. (කිචෙඡා මනුසස පටිලාභො) චිත්ත සමාධියක් ඇති කර ගැනීමටත්, කෙළෙස් හඳුනාගෙන සිත් පිරිසිදු කර ගැනීමටත් ප්‍රඥාව දියුණු කර ගැනීමටත් මිනිස් ලොව තරම් සුදුසු වෙනත් ස්ථානයක් තවත් නැත.

අපට සිත සන්සුන් කරගෙන ඵලදායී ජීවිතයක් ගතකිරීමට නම් පහත දැක්වෙන ප්‍රශ්න තමා විසින් තමාගෙන් ඇසිය යුතුවේ. එනම්,

- මා අතීතයේදී සිදුවූ අප්‍රසන්න අමිහිරි සිදුවීම් ගැන දුක් නොවී පසුතැවිලි නොවී ප්‍රසන්න සිදුවීම් ගැන ආඩම්බර නොවී ඉන්නා කෙනෙක්ද?
- අනාගත බලාපොරොත්තු රාශියකින් සිත පුරවා නොගෙන අහස් මාලිගා වලින් ඉවත්ව සිටිනා කෙනෙක්ද?
- මා කෝපයක් ඇතිවූ විට ක්ෂණයකින් එය නිමා කළහැකි කෙනෙක්ද?
- මා තුල ධනය, බලය, කීර්තිය, යසස, ප්‍රසිද්ධිය ගැන ඇති ආශාව අඩුද?
- මා අනුන්ගේ සැපත දුටු විට ඉවසා දරාගෙන සිටිය හැකි අයෙක්ද?
- වෙනත් අයෙකුගේ ගුණයක් අසන්නට ලැබෙන විට එය සතුටින් අවංකව, සන්සුන්ව අසා සිටිය හැකි කෙනෙක්ද?
- තමන්ගේ වගේම අනුන්ගේ සැපත වර්ධනය වන ආකාරයට කටයුතු කළ හැකි අයෙක්ද?
- අනුන්ට හිංසා පීඩා කිරීමෙන් වැළකී ඔවුන්ට උපකාර කිරීමට උනන්දු වන්නෙක්ද?
- සිත අගතිගාමී කර නොගෙන නිතරම උද්යෝගයෙන් සතුටින් ඉන්නා කෙනෙක්ද?

යථෝක්ත ප්‍රශ්න වලට ඔබට අවංකවම සත්‍යවාදී ලෙස සාක්ෂියට එකඟව "ඔව්" කියා කියාගත හැකි නම් ඔබ කරන්නාවූ භාවනාවෙන් සතුටු වියහැකි උසස් ප්‍රතිඵල ලබාගත හැක. අටලෝ දහමින් (ලාභ - අලාභ, නින්දා - ප්‍රශංසා, යස - අයස, සුඛ - දුක්ඛ) කම්පා නොවීම, ශෝක නොකිරීම, කෙළෙස් රජස් වලින් යුක්ත නොවීම සැනසිලිදායී ජීවිතයක ප්‍රධාන ලක්ෂණ වේ.

මේ ලෝකයේ සියල්ල අනිත්‍යයි නම් එහි ඇලී ගැලී සිටීමෙන් හෝ ඒ කෙරෙහි ගැටුම් ඇති කර ගැනීමෙන් ඇති ඵලය කුමක්ද? යම් දෙයක යථා ස්වභාවය ඒ අයුරින්ම තේරුම් ගත්විට ඇලීම්, බැඳීම් හෝ ගැටීම් වලින් තොරව ජීවත් වන්නට මනා හැකියාවක් පළපුරුද්දක් කෙනෙකු තුළ ඇතිවේ.

අප ධර්මානුකූල ජීවිතයක් ගත කරනවාය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? මෙහිදී එකවිටම ත්‍රිපිටක බුද්ධ ධර්මය කටපාඩම් කරගෙන සිටීම, දහම් ග්‍රන්ථවලට ගරු බුහුමන් කිරීම විවිධ ස්ථානවල පැවැත්වෙන විචිත්‍ර ධර්ම දේශනා වලට සවන්දීම හා ශීල ව්‍යාපාර භාවනා පන්ති වලට සහභාගීවීම යන කාරණා කෙනෙකුගේ සිහියට නැගේ.

එහෙත් බුදු දහම සවන්දීමට හෝ පොත පතෙහි ලියාතැබීමට හෝ අන්ධ භක්තියෙන් විශ්වාස කිරීමට හෝ දේශිත ධර්මයක් නොවේ. යමක් ධර්මය නම් එය සත්‍යයකි. ධර්මයට අනුව හැසිරෙන තැනැත්තා ධර්මය විසින්ම ආරක්ෂා කරන බවත් ධර්මය මනාව ප්‍රගුණ කිරීමෙන් සැපත, විමුක්තිය ලඟා කරගත හැකි බවත් බුදුරජාණන් වහන්සේ සෑම විටකම ප්‍රකාශ කොට ඇත.

ධර්මයේ ගුණ සඳහන් වන තැන්වල දී එය බුද්ධාදී උතුමන් වහන්සේලා විසින් මනාව ප්‍රකාශ කරන ලද්දක් බවත්, මනාව දැක අවබෝධ කරගත යුත්තක් බවත්, කල් නොයවා ඒ මොහොතේම ප්‍රතිඵල ලබා දෙන්නක් බවත් ප්‍රඥාවන්තයින් කැඳවා දැක හඳුනා ගන්නට සලස්වා ලීමට සුදුසු දෙයක් බවත් නුවණැති සත් පුරුෂයින් විසින් ප්‍රගුණ කිරීම තුලින් ප්‍රත්‍යක්ෂ කළ යුත්තක් බවත් සූත්‍ර දේශනා වලදී මනාව පෙන්වා දී ඇත.

ත්‍රිපිටක ග්‍රන්ථවල දක්වා ඇති සූත්‍ර දේශනා වලින් වැඩි කොටසක් ඒ ඒ පුද්ගලයන්ගේ චාරිත්‍රානුකූලව දේශිත ඒවා වුවත් ඒ හැම දේශනාවකින්ම දක්නට ලැබෙන සාරය මිනිස් සිත මනා ලෙස හැඩ ගැස්සවීමට යොමුකර ඒ මගින් සහනශීලිව ජීවත්වීමට මගපෙන්වීමටත් ලෝකයේ යථාතත්වය අවබෝධ කරගැනීමටත් සත්වයාගේ අසහනයට හේතුවන්නාවූ ගැටුම් හා මුලාවීම් වලින් තොරව දුක් සහිත වූ සසර පැවැත්ම නවතා දමා පූර්ණ වූ විමුක්තියට පත්වීමට මඟ පෙන්වා දීමත්ය.

බුද්ධ දේශනා අතරින් කවර හෝ බණක් හරියාකාරව තේරුම් ගෙන ක්‍රමානුකූලව පිළිවෙත් ක්‍රමයක් මඟින් ධර්මතාවයන් තේරුම් ගැනීමට සැලකිලිමත්වීම ධර්මානුකූල ජීවිතයකට මුල පිරීමකි.

බුදු දහමේ එන භාවනා කිරීම යනුවෙන් අදහස් කරනුයේ ධර්ම දේශනා වලට ඇහුම්කන් දීමෙන් දහම් පොත්පත් බැලීමෙන් හෝ ධර්ම සාකච්ඡා කිරීමෙන් ලබාගත් දැනුම ප්‍රායෝගිකව අත්හදා බැලීමයි.

එවිට ධර්මය හෙවත් සත්‍ය අප ඉදිරියේ ප්‍රත්‍යක්ෂ වන්නට පටන් ගනී.

ස්ථිර අධිෂ්ඨානයකින් යුක්තව භාවනාවකට සිත් යොමුකරන සෑම අවස්ථාවකදීම අප කිසියම් ප්‍රමාණයකට ධර්මය හඳුනා ගනිමු. ධර්මය අවබෝධ කරගෙන ධර්මතාවන්ට අනුකූලවීමට සිත සකස්කර ගත යුතුය.

**විශ්‍රාමලත් සහකාර සංස්කෘතික අධ්‍යක්ෂ ඩී.එම්.එච්.කරුණාරත්න මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පළ කෙරේ.**

# සමාජයීය මිනිසා සඳහා බුදු සමය



බුදු සමය වූ කලී උත්තුංග අති පාරිශුද්ධ ක්‍රියා පද්ධතියක් බැවින් සාමාන්‍ය ස්ත්‍රී පුරුෂයනට එදිනෙදා වැඩ කරන අතරතුර එය ප්‍රගුණ කළ නොහැකි යැයි ඇතැමුන් කල්පනා කරති.

සැබෑ බෞද්ධයෙකු වීමට ආරාමයකට හෝ නිසසල තැනකට පිවිසිය යුතු යැයි ඔවුහු විශ්වාස කරති. එය වූ කලී බුදු රදුන් පිළිබඳ හරි අවබෝධයක් නොමැති කමින් ඇති වූ වැරදි මතයකි. බුදු සමය පිළිබඳ එහෙන් මෙහෙන් ඇසූ හෝ කිය වූ අනියම් දැනුමට අනුව ඔවුන් එවැනි නිගමනයකට බසිනු ඇත. තවත් අය තුළ ඇත්තේ බුදු සමය පිළිබඳ කිසියම් ලිපියක් හෝ පොතක් කියවීමෙන් ලබාගත් පක්ෂග්‍රාහී හෝ අසම්පූර්ණ වූ හෝ දැනුමකි. එවැනි පොත් හා ලිපි ලියූ කතුවරයනට ද තිබිය හැක්කේ බුදු දහම පිළිබඳ සීමිත දැනුමෙකි.

බුදුරජාණන් වහන්සේගේ ධර්මය ආරාම වාසී භික්ෂුනට පමණක් සීමා වූ අර්ථවත් වූ එකක් ද නොවේ. ඒ ධර්මට තම අඹුදරුවන් සමඟ ජීවත් වන ස්ත්‍රී පුරුෂයනට ද අදාළ වන්නේය. ආර්යය අෂ්ඨාංගික මාර්ගය නම් වූ බෞද්ධ ජීවන මාර්ගය සියලු ජනයා සඳහා අදහස් කරන ලද්දකි. එය කිසිදු විශේෂත්වයක් නොමැතිව මුළු මානව වර්ගයා වෙනුවෙන් ඉදිරිපත් කළ ජීවන මාර්ගයකි. ලෝකයේ සිටින අති විශාල ජනකායට භික්ෂු භික්ෂුණින් වීම හෝ හුදෙකලාව ගල්ලෙන් විහාර ආරාමගත වීම හෝ කළ නොහැක්කකි.

බුදු සමය කෙතරම් පවිත්‍ර ආර්යය ධර්මයක් වූව ද වර්තමාන ලෝකයේ මහජනතාවට එදිනෙදා ජීවිතයේ දී එය පිළිපැදීමට දුෂ්කර වන්නේ නම් එය නිෂ්ඵල ධර්මයකැයි කිව යුතු ය. එහෙත් ඔබ බුදු සමයේ හරය අවබෝධ කළෙහි නම් නිවැරදිව නිශ්චිතව එය අනුගමනය කිරීම හා භාවිත කිරීම සාමාන්‍ය මිනිසෙකු ලෙස ජීවත් වෙමින් කළ හැකි යයි පිළිගනු නිසැකය. හුදෙකලාව දුරස්ථව ජීවත් වෙමින් බුදු සමය පිළිපැදීම පහසු බැව් සලකන අය ද බහුලව සිටිති. ඔවුහු සෙසු අයගෙන් වෙන් වී ජීවත් වෙති. එහෙත් සමහරු එවැනි බැහැරවීම් ශාරීරික හා මානසික වශයෙන් තම ජීවිතය උදාසීනත්වයට හා අවපාතයකට යොමු වන බැවින් තමන් අපේක්ෂිත ආධ්‍යාත්මික බුද්ධි වර්ධනයට අහිත කර වෙතැයි ද සිතති.

අභිනිෂ්ක්‍රමණය නොහොත් බැහැර වීම ලෝකයෙන් භෞතික ලෙස පලායෑමක් නොවේ. බුදුරදුන්ගේ අග්‍ර ශ්‍රාවක ශාරිපුත්‍ර හිමියන් වදාළ පරිදි එක් පුද්ගලයෙකුට තාපස ප්‍රව්‍රජාවෙන් වනයේ විසිය හැකි ය. එහෙත් ඔහු අකුසලසිතිවිලි වලින් පිරී ඇත. තවත් අයෙක් ගම්වැසි හෝ නගර වැසි වන අතර තවුස් වෙසින් ද නොසිටිති. එහෙත් ඔහුගේ සිත පවිත්‍ර ය. කිසිදා අකුසල චේතනාවක් නොමැත. මේ දෙදෙනා අතරින් පවිත්‍ර ජීවිතයක් ගත කරන්නා වඩා උසස් වෙයි. වඩා බලවත් වෙයි.

(මජ්ඣිම නිකාය)

බුද්ධ දේශනාව අනුව ජීවත් වීමට සාමාන්‍ය පවුල් ජීවිතයෙන් බැහැර විය යුතු යැයි සාමාන්‍ය විශ්වාසය ද සාවද්‍ය මතයකි.

එය බෞද්ධ ප්‍රතිපත්ති භාවිතයට හෝ ප්‍රගුණ කිරීමට එරෙහිව අවිඥානිකව ඇතිවන එක්තරා වැරදි මතයකි. සාමාන්‍ය ලෙස ජීවත් වෙමින් පවුල් ජීවිත ගත කෙරෙමින් ඉතා සාර්ථක ලෙස බුදුරදුන් වදාළ පරිදි නිවන් සුව ලබාගත් ස්ත්‍රී පුරුෂයන් පිළිබඳ බොහෝ කථා පුවත් බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වී තිබේ.

වච්ඡ ගොත්ත එක්තරා අවස්ථාවකදී බුදුරදුන් අමතා සාමාන්‍ය ස්ත්‍රී පුරුෂයන් වශයෙන් ගෘහ ජීවිතයක් ගත කෙරෙමින් නිවන් දුටුවන් ඇද්දැයි ප්‍රශ්න කර ඇත. උන්වහන්සේ එවැනි අය කොතෙකුත් ඇති බව විග්‍රහ කරමින් දක්වූ සේක. නොයෙකුත් සෝෂා බාධා කිරීම් රහිත නිහඬ ස්ථානයන්හි සිටීමට සමහරු කැමැත්තාහ. එහෙත් වඩා පැසසිය යුත්තේ ධෛර්යයවත් කළ යුත්තේ සෙසු අය අතර වෙසෙමින් බුදුසමය ප්‍රගුණ කිරීමයි. සෙසු අයට සේවාව කිරීමය.

ඇතැම් විට සමහර අවස්ථාවලදී යම් යම් අයට බැහැරව ගොස් එකලාව ජීවත් වෙමින් තම මනස දියුණු කර ගැනීමත්, හැසිරීමත්, සීල-සමාධි ප්‍රඥා සාක්ෂාත් කර ගැනීමේ පෙර හුරුවක් සේ ප්‍රයෝජනවත් විය හැකි ය. අනතුරුව අනුනට මෙහෙ කිරීම වස් ශක්ති සම්පන්නව යළි පැමිණිය යුතු ය. කිසියම් කෙනෙක් මුළු ජීවිත කාලයම හුදෙකලා වෙත් ද? තම විමුක්තිය හා සැනසීම පමණක් සිතත් ද? අසල්වැසියන් ගැන සැලකිලිමත් නොවෙත් ද? එය කිසිසේත් බුද්ධ දේශනාවට නොගැලපේ.

බුදු සමය පදනම් වී ඇත්තේ අනුන් සඳහා වූ මෛත්‍රී කරුණා සහගත සේවාව පිණිය ය. සාමාන්‍ය මිනිසුන් ලෙස ජීවත් වෙමින් බෞද්ධ ප්‍රතිපත්ති රැකිය හැකි නම් සංඝරත්නය කුමක් සඳහා දැයි කෙනෙකුට ප්‍රශ්න කළ හැකිය.

සඟ සසුන පිහිටුවා ඇත්තේ තම ජීවිතය ආධ්‍යාත්මික හා බුද්ධි වර්ධනය උදෙසා කැප කිරීමෙන් තමනට මෙන්ම අනුනට ද මෙහෙයක් කිරීමට සැරසුනු අයට අවස්ථාවක් දීම සඳහා ය.

සඟ සසුන පිහිටුවා ඇත්තේ තම ජීවිතය ආධ්‍යාත්මික හා බුද්ධි වර්ධනය උදෙසා කැප කිරීමෙන් තමනට මෙන්ම අනුනට ද මෙහෙයක් කිරීමට සැරසුනු අයට අවස්ථාවක් දීම සඳහා ය. තම පවුල සහිත සාමාන්‍ය මිනිසෙකු එවැනි පූර්ණ සේවාවක් අනුන් සඳහා කැප කළ හැකි වෙතැයි බලාපොරොත්තු වීම උගහට ය. එහෙත් භික්ෂු නමකට තම පවුල පිළිබඳ එවන් වගකීම් හෝ ලෞකික බැඳීම් නොමැති බැවින් මුළු ජීවිත කාලයම පරාර්ථ සේවා සඳහා යෙදිය හැකි ය.

තම පවුල සහිත සාමාන්‍ය මිනිසෙකු එවැනි තම පවුල සහිත සාමාන්‍ය මිනිසෙකු එවැනි පූර්ණ සේවාවක් අනුන් සඳහා කැප කළ හැකි වෙතැයි බලාපොරොත්තු වීම උගහට ය. එහෙත් භික්ෂුනමකට තම පවුල පිළිබඳ එවන් වගකීම් හෝ ලෞකික බැඳීම් නොමැති බැවින් මුළු ජීවිත කාලයම පරාර්ථ සේවා සඳහා යෙදිය හැකි ය.

අනුනට කරන මේ සේවාව හෝ යහපත හෝ කුමක් ද? භික්ෂුනම සතුව දීමට තරම් ධනයක් නැතහොත් ලෞකික සැප පහසුකම් නොමැත. එහෙත් උන්වහන්සේට ලෞකික වශයෙන් බාධිත පවුල් පිළිබඳ ගැටළු සඳහා ආධ්‍යාත්මික මාර්ගෝපදේශය සැපයිය හැකි ය.

15 පිටුවට...

මහේෂ් සේනාධීර

## iv පිටුවෙන්

මිනිසා සතුව තිබුණු බුද්ධිය දේව දායාදයකැයි විශ්වාස කළ ද ජේ. බියුපෝන් නැමැති විද්වතා (ක්‍රි.ව. 1707 - 88) එය ශිෂ්ඨාචාරයේ තොටිල්ල බව පලකරයි.

මුල් මිනිසාගේ සමාජමය ජීවිතය නිසා භාෂාවක් හුරුවූ අතර ජීවන හා පාරිසරික සටනට අවශ්‍ය විවිධ මෙවලම් තනාගැනීම ඉක්මන් විය. භාෂාව කතා කිරීමට පෙර ඔහු කෙටි හා සමාන වදන් මඟින් ගී ගායනා කළ බව පෙනේ. දරු නැලවිලි ගී ඒවාගේ මුල්ම ස්වරූපය බව සිතිය හැකිය. දැනට සොයාගෙන ඇති වනචාරී ගෝත්‍ර වලට අයත් නැලවිලි ගී වල පුදුමාකාරය සාම්‍යයක් තිබේ. රෝ රෝ රෝ, ලා ලා ලා, නි නි නි, වැනි ඒකීය අක්ෂර යම්කිසි කාලයකට එදා ගැයුවේ මාතාවන් විය යුතුය. ඒ අනුව, භාෂාවක් නිර්මාණය කිරීමේ පළමු ප්‍රයත්නය ද අම්මලා සතුය.

## 05 පිටුවෙන්

ඔබට මේ කරදරකාරි ලෝකයෙන් ඉවත්වන අයුරු ලෝකයට පහල වූ සැබෑ විමුක්ති දායකයාණන් වහන්සේ ඉතා හොඳින් පැහැදිළි කර දෙනු ඇත. සියලුම සත්ව ප්‍රජාවම සොයන්නේ සැනසිල්ලයි. නැත්තේත් එයයි.

හේතුව ලෝකය තුළ සැනසිල්ල කියා දෙයක් නැත. ඇත්තේ වැනසිල්ලයි. දුප්පතාට සැනසිල්ල නැතුවා මෙන්ම පොහොසතාටද නැත. උගතාට සැනසිල්ල නැතුවා මෙන්ම නූගතාටද නැත.

වැඩිහිටියාට සැනසිල්ල නැතුවා මෙන්ම බාලයාටද නැත. සැනසිල්ල තරුණයාට නැතුවා මෙන්ම මහල්ලාටද නැත. ලෝකයේ ස්වභාවය එයයි. තත්වය මෙසේ නම් ස්ථිරසාර විසඳුමක් ලෝකය තුල සෙවීම සිහිනයක් පමණි. ලෝක ධර්මයන් අත්හැරීම තුලින්මයි සැනසිල්ල උදා වන්නේ.

පළමුව "මම" අත්හරින්න. ලෝකයේ කිසිම දෙයක් තමාගේ නොවන නිසා නොසලකා හරින්න. මායිම් නොකරන්න. දූ දරුවෝ, ස්වාමි භාර්යා, දෙමාපියෝ, ඤාතී මිත්‍රාදීන් තාවකාලිකව අම්බලමේදී හමුවූ මගියන් පමණි.

සමහර මගියන් ඔබට කලින් නොකියාම අම්බලමෙන් පිටවී යයි. ඊට කමක් නැත. ඒ අය ඔබගේ නොවන නිසා එන්න කියා ආවේත් නැතිනම් එපා කිව්වට ඉන්නේත් නැතිනම් අත්හරින්න. එසේම මේ ස්වභාව ධර්මයේ නීතියට තමාටත් එකයි.

සවිඤ්ඤානක, අවිඤ්ඤානක සත්ව පුද්ගලයා භෞතික සියලුම දේ යාම සඳහා ගමන් අරඹා ඇත. ඔබ තවමත් පැලපදියම් වීමට උත්සාහ ගන්නවා. සූදානම් වෙනවා. අද වැඩ කරන්නේ හෙට ඊටත් වඩා හොඳට ජීවත්වීමේ අදහසින්.

එහෙත් ස්ථිර විශ්වාසයක් තැබිය හැකි තැනක් නොවේ. මෙහි යථාර්ථය අවබෝධ වෙන්න වෙන්න ආශා විරහිත බවට පත්වී අත්හැරීමට නිතැනින්ම නැඹුරුවේ. ලෝකය සකස්වී තියෙන්නේ අපිළිවෙලටය. ඔබ පිළිවෙලක් කරන්න පිලියම් යෙදුවට උත්සාහ කලත් මහන්සි ගත්තත් නිරපරාදේ කිසිම වැඩක් වෙන්නේ නැහැ. ලෝකයේ යථාර්ථය දකිනවා යනු කළකිරෙනවා නොවේ.

ඇත්ත ඇති සැටියෙන් දැකීමයි. යථාර්ථය අවබෝධයයි. ඔබට බොහෝ දේවල් ඇත්නම් බොහෝ කාලයක් යවා අත්හරින්න.

## 07 පිටුවෙන්

ගම්වැසියා මේ සියල්ල වටා ඒකරාශී වෙමින් තම කාලය ශ්‍රමය, ධනය කැප කළේ මහත් වූ රුචිකත්වයෙනි. ධාර්මික ප්‍රීති සුවයක් අත් විඳිමිනි.

**''රජ්ජ සුඛස්ස වායාමො**
**නායං මම කුදාචන**
**සම්බුද්ධ සාසනස්සේව**
**ඨපනාය අයං මම''**

මාගේ මේ ප්‍රයත්නය හුදෙක් රජ සැප විඳීමට නොව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය හා චිරජීවනය සඳහා බව එදා දුටුගැමුණු රජතුමා ප්‍රකාශ කළේ පන්සලෙන් ලත් පන්නරය කරණකොට ගෙනයි. රටේ රජතුමා පමණක් නොව ගමේ ජනතාව ද බුදු දහම රැක ගැනිම සිය ඒකායන ප්‍රාර්ථනය කරගෙන කටයුතු කළහ. සිංහල රට බෞද්ධ රටක් විය. රටපුරා බෞද්ධ සංස්කෘතියක් ඇති විය. පන්සල කේන්ද්‍රකර ගෙන ලංකාද්විපය ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයක් බවට පත් විය.

02 පිටුවෙන්...

# සිරිලකට බොදු සුවඳ වීදූ බක් පොහොය

තවද බක් පොහෝ දිනය තුළ සිදුවූ විශේෂ සිදුවීමක් ලෙස සිද්ධාර්ථ කුමාරයට සතර පෙර නිමිති පහළ වීමද දක්විය හැකිය.

විසිනව වසක් සපිරි සිදුහත් මහ බෝසතාණන් වහන්සේ උයන් ක්‍රීඩාව සඳහා පොහෝ දින ගමන් කරද්දී පළමු කොට ජරා (මහලු) රූපය දක ඇත්තේ බක්මහ පුන් පොහෝ දිනයකය. ඊට අමතරව බුදුරජාණන් වහන්සේ ගේ කිඹුල්වත් පුරය බලා මැදින් පුන් පොහෝදා ගමන් අරඹා පිළිවෙලින් පියවි සිහියෙන් ගමනින් යොදුන් තිහක් ගමන් මාර්ගය අවසන් කිරීම සිදුවූයේ බක්මහ පුර පසළොස්වක පොහොය දිනයකය.

ඓතිහාසික වශයෙන් ලක්වැසියාට වැදගත් මෙම සිදුවීම් මාලාව තුළින් අවුරුදු දෙදහස් ගණනකට පෙර ලංකාවේ සිදුවූ ඓතිහාසික, පෞරාණික, ශාසනික පුරාවෘත්තයන් අපට සිහිපත් කරවනු ඇත. මෙබඳු ඓතිහාසික සිද්ධියකින් ශ්‍රේෂ්ඨත්වයට පත් බක් පොහොය බෞද්ධයින්ට මහත් ප්‍රීතියක් උපදවන දිනයකි. විශේෂයෙන් චූලෝදර මහෝදර නා රජුන් යුද්ධ කොට බෙදා ගැනීමට ගිය මැණික් පුටුව කැළණි චෛත්‍යයේ නිධන් කර ඇති බව වංශකතා ඇසුරින් පැහැදිලි වෙයි. ඒ අනුව බක් පොහොය තුළ ලක්වැසියාට වන්දනා මාන කිරීමට ඇති පූජනීයම වස්තුවක් ලෙස කැළණි චෛත්‍ය නම් කළ හැකිය. ලක්වැසියාට පමණක් සීමා නොවූ මළු මහත් ලෝක වැසියාගේම මුදුන් මල්කඩක් බඳු කැළණි දාගැබ ධාන්‍යාකාරයෙන් නිර්මිත උත්කෘෂ්ඨ කලා නිර්මාණයකි.

*උපන්දා සිට කරපු පව්*
*නැත වරක් වැන්දොත් කැළණියේ*

යන පාඨය පවා ව්‍යවහාරයේ පවතින්නේ ඒ තරමටම පින් උපදවන උල්පතක් හැටියට කැළණි දාගැබ තුළින් හමන බුදු දහමේ සඳහම් පණිවුඩය මිනිස් හදවතට සමීප වන බැවිනි. හෙළ කළා කරුවාගේ සුවිශේෂී නිර්මාණයක් හැටියටත් දුර්ලභ ගණයේ ස්ථූපයක් හැටියටත් කැළණි දාගැබ සුප්‍රකටය.

ලක්වැසි බැතිමතුන්ගේ මුදුන් මල්කඩක් බදු කැළණි දාගැබ වන්දනා මාන කිරීම පිණිස නොයෙක් බැතිමතුන් දිනපතා පැමිණෙනු ඇත. එයින් හමනා සදහම් සිසිල දුකට පත් සැමගේ සිත් සතන් සුවපත් කරනු ඇත. සිත් සතන් අවුල් වූ ඕනෑම කෙනෙක් කැළණි ස්ථූපය ලඟට යන්නේ නම් සිතට කියා නිම කළ නොහැකි සහනයක් දැනෙනවාට කිසිදුසැකයක් නැත.

ඓතිහාසික වශයෙන් වටිනාකමකින් යුත් මෙම සිදුවීම තුළින් අපේ පැරණි ශිෂ්ඨාචාරය, සංස්කෘතිය පිළිබඳ කරුණු අනාවරණය වේ. එවකට සිටි මෙම නාග ගෝත්‍රිකයින් මනුෂ්‍ය කොටසක් වූ අතර ඔවුන් අතර සුළු සුළු අඩුපාඩුකම් තිබුණු බවද සඳහන් වේ. ඔවුන් යුද්ධයකට අවතීර්ණ වූයේද එම හේතුවෙන් බව අපට විශ්වාස කළ හැකිය. එසේ වුවද ඔවුන් තුළ තිබුණු උසස් ගුණ ධර්ම ඉස්මතු කරදීමට බුදුරජාණන් වහන්සේට හැකිවිය. බුදුරජාණන් වහන්සේගේ ලංකාගමනය තුළින් ධර්මය ස්ථාපිත නොවන්නට ඇත්තේද එවකට ජීවත්වූ ලක්වැසියාගේ නොදියුණුකම හේතුවෙන් බව සිතිය හැකි කරුණකි.

එසේ වුවද මේ උතුම් බක් අව අමාවක් පොහෝ දිනය ලක්වැසියන් වන අප සැමදෙනාටම ඒ ඓතිහාසික සිදුවීම් සිහියට ගෙන ගුණධර්ම අතින් පෝෂිත උසස් මනුෂ්‍ය චර්යාවන්ගෙන් සැදුම් ලත් පිරිසක් වීමට පුළුවන් කමක් ඇත. ඒ උතුම් බක් පොහෝ දිනය තුළ අපි ශ්‍රේෂ්ඨ මිනිසුන් වීමට අධිෂ්ඨාන කර ගනිමු.

14 පිටුවෙන්

# සමාජයීය මිනිසා සඳහා බුදු සමය

බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මයට අනුව නුවණ වැඩීම හා හැසිරීම භික්ෂුන් වහන්සේ ගේ පූර්ණ කාලීන ක්‍රියාකාරීත්වය වන හෙයින් දහම නොදත් ගිහියාට එය සැකෙවින් පැහැදිලි කර දෙයි.

ගිහියා උගතෙකු නම් ඔහු හා ධර්මය ගැඹුරින් සාකච්ඡා කිරීමෙන් දෙදෙනාම ධර්ම සාකච්ඡාවේ ඵල ලබති. අධ්‍යාපනයේ වගකීම සංඝයා වහන්සේ සතුය. එහි ප්‍රතිඵලයක් වශයෙන් බෞද්ධ රටවල අධ්‍යාත්මික වටිනාකම් දන්නා සාක්ෂර ඥානය ඇති ජනගහණයක් දකිය හැකිය. භික්ෂුන් වහන්සේ චිත්තවේග වලින් පීඩිත ශෝකාකුල පුද්ගලයනට මිනිස් වර්ගයා එවන් අවස්ථාවනට ගොදුරු වීම ස්වභාව කොට ඇත්තවුන් බැව් වටහා දී සැනසීමට සහත් වන්නාහ.

එයට ප්‍රත්‍යුපකාර වශයෙන් සංඝයා වහන්සේ භෞතික ශුභ සාධනය ආරක්ෂා කර දීම ගිහියන්ගෙන් බලාපොරොත්තු වෙති. මක්නිසාදයත්? කෑම් බීම් ඉඳුම් හිටුම් බෙහෙත් වස්ත්‍ර සපයා ගැනීම් වස් ආදායම් ඉපයීමක් නොමැති නිසාය. සාමාන්‍ය බෞද්ධ ව්‍යවහාරයට අනුව සංඝයාගේ සුවය සඳහා කරන පරිත්‍යාග, දීමනා මහා පූණ්‍ය කර්මයෝ ය. එය උන් වහන්සේලාගේ චිත්ත පාරිශුද්ධියටත් ජනතාවගේ ආධ්‍යාත්මික අවශ්‍යතා සපුරා ගැනීමටත් එසේ කිරීම අවශ්‍ය සේ සලකනු ලැබේ.

(පොතපත ඇසුරිනි.)



සුරස අතිරේකය




# ශ්‍රී ලංකාවේ දිගම සෙල්ලිපිය ආනමඩුව "තෝනිගල සෙල්ලිපිය නොවේ"

ශ්‍රී ලංකාවේ දිගම සෙල්ලිපිය වන්නේ වවුනියාවේ තෝනිගල නම් සෙල්ලිපියයි. මෙයට අමතරව අනුරාධපුරයේ ද තෝනිගල නමින් සෙල්ලිපියක් ද ඇත. (ශ්‍රී ලංකාවේ 'තෝනිගල' නමින් සෙල්ලිපි 04 ක් පමණ දක්නට ඇත)

පුත්තලම් දිස්ත්‍රික්කයේ ආනමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි තෝනිගල සෙල්ලිපිය පිළිබඳ සත්‍ය තොරතුරු මෙසේය. මෙය ක්‍රි.පූ. 104-76 වැන්නේ ශ්‍රී ලංකාවේ රජකළ වට්ඨගාමිණී අභය හෙවත් වලගම්බා රජුන්ගේ සමයේ දී ලියවුනක් බව නියඩෝර් ජී. පෙරේරා උන්නාන්සේ විසින් රචිත 'සිංහල භාෂාව' නම් කෘතියේ සඳහන් වේ. මෙහි අක්‍ෂර වර්ග පූර්ව බ්‍රාහ්මී අක්‍ෂර ලෙස ඔහු ද පිළිගෙන ඇත. මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන් දරන්නේ ද මෙම මතයම වේ.

මෙම සෙල්ලිපි දෙකේ පරිවර්තනයන් මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන් ගේ (Inscription of ceylon volume i cearly Brahmin Inscription) පොතේ 82 පිටේ අග 1015,1052 වශයෙන් සඳහන් කොට දක්වා ඇත. අදාල සෙල්ලිපි දෙකේ පිටපත් දෙක එම කෘතියේ Plate cx1 සහ Plate cx11 යන පිටුවල දක්වා ඇත.

ඒ අනුව මෙම සෙල්ලිපිය ලංකාවේ ඇති බ්‍රාහ්මී සෙල්ලිපි අතර දිගම සෙල්ලිපිය බව කිවයුතුය. එහෙත් ලංකාවේ දිගම සෙල්ලිපිය වන්නේ වව්නියාවේ 'තෝනිගල සෙල්ලිපිය' බව ධර්මබන්ධු අමරසේකර මහතාගේ සිංහල ශිලාලිපි ලේඛන විවරණයේ 1 කාණ්ඩයේ සඳහන්වේ.

එයට අනුව උ.නැ. හා උතුරු මැද පලාත වෙන්කරන මායිමට ආසන්නව වව්නියාවේ සිට හොරොව්පතානට යන පටු පාරේ සැතපුම් හයේ කණුව අසලින් සැතපුම් භාගයක් උතුරු දෙසින් දකුණ තිලක්කුලමේ තොනිගල හෙවත් නාගරගල පිහිටා ඇත.මෙම ගල්තලාව මතද සෙල්ලිපි දෙකක් තිබේ.

අප සඳහන් කරන ලිපිය හොඳ තත්ත්වයේ පවතින අතර දෙවන සෙල්ලිපිය අසම්පූර්ණය. මෙම තෝනිගල සෙල්ලිපිය ක්‍රි.ව. තුන්වන සියවසේ දී පමණ ලියවුනකි. නැතහොත් පශ්චාත් බ්‍රාහ්මීය යුගයට අයත් වූවකි.

මෙරට සිවිල් නිළධාරියෙකුව සිටි හෙන්රි පාකර් මහතා විසින් 1886 දී ද, මහාචාර්ය ඩී.එම් ඉෂාඩ් වික්‍රමසිංහ මහතා විසින් 1892 දී ද, මෙම ලිපිය පිටපත් කරන ලද බව සඳහන්වේ. ඊට පසු එච්. සී. සී බෙල් මහතාගේ පරීක්‍ෂණ යටතේ 1894 දී නැවත පිටපත් කරන ලදී.

ඔවුන් පැවසුවේ මෙය ශ්‍රී මේඝවර්ණයේ ලිපියක් බවයි. පුරාවිද්‍යා මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන් මෙහි පෙළ කියවා 1933 දී පළ කළ ඔහුගේ ශිලා ලේඛන සංග්‍රහය 111 වෙළුමට ඇතුලත් කරන ලදී.

මෙම ලිපියේ සම්පූර්ණ පේළි 17 ක වන අතර මෙම ලිපියෙහි සමහර පේළි අඩි නවය හමාරක් අඩි හතක් දක්වා දිගය. අකුරු අඟල් තුනක් පමණ උසය. ලිපියේ පේළි 17 ක් ඇති අතර ඉන් මුල් පේළි 12 ආරක්‍ෂා වී ඇත. ඉතිරි පේළි අපැහැදිළි බවක් දක්වයි.

මෙම වව්නියාවේ ඇති තෝනිගල සෙල්ලිපි වනාහි කිතුවසට පෙර සිට හතරවන සියවස තෙක්ම මෙරට දක්නට ලැබෙන ලිපි වලින් ඉතාම දිගවූත් අනෙක් සෙල්ලිපි වල සඳහන් නොවූ අලුත් වචන රාශියක් අඩංගුවූත් ලිපියක් වෙයි. එමෙන්ම ස්වරනාම, නාම පද, අඛ්‍යාත පද රාශියක් සඳහන් වීමෙන් මේ සෙල්ලිපියේ ඇති වටිනාකම ඉතා උසස් බව සඳහන් කළ හැකිය.

**ස්වාධීන පුරාවිද්‍යා ගවේෂක**
**ඊ. එම්. සරත් ඒකනායක**

සාහිත්‍ය

## මුළු පරිසරයම හැඩ ගන්වන බක්මහ අසිරිය

මල් ගොමු ගුමු ගුමු ගන්වන්නී
මීවද වලැ පැණි පුරවන්නී
කුරුළු සරින් කන් පිනවන්නී
මුළු ලොව උයනක් කරවන්නී

ජම්බුගහට රත පුරවන්නී
බක් මීගහ කහ පොරවන්නී
අඹ දළු රත තවරන්නී
නෙත ගිය ගිය අත පනවන්නී

එරබඳු පැහැයෙන් දුලවන්නී
නාගස් සුවඳින් බැඳැලන්නී
විලේ නෙළුම් මල් පොබයන්නී
ලෝ කත විසිතුරු කරැලන්නී

*ගේය පද - අරිසෙන් අහුබුදු*
*සංගීතය තනුව - පණ්ඩිත් ඩබ්ලිව් ඩී අමරදේව*
*ගායනය - පණ්ඩිත අමරදේව ඇතුළු පිරිස*

අපරදිග ක්‍රමයට නව වසරක් ආරම්භ වන්නේ ජනවාරි පළමු වැනිදාය. එනමුත් සිංහල ක්‍රමයට නව වසර ඇරැඹෙනුයේ අප්‍රේල් හෙවත් බක් මාසයේදීය. එනම් සූර්යා මීන රාශියෙන් මේෂ රාශියට ගමන් කරන මොහොතේය.

"බක්" යනු භාග්‍යවන්ත බාවය ලෙස සැලකේ. බක් මාසය එක් අතකින් භාග්‍යවන්ත වන්නේ ගොවියාගේ අටුකොටු පිරී ඇති නිසාය. අනෙක් පසින් ගස්වැල් දළුලා මල් හට ගන්නා මුළු පරිසරයම ප්‍රබෝධමත් බවකට හැරවෙන නිසා සොබාදහමද භාග්‍යවන්ත බාවයකින් හා අමුතුම සිරියාවකින් පිරේ.

සොබා දහම පවා සුන්දරත්වයෙන් පිරී ඉතිරෙන බක් මස නව වසරක් ආරම්භ කිරීමට යොදා ගැනීම කෙතරම් උචිත ද යන්න මෙයින් වැටහෙයි.

නව වසරේ උදාව මෙයින් සනිටුහන් කරමින් පරිසරයේ ඇති වන චමත්කාරය සහෘද වන සේ මවන්නට අරිසෙන් අහුබුදුගේ ගේය පද රචනයත් අමරදේවයන්ගේ සංගීතය, තනුව හා ගායනයත් සමත් වී තිබේ.

අරිසෙන් අහුබුදුගේ "මඟුල් ගීය" නම් පැදිපෙළෙහි මුල් පැදි තුන මේ ගීය සඳහා යොදා ගනිති. අහුබුදු ගේ මගුල් ගීය පද්‍යාවලිය තුළම කියැවෙන්නේ අවුරුදු අසිරියයි. ගීතයට යොදාගත් මුල් පැදි තුනෙහි නව වසරේ පරිසරයේ සුන්දරත්වය අපූර්ව ලෙස වර්ණනා කෙරේ.

ජම්බු ගසේ පල හටගෙන රත්පැහැ ගෙන ඇත. නමුත් යම් කෙනෙකු ජම්බු ගසට රත් පැහැය ඇත,

බක් මී ගහට කහ අන්දවා පරිසරයම ප්‍රබෝධමත් බවකට හැරවෙන නිසා සොබාදහමද භාග්‍යවන්ත බාවයකින් හා අමුතුම සිරියාවකින් පිරේ.සොබා දහම පවා සුන්දරත්වයෙන් පිරී ඉතිරෙන බක් මස නව වසරක් ආරම්භ කිරීමට යොදා ගැනීම කෙතරම් උචිත ද යන්න මෙයින් වැටහෙයි.නව වසරේ උදාව මෙයින් සනිටුහන් කරමින් පරිසරයේ ඇති වන චමත්කාරය සහෘද වන සේ මවන්නට අරිසෙන් අහුබුදුගේ ගේය පද රචනයත් අමරදේවයන්ගේ සංගීතය, තනුව හා ගායනයත් සමත් වී තිබේ. අරිසෙන් අහුබුදුගේ "මඟුල් ගීය" නම් පැදිපෙළෙහි මුල් පැදි තුන මේ ගීය සඳහා යොදා ගනිති.

අහුබුදු ගේ මගුල් ගීය පද්‍යාවලිය තුළම කියැවෙන්නේ අවුරුදු අසිරියයි. ගීතයට යොදාගත් මුල් පැදි තුනෙහි නව වසරේ පරිසරයේ සුන්දරත්වය අපූර්ව ලෙස වර්ණනා කෙරේ. ජම්බු ගසේ පල හටගෙන රත්පැහැ ගෙන ඇත. නමුත් යම් කෙනෙකු ජම්බු ගසට රත් පැහැය ඇත, බක් මී ගහට කහ අන්දවා ඇත, විලේ නෙළුම් මල් පුබුදුවා ඇත. මේ සියළු දෑ වසත් සමයත් සමඟින් ඉබේ සිදුවන දෑය. එනමුත් පද රචකයා කියන්නේ බක් මහ මඟුලට සූදානම් වීම පිණිස මුළු පරිසරයම සූර්යා හෝ වෙනත් කෙනෙකු විසින් සරසවන බවයි. මුළු ලොවම විසිතුරු කරවන බවයි.

මෙලෙසින් මුළු පරිසරයම ලක ලැහැස්තී වන්නේ කුමක් සඳහාද? බක් මහ මංගල්‍ය සඳහාය. මී මැස්සන් මී වද වල පැණි පුරවමින් කුරුල්ලන් කුරුලු සරින් කන් පිනවමින් මල් ගොමු වල මල් පුබුදමින් මුළු පරිසරයම සරසන්නේ බක් මහ මංගල්‍ය වෙනුවෙනි.

ජම්බු ගහට රත් පැහැ ගන්වමින්, බක්මීගහ කහ පැහැ ගන්වමින්, අඹ දළු ලාරත කරමින්, එරබදු මල් පුබුදමින්, විසිතුරු කරවන්නේ බක් මහ මඟුලට සැරසීම සඳහා බව කියන්නටය. අහුබුදු සූරීන් උත්සාහ කරන්නේ එමෙන්ම මල් පල හට ගැනීම, මී වද වල පැණි පිරීම සශ්‍රීක බවෙහි ලකුණු බව පෙන්වීමටයි.

ගන්වන්නී, පුරවන්නී, කරවන්නී යන වචන තුළ ඉක්මන්කාරී බවක් පෙන්වයි. මෙයින් බක් මහ මඟුලට අවට පරිසරය වහ වහා සූදානම් වන බවක් අපට හැඟේ.

අහුබුදු සූරීන්ගේ බසත්, අමරදේවයන්ගේ ස්වර රචනය හා මදුර හඬ මුසුවත් නිසා මී මැසි ගුමු ගුමුවත් කුරුළු ගී ස්වරයත් අපේ දෙසවනට ඇසෙන්නට පටන් ගනී. වසන්තයේ මලින් පිරී ගිය ප්‍රබෝධවත් වූ පරිසරය සහෘද නෙත් ඉදිරියේ සජීවී රූපාවලියක් බවට පත් වේ.

බක්මහ මඟුලේ සැබෑ අසිරිය විදින්නට නම් කලබලකාරී කොන්ක්‍රීට් පුරවරයෙන් නික්මී සැබෑ පරිසර සෞන්දර්යෙන් හෙබි නිසංසල ගම්මානයකට යා යුතුයි.
වර්තමානයේ මේ ගිය ඇසෙද්දී සහෘද හදට දැනෙන්නේ බක් මහ අසිරිය විදින්නට වසන්ත සමයේ සැබෑ සොඳුරු බව හා මුසු වන්නට වහ වහා ගම්මානයකට පා නගන්නටය.

**චාමිකා ජනානි ද සිල්වා**

# අපේ රටේ දේව පුරාණය



බහුතරයක් පිලිපදින බෞද්ධාගම හැරුණ කොට හින්දු ආගම, ඉස්ලාම් හා ක්‍රිස්තු ධර්මය ද මෙහි පවතින ප්‍රධාන ආගම් වෙති. ඉස්ලාම්, හින්දු හා ක්‍රිස්තියානි ධර්මයන් දේවවාය මත පදනම් වූ ඒවා වන අතර දිවයිනේ බහුතරයක් ජනයා අදහනු ලබන බුද්ධ ධර්මය වැඩී ආවේද වේද, බ්‍රාහ්මණ, ආරණ්‍යයක හා උපනිෂද් යන ප්‍රාග් බෞද්ධ භාරතීය දර්ශනවාද සංහතියේ අග්‍රඵලයක් ලෙසිනි.

දෙවියන් විසින් ලෝකය මවා පාලනය කරතැයි යන දේවවාදය (නිර්මාණවාදය) හා මරණින් මතු නැවත හට ගැනීමක් නැතැයි කී උච්ඡේදවාදය යන ප්‍රධාන මත දෙක ඇතුලු දෙසැටක් පමණ වූ මිත්‍යාදුෂ්ඨික ඇඳහිලි හා විශ්වාසයන් තර්කානුකූලව බැහැර කළ බුදුන් වහන්සේ හේතුඵලවාදය නමින් තම ශ්‍රේෂ්ඨ සොයා ගැනීම නම් කරමින් ලෞකික හා ලෝකෝත්තර විමුක්තිය මනුෂ්‍යයා තුළින් ළඟා කර ගත යුතු අයුරු ඉගැන්වෙන මා හැඟි චතුරාර්ය සත්‍යය ලොවට පෙන්වා දුන්හ.

හින්දු ක්‍රිස්තියානු හා ඉස්ලාම් භක්තිකයෝ බොහෝ දුරට තම ආගම මඟින් පෙන්වා දෙන දේවවාදී විශ්වාසයන් කෙරෙහ පමණක් බැඳීසිටිති. ඉතා පැහැදිලිව දේවවාදය ප්‍රතික්ෂේප කළ බුදු දහම අදහන ලාංකීය බෞද්ධයන්ගෙන් 90% පමණම සෘජුව හෝ වක්‍රව උග්‍ර දේව ඇඳහිලි වලද එල්බ සිටිති. යාග හෝම තොවිල් හදි හූණියම් කොඩිවිණ ද සිදු කරති. මේ සියලු කටයුතු උදෙසා ලක්දිව පුරා ජනයා ලංකාව භාර දෙවියා ලෙස සැළකෙන ගම්කොරටුවක්ම භාර වූ ගම්බාර දෙවිවරුන් දහස් ගණනක් දක්වා ක්‍රමානුකූලව සංවිධාන ගතව සිටින්නාහ.

උදා වූ 21 වන ශතවර්ෂය කරාද නොනැසී ගලාඑන එකී දේව සංකල්පයේ හා දේවවාදයේ ඓතිහාසික පුරාවෘත්තයන් රැස අප සංස්කෘතියේ ද සැඟවුණු පරිච්ඡේදයක් වැනිය.

මනුෂ්‍යයා දේව, යක්ෂ හා ප්‍රේත යන කොට්ඨාශ සමඟ පවත්වන අන්‍යෝන්‍ය සබඳතා අතර පුළුල් හා ගැඹුරු ශාස්ත්‍රී මූලධර්මයන් රැසක් පවතී. ගැමි ආගම් ලෙසින් අපර දිග චින්තකයෝ මෙකී ඇඳහිලි හා විශ්වාස අර්ථ ගැන්වුත් අතිමානුෂික බලවේගයක් කෙරෙහි පවත්වන පුද පූජා වත් පිළිවෙත් හා එහිදී පැවැත්විය යුතු ආකාරයන් ද පුදුම එළවන සුළුය.

එවැනි බලවේගයන්ගෙන් මිනිසා අපේක්ෂා කරන්නාවූ යහපත් සහ අයහපත් ප්‍රතිඵලයන් කරා එළිඹිය යුතු මාර්ගයන්ද උග්‍ර දේවවාදී චාරිත්‍ර ධර්මයන්ගෙන් සමන්විතය.

විමුක්තිය සොයා චිත්ත ගවේශනයෙහි යෙදුණු අතීත දර්ශනවාදීහු එහි උසස්ම තත්වය වූ සෘෂිවරුන් බවට පත්වූහ. මුනි හා බාබා යන තත්ත්වයන් පසු කිරීමෙන් පමණක් ලැබිය හැක සෘෂිවරුන් වීමෙන් විශ්ව ඥාණය ළඟා කරගත හැකි යැයි සැලකේ. පෙරදිග වෛද්‍ය ශාස්ත්‍රය, ජ්‍යොතිෂ්‍යය, ගණන් සාස්ත්‍රය, සහ ගුප්ත විද්‍යාවත් මිනිසා ශ්‍රේෂ්ඨත්වයට පත් කරවන දර්ශනවාදයනුත් එවැනි සෘෂිවරුන් විසින් ලෝකයටම තිළිණ කළ උසස්තම දායාදයන් අතරින් කීපයකි.

ශාස්ත්‍ර ගණයේ අගතැන්පත් සෘෂිවරුන් අතර ප්‍රමුඛස්ථානයක් ලක්දිව විසූ සෘෂිවරුන්ට ද හිමිව තිබීම නිසි මේ කථා පුවත ලක්දිව අපට ද ඉතා වැදගත්ය. වසර 5000 කට පමණ පෙර ලක්දිව පාලනය කළා යැයි සැලකෙන රාක්ෂ ගෝත්‍රියේ පුලස්ති...... සහ රාවණ රාම සීතා කතාවෙන් කියවෙන ලංකාධීක්ෂර රාවණ එකල දඹදිවෙහි පවා රාජ්‍ය නවයක රාජාධිපති වු නිසා දසිස් යැයි නම් ලබා ඇත. ජ්‍යෙතිෂ්‍ය හා .... පත්‍රත් කෙළ .... රාවණා වෛද්‍ය ග්‍රන්ථ බිහිකර ඇති අතර ඒවා අද පවා හිමාලයේ අති ගුප්ත ස්ථානවල පිහිටි ආරාමවල පවතින බව බටහිර ලේඛකයෝ ලොවට එළිදරව් කර ඇත.

මේ සියලු දෑ මිත්‍යාවන් යැයි සළකා එක හෙලා ප්‍රතික්ෂේප කරන්නෝ බහුලය. ඉන්ද්‍රිය ගෝචර විද්‍යා සංකල්පයන්ගෙන් පමණක් ලෝකය දකින්නේ ඒ අතර ප්‍රමුඛය කෙසේ වෙතත් 21 වන ශතවර්ෂය කරාද පෙර කී ශාස්ත්‍රයෝ පැමිණ ඇති බව ප්‍රතික්ෂේප කිරීමට ඒ කිසිවෙකට නොහැකිය. මෙකී ක්ෂේත්‍රය ගවේෂණය කළ යුත්තේ ද එහෙයින්මය.

ලක්දිව දේව සංකල්පයේ සම්භවය විකාශනය හා එහි ව්‍යුපහය පිළිබඳව සොයා බැලීමේදී කරුණු දෙකක් මුල් තන්හිලා සැලකිය යුතුවේ. එකී ශාස්ත්‍රයෝ මේ දක්වා රැකගෙන ආ මිනිසුනට ගරු කිරීම ඉන් එකකි. අද ලොවට එමගින් ලැබිය හැකි සේවාවක් හෝ වටිනාකම් ගවේෂණයෙහිලා ඉදිරි පරපුර අවධිකරලීම අනෙක් කරුණයි.

### භාරතීය දේව සංකල්පයේ වැඩීයාම

ක්‍රි.පූ. 2500-1500 ත් අතර කාලයේදී ආර්යයෝ ඉන්දියාවට ඇතුළු වූහ. ස්වභාව වස්තූන් බලවේග ලෙස සැලකූ ඔවුන්ගේ ඇදහීම වෛදික ආගමයි. ක්‍රි. පූ. 3000 දී පමණ දියුණුව පැවති මොහොන්දජාරෝ - හරප්පා ශිෂ්ඨාචාරයන්හි වැසියෝ ශිව නමැති දෙවියා වන්දනය කළ බවට සාධක හමු තිබේ. මේ ජන කණ්ඩායම දෙකේ සම්මිශ්‍රණයෙන් වසර දහස් ගණනක් පුරා ක්‍රමයෙන් ගොඩනැංවී විනාශය වී තහවුරු වුනු හින්දු ධර්මය ඉන්දුවරු හෙවත් හිංදුන්ගේ ප්‍රබලතම ඇදහීම විය. ශාස්තෘවරයෙකු ගැන නිත්‍ය සාධක නැති හිංදු ආගමේ දෙවිවරු රාශියක් ද සිටිතැයි සැලකේ. කෙසේ වුවද ඉපැරණි ...... නම් වු දෙවියෙකුට පළමුවෙන්ම වන්දනා මාන කළ බවද මතයක් පවති.

වේදික ආගම සත්‍ය ගවේශීන්ගේ මෙහෙයවීම යටතේ ක්‍රමයෙන් උසස් තලයකට පැමිණි අතරම ඉපැරණි ඒක දේවවාදී සංකල්ප මුල් කරගනිමින් හිංදු ධර්මය ද සමාජ්ත වනු පෙනේ. වෛදික ආගමෙ යාග හෝම ද ආගමික කටයුතු සිදුකළ බ්‍රාහ්මණයෝ එක් පසකින් ඉදිරියට පැමිණි අතර අනෙක් පසින් ඒක දේව වාදයම පිළිගත් හිංදුහු ශෛව හා වෛෂ්ණව යනුවෙන් නිකාය දෙකක් යටතේ සංවිධානය වෙමින් ඉන්දියාවෙ අනෙක් පෙදෙස්වල ඇදහිලි හා විශ්වාසයන් අතරින් ප්‍රමුඛයෝ වූහ.

මේඅනුව හිංදු දේව සමාගම ත්‍රී මූර්තියකින් යුක්ත විණි. ඔව්හු බ්‍රහ්ම, විශ්ණු හා ශිව ශෛව හා වෛෂ්‍ය යන හිංදු නිකාය දෙකේ ප්‍රමුඛ දෙවිවරුතන් දෙදෙනා ලෙස ශිව හා විශ්ණු ද ඒ හැර බ්‍රහ්මද ඉන්දියාවේ ප්‍රදේශාධිපත්‍යයට පත්වන්නේ එලෙසය. එකී භක්තිකයන් වැඩිම ප්‍රදේ ඔස්සේ ඔවුනගේ ප්‍රදේශය තීර්ණය වී තිබෙනු පෙනේ..

### ලක්දිව දේව සංකල්පයේ වැඩියාව

ප්‍රාග් බෞද්ධ දැලක (බ්‍රහ්මජාල) පැටලී සිටියේ කවර ලෙසින්ද එය පරදන තරමේ ඇඳහිලි හා විශ්වාස රැසක ලංකාසීහු ද පූර්ව බෞද්ධ යුගයේ ඇලී ගැලී සිට ඇත. මහාවංශයෙ එය කියාපානුයේ නානා පාසාණ්ඩයෝද බොහෝ ශ්‍රමණයෝද...... පන්සියයක් මිත්‍යා දෘෂ්ඨි කුලයේ ද විසූහයි...යන ලෙසිනි.

මහා බ්‍රාහ්මණ මැවුම්කරුවා ලෙසින් සැලකූ බ්‍රාහ්මණ ඇදහීම ලක්දිව ප්‍රචලිත වීමට බලපාන ප්‍රමුඛ හේතුව විජයාගමනයයි. ඉන්පසුව ඔහුගේ අගබිසව ලෙස ගෙන්වූ විජැයි කුමරියත්, පඩුවස්දෙව් කුමරා හා ඇයට සරණපාවා දුන් බද්ධකච්චායනා නමැති ශාක්‍ය වංශික කුමරිය ඇතුලු පිරිසත් ඉන් අනතුරුව වරනි 'වර ලක්දිවට ගොඩ බට ආර්ය පිරිස්, ද්‍රවිඩයින් හා අනෙකුත් ජන කන්ඩායම් ද ඔවුන්ගේ ඇදහිලි හා විශ්වාසයන් ද සමඟම පැලපදියම් වූහ.

බුදුන්ගේ ප්‍රථම ලංකා ගමනය සිදු වූ මහියංගනයේද සුමන සමන් දෙවිදු ප්‍රමුඛ ශ්වෙ සමූහයා ධර්ම ශ්‍රවණය කළ පුවත ලක්දිව ප්‍රාග් බෞද්ධ දේව විශ්වාසය තහවුරු කරන්නකි. මහියංගනය දාගැබේ ගර්භයේ ඇති වි.ම. ස.යන දෙවිවරුන් බුදුන් වදින අයුරු විදහා දැක්වෙන සිතුවමින් ද ඒ බව තහවුරු වේ.

සුමන සමන් දෙවිදු හැරුණු විට උපුල්වන් සහ කතරගම දෙවියාද පූර්ව බුද්ධ යුගයේ සිටම ලක්දිව සිටි අය වෙති. මහින්දාගමනයෙන් පසු ව බෞද්ධ දෙවිවරුන් ලෙස මොවුහු ජනාදරට පත්විය. ඒ අනුව බුදු සසුනේ ආරක්ෂාව ද ඔවුනට පැවැරී ඇති බව ඔවුන් උදෙසා ඇති ..... කවිවල සඳහන්ය.

දෙවන පෑතිස් රජ සමයේද ව්‍යාධනම් වූ දඩයමට අධිපති දෙවියකු ගැනත් කම්මාර නම් වූ දෙවියකුට රජු නිවහන් තනා දුන් බවත් කියැවේ.

ලක්දිව දේව ඇඳහිල්ල වඩාත් සංවිධානගතව පැතිර යන්නේ ඉන්දීය ජන සම්භවය හා සමගිනි. ඉන්දියාවේ විශ්ණු දෙවියෝ ඇඳහුවෝ ලංකාද්වීපයේ බහුලව පැතිර යාමත් සමඟම ලංකාවේ ප්‍රධානත්වය ද විශ්ණු දෙවියන්ට භාර වීම මෙහිලා සිදුවන අතිශය වැදගත් සංසිද්ධියකි.

ලංකීය විද්වතුන් පෙන්වා දෙන අන්දමට ක්‍රමයෙන් වැඩි ආ ලක්දිව දෙවි දේවතා ඇඳහිල්ල 12 වන හා 13 සියවස් වලදී වාඩා උච්ච තත්ත්වයකට පත්වේ.

දකුණු ඉන්දීය ජනකණ්ඩායම් හා මලය දේශයෙන් පැමිණි දේවභක්තිකයින් ලංකාව තුළ බහුල වීම ඊට ප්‍රධාන හේතුවයි. ඔවුහු ඔවුන්ගේ දෙවිවරුන් සහ ලක්දිව එවකට ප්‍රචලිතව සිටි දෙවිවරුන් ද ඇසුරු කොට නව දේව සංස්කෘතියක් ස්ථාපිත කළහ. ගම්පොල යුගය වන විට මෙම තත්ත්වය වඩා හොඳින් තහවුරු වී ඉන්දියානු ත්‍රිමූර්තිය අනුව යමින් ලක්දිව ද කලාප තුනකට බෙදා ඒ අනුව දෙවිවරුන්ද පත් කර ගැනෙති. මේ අනුව, වන්නි, රුහුණු සහ බටහිර යන ප්‍රදේශත්‍රය පිළිවෙලින් අයියනායක, කතරගම සහ විභීෂණ දෙවිවරුන්ට කැප කොට පුදසත්කාර කළ බව පෙනීයයි.

**වසන්ත දිසානායක**

## සක් දෙවිඳු ද ආත්මාර්ථකාමීව කටයුතු කර ඇත

එසේ හඳුන්වනු ලබන ශක්‍ර දෙවියෝ වශයෙන් බෞද්ධ සාහිත්‍යයේ ජාතකපොතේ කථාවස්තු අතර ප්‍රබලව පෙනෙන දේව චරිතයකි. වර්තමානයේ කෙසේ වෙතත් එකල පුණ්‍ය වන්තයින්ට දුකක් කරදරයක් පැමිණි විට හුණුවන 'පාණ්ඩුකම්බල ශෛලාසනයේ' වාඩි වී සිටින ශක්‍ර දෙවියන්ට බුද්ධ පරිනිර්මානයෙන් පසු බුද්ධශාසනය ආරක්‍ෂා කිරීමට පැවැරූ බවත් ඉන් පසු ශක්‍ර දෙවියන් විසින් 'විෂ්ණු' දෙවියන්ට එම වගකීම පැවරූබවත් බෞද්ධ සාහිත්‍ය හා ජනකතා සාහිත්‍ය තොරතුරු වලින් භාවිතයේ පවතී. ඇතැම් විට හින්දු පුරාවෘත්ත වල ද, සම්බන්ධකම් පවතික ශක්‍ර දෙවියෝ 'සුර' 'අසුර' යන දේව කොට්ටාශයේ සුරයන්ට ගුරුව සිටි. මේ නිසා 'සුරගුරු' නමින් ද ශක්‍ර දෙවියෝ හඳුන්වනු ලැබේ.

දිව්‍ය ලෝකවල පවතින ශුද්ධ වස්තු රාශියකි. ඒ වස්තු පහල වූයේ 'අමුර්තය' සෙවීම සඳහා කිරි මුහුදට මහා මේරු පර්වතය දමා මතගාමී සුර හා අසුර යන දේව කොට්ටාශ විසින් කිරි මුහුද කැළඹීමෙන් අනතුරුවය. මෙම වහා මේරු පර්වතය වටා දරනලා සිටි 'අනන්ත' නම් නාග රාජයාගේ වලිගය හා පෙන ගොබය සුර, අසුර දෙපිරිස විසින් දෙපසට අදිමින් මෙම මත ගෑව සිදුකර ඇත. කිරි මුහුද හා මහාමේරු පර්වතය කුමක්දැයි නිශ්චිතව හඳුනාගත නොහැකි වුවද මේ කැළඹීම නිසා ශුද්ධ වස්තු 14 ක් පහල වී ඇත. අමුර්තය ද ඉන් එකකි. එම වස්තු නම්,

**1. පරසතු රුක**
**2.ඓරාවන ඇතා**
**3.රම්භාදි දිව්‍යස්ත්‍රීහු**
**4.සප්තමුඛ අශ්වයෙක්**
**5.චන්ද්‍රයා**
**6.ධන්වන්තරි**
**7.කාමධේනු**
**8.සිරිකත**
**9.කෞසතුභ මාණික්‍ය**
**10.දුන්නක්**
**11.අමුර්තය**
**12.හක්ගෙඩියක්**
**13.කාලකැටනම් විෂ**
**14.සුරා**

ශක්‍රදෙවියෝ විසින් මෙහි අංක 1,2,3,4,5,6,7 සහ 12 යනුවෙන් හඳුන්වනු ලබන ශුද්ධ වස්තු තමා සතු කරගත්තේ තමන්ගේ සහෝදර ශ්‍රී ලංකා බුද්ධ සාසනය භාර කරන ලද විෂණු දෙවියන්ට සිරි කත, කෞසතුභ මාණික්‍ය, දුන්න හා හක්ගෙඩිය භාර දෙන ලදී. අවසානයේ ඉතිරි වූ කාලකැට විෂ හා සුරා අසුරයන්ට දෙන ලදී. මේ අනුව ශක්‍ර දෙවියෝ මෙම ආත්මාර්ථකාමීව කටයුතු කර ඇති බව පෙනේ. මේ ආකාරයෙන් කටයුතු කරන ශක්‍ර දෙවියන්ට අනුන්ගේ දුක් ගැන විල්ලක් ගැන සාධාරණව කටයුතු කිරීමට සිතක් පහල වන්නේ කෙසේදැයි විමතියකි. තමාගේම පංතියේ දේවිදේවතාවුන්ට ද කෙණෙහිලි කම් කරන උන්වහන්සේගේ ආසනය වන 'ගල් අසුන' උණු වන්නේ කෙසේද? ගල් අසුනක් උණු වීමට නම් කෙතරම් උෂ්ණත්ව පීඩනයක් අවශ්‍ය වේද? ඇතැම් විට මේ ආසනය කිසිකෙනෙකුට හිමිවන්නට නැතිව ඇති. ශක්‍ර දෙවියන්ගේ චරිතයේ බොහෝ අවස්ථාවල දක්නට ලැබෙන ක්‍රියා කාරකම් විමසා බැලීමේ දී හුදෙක් ආත්මාර්ථය සඳහා තම කටයුතු සිදු කොට ඇති බව පෙනේ. හුදෙක්ම සාමාන්‍ය පෘතජ්ජන මිනිසුන්ගේ ක්‍රියාකාරකම් හා සමාන බවක් ද පෙනේ.

**යූ. බී දිසානායක - කැකිරාව**

හෙළ විරුණ

## බොදු පුනරුදයේ මාහිමිපාණෝ

# මොහොට්ටිවත්තේ ගුණානන්ද



වසර දෙදහසකටත් අධික වූ දීර්ඝ ඉතිහාසයක් තුළ කිසිදු විදේශීය බලපෑමකට යටත් නොවූ අභීත හෙළ රජ දහන ඇතැම් අවස්ථාවේදී පරගැති හෙළයින්ගේ පාවාදීම් නිසා අපට අහිමි වී ගියේය. 1815 දී මුළුමනින්ම අප රට බ්‍රිතාන්‍ය පාලනයට නතු වූයේ අපේම ඇතැම් පරගැති සිංහලයින් විසින් කළ අනුවණකම් නිසා වෙනි. බලතණ්හාවෙන් ඔවුනොවුන්ට කේලාම් කියා ගනිමින් සිංහලයේ රජුට විරුද්ධව කළ කුමන්ත්‍රණයකාරී ක්‍රියාවන් නිසා අපට අපේ රජ කිරුළ අහිමි වුණි.

බල කාමයෙන් පෙළුණු ඉංග්‍රීසිහු උඩරට ගිවිසුමේ සියලු කොන්දේසි කඩ කරමින් ඔවුන්ගේ ම්ලේච්ඡ පාලනය රට පුරාම පැතිර වූහ.

ඉංග්‍රීසින්ගේ කෲර වූ පාලනයන් නිසා ලාංක්‍ය ජාතික උරුමයන් යටපත් වී දේශීය සංස්කෘතියේ ව්‍යසනය ළඟා වූයේ සිංහලයාට නොදැනුවත්මය. වරින් වර මෙරටට කඩා වැටුණු මිෂනාරි බලපෑම් හේතුකොට ගෙන සිංහල බෞද්ධයෝ අන්ත අසරණ තත්වයකට පත් වූහ. ගිහි පැවිදි සම්බන්ධතාවයන් බිඳ වට්ටවන බෞද්ධ සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය විනාශ කරවන කතෝලිකයන් බවට පත් වුණු සිංහල ප්‍රභූ පිරිස් ලවා සාමාන්‍ය බෞද්ධ ජනතාව භික්ෂූන් වහන්සේලාව පීඩාවට පත් කරවන අඳුරු අවිචාරවත් ලාංකීය සමාජයක් බිහිවෙමින් පැවති යුගයකයි මොහොට්ටිවත්තේ ශ්‍රී ගුණානන්ද හිමියන් පහළ වූයේ.

නව බෞද්ධ පුනර්ජීවයේ නියමුවාණන් හැටියට සැලකෙන මොහොට්ටිවත්තේ ශ්‍රී ගුණානන්ද හිමියන්ගේ උපන් ගම වූයේ බලපිටියේ මොහොට්ටිවත්ත නම් ග්‍රාමයයි. 1823 පෙබරවාරි මස 9 වැනි දින උපත ලැබූ උන් වහන්සේගේ ගිහි නම මිගෙල් මැන්දිස් විය. ළමා වියේ සිටම විහාරස්ථානය ඇසුරෙහි හැදුණ වැඩුණ මේ කුඩා දරුවා පූජ්‍ය බලපිටියේ ගුණරතන හිමියන්ගෙන් වැඩිදුර අධ්‍යාපනය ලබා ගැනීමෙන් අනතුරුව එම හිමියන්ගේ ආචාර්යත්වයෙන් වයස අවුරුදු දොළහේදී පැවිදි බවට පත් විය.

ධර්ම ශාස්ත්‍රීය කටයුතු ඉතා පැහැදිලිව දැඩි කැපවීමකින් කරගෙන ගිය ගුණානන්ද සාමනේරයන් වහන්සේට එය එතරම් දුරට පවත්වාගෙන යාමට අවකාශ නොලැබුණි. මන්ද උන් වහන්සේගේ ගුරු පියාණන් වූ පූජ්‍ය බලපිටියේ ගුණරතන හිමියන්ගේ අපවත් වීම නිසායි. තවද එම කාල වකවානුවේදීම ගුණානන්ද සාමනේර හිමිගේ පියාණන්ද අභාවප්‍රාප්ත විය. මෙයින් බලවත් ලෙස කලකිරී සිටි උන් වහන්සේට තම මෑණියන් රෝගීව සිටින බැව් දැනගන්නට ලැබුණෙන් මෑණියන්ට ඇප උපස්ථාන කිරීම සඳහා උන් වහන්සේ සිවුරු හැර ගිහිව සිය මෑණියන් සමීපයට ගියහ.

සිවුරු හැර ආ මැන්දිස් නම් මේ තරුණයාට අධ්‍යාපනය සම්පූර්ණ කර ගැනිමට අවැසි විය. ඔහුගේ භාග්‍යයකට දෝ අපූරු පුද්ගලයෙක් ඔහුට හමුවිණ. ඒ බලපිටියේ විසූ මහ මුදලි වරයකු වූ "ඒබ්‍රහම් අල්විස්" මහතායි. කොළඹ වෙස්ලි විදුහලට ඇතුළත් වීමේ වරම් ඔහුට ලැබුණේ මුදලිවරයාගේ කාරුණික මැදිහත් වීම නිසාමය. මෙහිදී ඉංග්‍රීසි භාෂාව සමඟින් කිතුණු දහම ද උගෙනීමට ඔහුට අවස්ථාව ලැබිණි. මේ අතරම බයිබලය ද ඉතා හොඳින් ප්‍රගුණ කළේය.

මේ කාලයේදී ම මැන්දිස් තරුණයාට "ඔබ්සර්වර්" පත්‍ර කාර්යාලයේ රැකියාවට ද යාමේ වාසනාව ලැබුණේ නිතැතින්මය. තම ආදරණීය මව් තුමියගේ අභාවය සිදු වුණෙන් යළිත් ඔහුගේ ජීවිතය කළ කිරීමේ සොබාවයට පත් වූයේ අන්ත අසරණ වූවෙකු ලෙසිනි. සිය නිවසද අතහැර දමා රැකියාවට ද ආයුබෝවන් කී හෙතෙම ස්නිගමට ගියේය. එහිදි දොඩන්දූව කුමාර විහාරයේ ඇසුර ලැබීම නිසා යළිත් මහණ දම් පිරීමට සිත් ඇතිවිණ. මැන්දිස් තරුණයා යළි පැවිදි බිමට පිවිසි අයුරු ඉතා රසවත් සිද්ධියකි.

දිනක් මෙම විහාරයේදි බණ කීමට භික්ෂුවක නොසිටියෙන් මැන්දිස් තරුණයා එවේලේම හිස මුඩු කොට මහණ වී මංගල සූත්‍රයෙන් මුලු රැයක් පුරා විචිත්‍ර ධර්ම දේශනයක් පැවැත් වූ බව පැවසේ.

මැන්දිස් තරුණයා කළ එම තැනට සුදුසු ක්‍රියාව කාගේත් පැසසුමට සහ ආනන්දයට ලක්විය. මේ හදිසි මහණකම යළිත් ස්වකීය කීර්ති නාමය ලක්දිව පුරාම පතුරවාලීමට අඩිතාලමක් වූ බව කිව යුතුය. එදා උන් වහන්සේ කළ එම විචිත්‍රවත් ධර්ම දේශනාවේදී ඊට සවන් දුන් සැමගේම ආදර ගෞරවයට පාත්‍ර වූ බව සඳහන් වේ. උන් වහන්සේ මෙහිදී යළි පැවිදි දිවියට පත් වූයේ එදා මෙම දොඩන්දූව කුමාර විහාරස්ථානයේ විහාරාධිපතිව වැඩ විසූ පූජ්‍ය තලෙකඩ ස්වාමීන් වහන්සේ වෙතිනි.

ක්‍රිස්තියානි ආගමේ බලපෑම් හේතුකොට ගෙන මෙරට බුදු දහමට මහත් කරදරයක්ව පැවති කාලයකයි ගුණානන්ද හිමියෝ පැවිදි වූයේ. තම මුළු ජීවිතයම උන් වහස්සේ කැප කළේ බුදු දහමේ පැවැත්ම උදෙසාය. මංසංධිස්ථාන වල තිබූ බෝධීන් වහන්සේලා කපා ඉවත් කිරීමට මෙකල නියම කොට තිබුණි. ගුණානන්ද හිමියෝ නිර්භයවම ඊට විරුද්ධව පෙරමුණ ගති. ශ්‍රී බෝධි රාජ සමිතිය නමින් සමිතියක් පිහිටුවා ගනිමින් තවත් පිරිසද එකතුකර ගත් උන් වහන්සේ තව තවත් බෝධීන් වහන්සේලා රෝපණය කිරීමට පටන් ගනිති.

පිට කොටුවේ මංසන්ධියෙහි තිබෙන බෝධීන් වහන්සේ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ උත්සාහයේ ප්‍රතිඵලයකි. මේ නිසා එදා උන් වහන්සේ වටා රොක් වූ පිරිස් ද බොහෝය. මෙකල ක්‍රිස්තියානි පූජක වරුන් බුදු දහමට නිගා කරමින් කෙරුණු ප්‍රකාශ ඇතුළත් පත්‍රිකා මුද්‍රණය කොට රට පුරාම බෙදාහරින්නට වූයෙන් ඊට එරෙහිව බෞද්ධ ධර්ම පත්‍රිකා හා පිළිතුරු පත්‍රිකා මුද්‍රණය කොට බෙදා හැරීමට උන් වහන්සේ නොබියවම කටයුතු කරන ලදි. ඒ සඳහා සියම් මහ රජ තුමාගෙන් උපකාරයෙන් යුතුව බුලත්ගම ධම්මාලංකාර මා හිමියන් වහන්සේ විසින් ගාල්ලේ "ලංකෝපකාර මුද්‍රණාලය" ආරම්භ කරන ලදි.

ගුණානන්ද හිමියන් සිදුකළ අතර "පංච මහා වාදය" මහත් සමාජ පෙරලියක්ට තුඩුදුනි. කිතුනුවෝ බොදු මා හිමිවරුන් සමඟින් වාද භූමියට අවතීර්ණ වූ විටදී ඊට ප්‍රතිවාදීව ක්‍රියාකළෝ වන්නේ හික්කඩුවේ ශ්‍රී සුමංගල මා හිමි, බුලත්ගම ධම්මාලංකාර ගුණානන්ද මා හිමි යන හිමිවරුන්ය. එමෙන්ම වාද වලදී පෙරමුණ ගත්තේ ගුණානන්ද හිමිපාණෝය.

ගුණානන්ද හිමිපාණන් ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද "පංචමහා වාදය"මහත් සමාජ පෙරළියක් සඳහා තුඩු දුන්නකි. ඒ වාද පඤ්චකය ලෙස සඳහන් වනුයේ, වරාගොඩ වාදය (1865 දී) උදම්විට වාදය (1866), ගම්පොළවාදය (1871), බද්දේගම වාදය (1871) සහ පානදුර වාදය (1873) යනුවෙනි.

එකල "පානදුර වාදය" සම්පූර්ණයෙන්ම පුවත් පත් වල පලවීය. ඇඩ්වඩ් පෙරේරා නම් නීතිඥමහතෙකු විසින් එය ඉංග්‍රීසියට පරිවර්තනය කිරීමෙන් අනතුරුව එය මුද්‍රණය කොට බෙදා හැර තිබේ. ඇමෙරිකානු ජාතික පීබල් මහතා මෙයින් පත්‍රිකාවක් ඇමෙරිකාවට යවා ඇත. කර්නල් ඕල්කෝට් තුමාගේ ලංකා ගමනයට හේතුපාදක වූයේ මෙම පත්‍රිකාවක් ඔවුන් අත පත්වීම නිසා බව සඳහන් වේ. ඇත්තෙන්ම එය නූතන බෞද්ධ ප්‍රබෝධයේ සුවිශේෂී වූ සංසිද්ධියක් බව කිව යුතුය. පානදුරාවාදය ලාංකීය සමාජය තුළ නැවුම් පිබිදී වාදීභසිංහ මොහොට්ටිවත්තේ ශ්‍රී ගුණානන්ද හිමිපාණන්ගේ පුද්ගල සුවිශේෂතාවය එයින් මනාවට පෙන්නුම් කෙරෙයි.

මොහොට්ටිවත්තේ ශ්‍රී ගුණානන්ද හිමිපාණන් විසින් නිදහස් බෞද්ධ අධ්‍යාපනයට පදනම වැටීම මූලික තැනක් ගනී. විදුදය - ආනන්දය ආදී ශාස්ත්‍රශාලා බිහිවුයේ උන් වහන්සේගේ කැපවීම මතය. අගනුවර මුල්ම බාලිකා විදුහලද බිහි වූයේ උන් වහන්සේගේ පුරෝගාමිත්වයෙනි. උන් වහන්සේ මිත්‍යාවාදීන් මර්ධනය කිරීමට වාද කළා පමණක් නොවේ, සත්‍යමාර්ග ආදී ග්‍රන්ථකරය ද "රිවිරැස" වැනි පුවත්පත් මුද්‍රණය කරවූ බවද සඳහන්වේ. එසේම උන් වහන්සේ සිංහල භාෂා සාහිත්‍යයේ උන්නතිය සඳහා මූලාරම්භයක් ලෙසින් මිලින්ද ප්‍රශ්නය, කාව්‍ය ශේඛරය, පන්සියපනස් ජාතකය වැනි පොත පතද කොටහේනේ "සර්වඥශාසනාභිවෘද්ධි" නම් වූ ස්වකීය මුද්‍රණාලයෙහි මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරවන ලදි. සිංහල,පාලි, සංස්කෘත, ඉංග්‍රීසි, ලතින්, පර්සියන්, බුරුම, හින්දි, දෙමළ යන භාෂාවන්ගෙන් කීමෙනි. මනා නිපුණත්වයකින් හෙබි උන් වහන්සේ වෙතින් රට දැය සමයට සිදු වූ සේවාවන් දෙස බලන කළ උන් වහන්සේගේ නාමය ලක් ඉතිහාසයෙහි අමරණීයත්වයෙන් සදානුස්මරණීය වනු ඇත.

**චන්ද්‍රලතා සුමනසේකර - බොරැල්ල**

# මහියංගන ජනවහර

**අප රටේ පළාතෙන් පළාතට සිරිත් විරිත්, ගති පැවතුම් වල යම් යම් වෙනස්වීම් හා වෙනස් කම් දක්නට තිබේ.**

**ඒ නිසාම අප මෙවර ඌව පළාතේ බිංතැන්න හා මහියංගනය ප්‍රදේශවල පවතින සිරිත් විරිත් පිළිබඳව සොයා බලන්නට තීරණය කළෙමු.**

## උප්පත්ති පසුබිම

කාන්තාව ගැබ්ගත් බව දැනගත් පසු පළමු මාසයේ සිටම නව මාසය පිරෙන තුරුම ඇයට කසාය ලබා දීම සිදු කළ යුතුය.ලබාදෙන කසාය මාසෙන් මාසෙට වෙනස් කිරීමටද වගබලා ගන්නා අතර කසාය වට්ටෝරුව ගමේ වෙදමහතා විසින් ලබාදීම සිදු කරනු ලබයි. ගැබිණිය පිළිබඳව නිරන්තරයෙන් වෙදමහතා යකදුරා හා වින්නඹු මාතාව විසින් සොයා බැලීම ද සිදු කරනු ලබයි.

**දරුවෙකු ඉපදී මද වේලාවකින් පසුව ආවරණයක් නොමැතිව නිවස වටේ රැගෙන යෑම සිදු කරනු ලබයි. එම අවස්ථාවේ දී හඬ නගා යකඩයකට පහර දීමක් ද සිදු කරයි. එසේ සිදු කරන්නේ දරුවා පරිසරයට හුරු කිරීමේ අරමුණ ඇතිව බව කියැවේ.**

ගැබිණි මාතාවට පළමු මාසයේදී අන්නාසි, ඌරුමස් කෑම තහනම් කරනු ලබයි. මාස පහක් සම්පූර්ණ වීමත් සමඟම ඇයට මුදවාපු කිරි, වැල කිරි අල, මඤ්ඤොක්කා, මී පැණි ආදිය ආහාරයට දීමෙන් වැලකෙයි. ගැබිණිය අසනීප වූ විට යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් කිරීමද සිදු කරනු ලබන අතර ඇයට ඇති අසනීපය පිළිබඳව පරීක්ෂා කර බලනුයේ පේන අසන අයෙකුගෙනි. ගැබිණියන්ට ආරූඪ වන යකුන් කිහිප දෙනෙකු පිළිබඳව ද මතයක් පවතින අතර රීරී යකා, යක්ෂණී, සන්නියකා, තුන්පාලි යක්කු වශයෙන් නම් කර ඇත. වැදුගෙයි සන්නිය වැළැකිවීම සඳහා මවගේ සිරුරේ කොහොඹතෙල් ගල්වා ඇඹුල් දොඩම්, පාවට්ටා, නික, එඩරු කොළ ගෙන තම්බා නැහැවීම සිදු කරනු ලබනවා.රන්කිරි කට ගෑමේ ක්‍රම ද කිහිපයක්ම ක්‍රියාත්මක වේ. මේවා අදට ද මහියංගනය ප්‍රදේශයේ ක්‍රියාත්මක වේ. රිදී හෝ රත්තරන් මව්කිරෙන් උරගා දරුවාගේ කටේ ගෑම සිදුකරන අතර සොරකම, කේලම්, පස්පව් දස අකුසල් වලින් තොරවීම සඳහා මෙය සිදු කරනු ලබන බවයි මව්වරුන්ගේ මතය වන්නේ. ඇතැම්විට රන්කිරි කටගෑම ගමේ ප්‍රධානියෙකු විසින්ද සිදු කරනු ලබයි. දරුවෙකු ඉපදී මද වේලාවකින් පසුව ආවරණයක් නොමැතිව නිවස වටේ රැගෙන යෑම සිදු කරනු ලබයි. එම අවස්ථාවේ දී හඬ නගා යකඩයකට පහර දීමක් ද සිදු කරයි.එසේ සිදු කරන්නේ දරුවා පරිසරයට හුරු කිරීමේ අරමුණ ඇතිව බව කියැවේ. බාලගිරි දෝෂය සඳහා ද මේ ප්‍රදේශවල වෙනස් ක්‍රමවේදයක් අනුගමනය කරයි. පැගිරිකොළ ගෙන, **ඕං..... නමෝ කාලගිරි දේවගිරි ඊස්වාහං දේවගිරි කාලගිරි ඊස්වාහං...//** මන්ත්‍රය මතුරා වහලේ ඇතුළු පැත්තේ සවිකර තබන අතර එම කොළ පසුව දරුවාගේ තිලක තැබීමට විශේෂයෙන් යොදා ගනී.දරුවෙකු ඉපදී මාස 7 කදී පිරිමි දරුවෙකු නම් , ගැහැණු දරුවෙකු නම් මාස 9 කදී ඉඳුල් කට ගෑම සිදු කරනු ලබයි.

**කාංචන කුමාර ආරියදාස**

## විශ්මිත විශ්වය

# තුරුවදුළින් මිහිමතට

**තුරු වදුලින් මිහිතලයට පා තැබූ මිනිසා අනෙකුත් සත්ව ප්‍රවේනි වලට උරුම නොවූ සුවිශේෂී දායාදයක් නිසා හෝමෝ සේපියන් නැතහොත් බුද්ධිමත් මිනිසාගේ තත්ත්වයට පා තැබූහ.**

අපි කෙටි උදාහරණයකින් කතාව අරඹමු.

ආදිම වනචාරි මිනිසා අසු වුණ යමක් කා බී කොතැනක හෝ ගල්ගුහාවක විසුවේය.

ගල්ගුහාව අද්දර වූ ගසේ කපුටුවෙක් ද විසුවේය. කපුටා ලී කෝටු කීපයක් අක්‍රමවත්ව තබා තනාගත් කූඩුවෙහි බිජුවට දමා පරපුර රැකි අතර මිනිසා ගුහාව තුළ ඒ කාර්යය කළේය. දෙදෙනාටම කිතිකවමින් කාලය ගෙන ගියේය. මිනිසා සතෙකුට පහර දිම සඳහා ගල් කැබැල්ලක් තවත් ගලකට ගසා කුඩා කර ගැනිමට කරන ලද උත්සාහයේ දී මතු වූ පුංචි ගිනි පුපුරු ගැන පුංචි වට සිතුවේ. කපුටා කුරුළු බිත්තරයක් හෝ කුඩා සෙතෙකු ඩැහැ ගැනීම සඳහා කුරුමෑණුමක් ඇල්ලුවේය. දෙදෙනාගේ ආහාරය වූයේ අමු මස්ය.

මිනිසාට දැඩි ඝන විශාල දත් ද සවිමත් හකුපාඩාද වූ අතර කපුටාට තම ආදිම මී මුත්තාට මෙන් හොටය තුළ දත් තිබුණේ නැත. පක්ෂීන්ගේ ඉපැරණිම පෙළපතට හොට පුරා ඇතුලතින් දත් පිහිටා තිබුණි.

ගෙවී ගිය කාලය මිනිසාට අළුත් යමක් උගන්වමින් සිටියේය. දඩු කැබැල්ලකින් හෝ ගල් කැටයකින් ගසා සතෙකු මරා ගැනිමටත් සතුරකු බිය වද්ද පලවාහැරීමටත් ඒ කාලයේදී මිනිසා පුරුදුවිය. මේ මිහිතල මත ශ්‍රමය ක්‍රියාවට නැගුණ මුල්ම අවස්ථාවයි. මිනිසාගේ කුළුදුල් ප්‍රායාසය ඔහුගේ සිතීමේ ක්‍රියාවටද පන්නරයක් දුන්නේය.

ගලකට ගලක් ගැටෙන විට මතු වන කුඩා ගිනි පුපුරින් රුක් සුඹුලු අහුරකට ගින්දර ඇවිල වීමේ ප්‍රාතිහාර්ය කිරීමට මිනිසාට හැකිවූයේ සිතීමේ හැකියාව නිසයි.

කාක්කා ආහාර ගත්තේත් සතුරා එලෙව්වේත් ඌගේ උල් හොටිනි. මිනිසාගේ ගිනි මැලය දෙස ඌ නිකමට බලා සිටින්නට ඇත. නැතහොත් ගින්නේ රතු එළියට බිය වන්නට ඇත. ඌ පෙරපරදි පුරුදු ගොදුරම සොයා ගත්තේය.

තමන් විසින් මරා ගන්නා ලද සතාගේ මස් පුළුස්සා කන්නට මිනිසා යොමු විය. කැලෑවෙන් හාරා ගත් අල මුල් වර්ගද පුච්චාගෙන කුසගිනි නිවාගත්තේය.

ගුහාව තුළදී මිනිසා දරුවකුගේ පියෙකු බවට පත් විය. කපුටා දර කෝටු කැබැල්ල තුළ බිජුවට දමා දරුවන් තැනීය. මිනිස් පවුලේ කටවල් මිනිසාගේ බඩගින්න ඔහුට පීඩා කළේ ඔහු තවත් මාවතකට තල්ලු කිරීමේ යටි අදහසකිනැයි නොකිව යුතුද. මරාගන්නට කැලෑවේ සතුන් හිඟ වන විට බඩගින්න ඔහුට හොඳහැටි වේදනා කළේය. අවශ්‍ය වේලාවක මරා ගැනීම සඳහා සතුන් අල්ලා තැබුව හොත්....!


සතුන්ට ද ආහාර අවශ්‍යය බීමට ජලය අවශ්‍යය.

ගිනි මැලය අසලදි ඔහු තවත් රසවත් අත්දැකීමක් ලැබුවේය. අඩුවෙන් කෑම සඳහා කැලෑවෙන් ගෙනා ධාන්‍ය වල අහක ගිය ඇට ගින්නේදී විළද වී සුදුවට පෙණුනේය. මිනිසා හිතුවේ ඒවා ඇට මිදුළු කියා වෙන්නට ඇති. අහුලාගෙන කෑ විට ඒවායේ රසය මිනිසාගේ දිව පිනවූයේය.

කාක්කා තවමත් අර පුරුදු ජීවිතයේය.

මිනිසා ආහාර සඳහා සතුන් අල්ලා ඇති කිරීමට මිටියාවතට ගියේය. නදී තීරයෙහි පහත් බිම්වල තෘණ සරුවට වැවී තිබිණි. දොරුමඩ වගුරු එමට තිබුණේය.

මේ වනවිට මිනිසා ශ්‍රමය ගැන දැන සිටියේය. ගින්දර සොයාගෙන තිබුණේය. ධාන්‍ය ද හඳුනාගෙන අහවරය. මිටියාවතට



ගිය මංගල ගමන මිනිසාට මංගල්‍යයක්ම විය. ඔහු සතුන් ගාල් කළ අතර මඩ ගොහොරුවල ධාන්‍ය වැවීය. එහෙත් තමා වැසි සුළඟින් ආරක්‍ෂා වූ ගුහාව මිටියාවතෙහි නොවීය. ගුහාවේ සිට මිටියාවතට විශාල දුරක් වූ නිසා එහි යාම ඒම නොකළ හැකි දෙයක්විය. නදී තීරයෙහි ඔහුට ආහාර සුළභ විය. ඇයි මාළු.

එබැවින් ගුහාව හැර දමා ධාන්‍ය පඳුරු හා තෘණ සෙවිලි කොට තනි යාලත්තියක් අටවා ගෙන ඒ තුළ විසීමට මිනිසා මහන්සි ගත්තේය.

කපුට! අපොයි ඌ තවමත් අර දිරකඩ කැදැල්ල මතය.

මිනිසාගේ ආරම්භක පැල්කොටය, ගුහාව තරම් උණුසුම් නොවූ අතර අනාරක්ෂිත විය. දවාලට දඩයමේ යාම ද තවම ඔහු අත්හැර තිබුණේ නැත. විශාල සතුන්ගෙන් සිදුවන අනතුරුද බහුල විය. ගලකින් ගසා හෝ දඩුමොණරකින් ගසා සතුරාගෙන බේරීමට නොහැකි වූ තැන මිනිසා ඒ ගැනද සිතුවේය. ඒ සඳහා උපකරණයක් නිපදවා ගත යුතුය. සරළ දුන්න හා ඊතල සොයා ගත්තේ ඒ අනුව.

මේ යුගයේ දී දේශගුණ විපර්යාසයන් හා වර්ෂාපතන නිසා මිනිසාට නොසිතූ ආපදාවක් අපල කළේය. දැඩි සිතලට ගිනි ගොඩ පමණක් මදිවිය. ඒ නිසා සිරුරේ උෂ්ණය ආර්ක්ෂා කර ගැනීමට ගස්වල පොතු සුඹුළු හා මරාගන්නා සතුන්ගේ සම් ආදිය යොදාගෙන සිරුර ආවරණය කර ගැනිමේ කැලෑ තාක්‍ෂණයට ඔහු අත්පොත තැබුවේය.

එහෙත් කපුටාට උපන් ඇඳුම පමණක් විය. උගේ ජීවිතයෙහි කිසිදු වෙනසක් ගත වූ වසර ලක්‍ෂ ගණන තුළම සිදු වූයේ නැත.

කපුටා තවමත් දරකෝටු උඩමය. උන්ට නායකයෙක් නොවීය.

නදීබඩ පැල්පත තුළ තම වැඩිහිටියෙකු හෝ අනතුරකින් පවුලේ කණ්ඩායමේ කිසිවෙකු මළ කල්හි මළ සිරුර ගඟට ඇද දැමුවා විය හැකිය. ගඟ ඒවා පතුළේ සිරුර රොන් බොර අතර රැක ගත්තේය. දේශගුණික විපර්යාසයන් නිසා ගඟ ගොඩ වූ අතර වසර ලක්‍ෂ ගණනකට පසු වර්තමාන මිනිසා පොසිල වශයෙන් හෝ දිරාපත් ඇටකටු වශයෙන් ඒ ආදි මිනිසාම ඉඳහිට මතුවේ. හැබැයි ඉතින් විද්‍යාඥයන් කියන මේ වර්තමාන මිනිසුන් ඒ පුරා ජීවයන් ගැන පවසනදේ බැරිවෙලාවත් උන් දන්නවානම්..!

ඔවුන්ගේ අවශ්‍යතා ද කෙමෙන් වැඩි වර්ධනය වූයේය.

පුළුස්සාගෙන, තම්බා ගෙන යමක් කෑමට ඔහුට සිතෙන්නට ඇති. පිළිස්සීමේ දී මස් විශාල ප්‍රමාණයක් විනාශ වීම ද ඔවුන් සිත් වේදනාවක් වන්නට ද ඇති. ලී කොට කැබැල්ලක ලොකු සිදුරක් සාදා මස් ඒ තුළට දමා ජලය යොදා තම්බා ගන්නට මිනිසා පුරුදු විය. ලී කොටයේ පිළිස්සීම වලක්වා ගනු සඳහා ඒ වටා මැටි තවරන්නට ඇති. ඇතැම් විට රං කුඹලෙකු කොතැනක හෝ මැටියෙන් කුඹල් නිවස තනන හැටි ආදී මිනිසා අධීක්‍ෂණය කරන්නට ඇති.

කෙසේ හෝ මිනිසා වළං තැනීම ඇරඹුවේ. කුරුළු කූඩුවකින් සොරා ගත් බිත්තරය තම්බා ගන්නට කපුටා වළඳක් සෑදුවේ නැත.

ඉපැරණි රථ ගල් ආයුධ වෙනුවට සියුම්ව ගල් මෙවලම් තැනීම් තාක්‍ෂණය දැනටමත් මිනිසාට පුරුදුව තිබිණි. එහෙත් ඔහුට කළ යුතු වූ බහු කාර්යයන් සපුරා ඉටුකර ගැනීමට ගල් මෙවලම් ප්‍රමාණවත් හෝ සියුම් හෝ නොවීය. ආහාර නිවාස සරල මෙවලම් ආදිය තිබෙන නිසා එදා මෙන් මුළු දහවලම දඩයමේ යාමට මිනිසාට අවශ්‍ය නොවීය. විවේකයක් ලැබිණි. ඔහුගේ චින්තනය ද වර්ධන අවස්ථාවේ පැවැතිණි.

ආහාර සකසමින් දරුවන් ද බලා ගනිමින් ගැහැණිය පැල්පතේ ගතකරද්දී ඇඳුම් සැකැසීම, බෙලිකටු, සත්ත්ව ඇටකටු ගෙඩිවර්ග ආදියෙන් ආභරණ තැනීම වැනි ගෘහ කටයුතු වල නිරත වූවාය. මිනිසා තවත් දේ සෙවීමෙහි නිරත විය. ඔහුගේ මනසට වදදුන් බරපතල ගැටළුවක් වූයේ තමා ළඟ තිබෙන ආයුධ කරන්නට ඇති වැඩකටයුතු සඳහා සවිමත් හා සියුම් නොවීමයි. අදත් අපගේ වතුපිටි වල දක්නට ලැබෙන්නක් වැනි යකඩ ගල් එදා ගල් රත්කොට තලා නව පන්නයේ අවි ආයුධ තනා ගැනීම කෙරෙහි මිනිසා යොමුවිය. මිනිසා යකඩ සොයා ගත්තේය.

මේ වකවානුව තුළ මිනිස් වර්ගයා මිහිතලයේ බොහෝ ප්‍රදේශවල ජීවිත සටන කරමින් විසිර සිටියහ.

කාක්කෝ ද එසේ විසිර සිටියහ. නමුත් හුදෙක් කාක්කන්ම වශයෙන් පමණකි.

දන් මිනිසා ගුහාවෙන් මිටියාවතටත් එතැනින් වෙන්ත් අවධියකටත් සංක්‍රමණයවී මස්, කිරි, ධාන්‍ය, පළතුරු, මී පැණි, මාළු, අල, මුල් වර්ග, කොළ මල් තියුණු අවි ආයුධ හොඳ පැල්පත් ආභරණ ආදියෙන් පොහොසත්ව කාල ගත කරයි.

එතෙක් සිය අදහස් හුවමාරුව සඳහා භාවිතා කරන ලද සංඥා ක්‍රමය මිනිසාගේ අවශ්‍යතා වලට ප්‍රමාණවත් නොවිය. තම සත්ව ගාලේ ඉන්නා සතුන් ගණන නිවැරදිව දැන ගැනීමේ උවමනාව තිබිණි. සොරකමද පැතිර තිබුණු බැවිනි. ගාලේ සතුන්ගේ ප්‍රමාණයට ගසකට පොරෝ පහරවල් ගැසිමේ සිරිත මුලින්ම ඇරැඹෙන්නට ඇති. අදහස් හුවමාරුව සඳහා උගුරින් කරන ලද සංඥා ආශ්‍රයෙන් බසක් උච්චාරණය කරන්නට ඇති. බිළිඳකු පැටි අවදියෙන් බස උසුරුවන්නාක් මෙනි. එහෙත් එදා ඔවුන්ගේ බස සංයුක්ත වූයේ තම වටාපිටාවේ පමණටය.

හොඳ ආහාරයක් ලැබීමෙන් නැතහොත් වෙනයම් සතුටක් ඉහවහා ගිය විටෙක තම බඩට දෑතින් තට්ටු කර ගනිමින් ඔහු ප්‍රාථමික ගීතය ගැයුවේය. අදත් අප භාවිතා කරන බෙරය, රබාන පිළිබඳ මූලික අවස්ථාව එය විය හැකිය.

කාක්කාත් මිනිසාත් එකට හැදි කාලාන්තරයක් එකට වාසය කළත් මිනිසා අලුත් අලුත් පිම් කීපයක් පැන ශිෂ්ඨාචාරය කරා සැපත් වූයේ ඇයි. එයට හේතු සාධක කවරේද? එවැනි හේතු බොහෝ ගණනක් ඔබ මේ රචනයේදී කියවන්නටත් ඇති.

මිනිසා අනෙකුත් සතුන්ගෙන් ඈත් කිරීමේ විශිෂ්ඨතම කාර්යය ඉටුකළේ ඔහුගෙ අත ය. නැතහොත් ශ්‍රමයයි. බොහෝ දෙනෙකු කියන පැරණි මතාන්තරය වූ මොළය නොවේ. මොළය ක්‍රියාත්මක වූයේ ශ්‍රමයේ උපාංගයක් ලෙසටයි. අනෙක් අතට මොළය සහජ ධර්මයක් ද නොවේ. මිනිසාගේ අත්දැකීම් අනුව මුහුකුරා යන්නෙකි. තුරුවදුලින් බිමට වට මානව වානරයා අත් උපයෝගී කරගෙන ආහාර සොයා ගැනීම සතුරන්ට පහර දීමත් කළේය. දෙපයින් මදක් වක්කවී සිට ගැනීම නිසා ඔහුගේ අත් නිදහස් විය. එහෙත් තැනිතලා බිම් වලදී ඌ හතරගාතයෙන් ද නොගියා නොවේ. සතුරු බියකදී එසේ කරන්නට ඇත. අදත් ගෝරිල්ලා, චින්පන්වියා, ඔරන් ඔටං සහ ගිබනයා වැනි මිනිස් වානරයාගේ පූර්වජයන් එසේ කරති. එසේ වුවද ඒ පූර්වජයන්ට අත හුරු වන්නේ හුරු කළොත් පමණකි. සර්කස් කණ්ඩායම් වල දී හා සත්ත්ව පර්යේෂණාගාර වලදී මේ සතුන් නොයෙකුත් මිනිස් ක්‍රියාවන්හි නිරත වන්නේ පුරුදු කිරීමෙනි. ඕස්ට්‍රේලියාවේ ඇතැම් වඳුරු වර්ගයන් අතු කැබැල්ලක් කඩා ගුල්වල සිටින කෘමීන් අල්ලා ගැනීම වැනි අවස්ථා කලාතුරකින් දක්නට ඇතත් එය ද දියුණුව නිසා කරන්නෙකැයි පිළිගන්නේ නැත. මානව වානරයා අත භාවිතා කළේ සටන් පිණිසම නොවේ. මුලදී මෙය ආහාරය සඳහා ද සතුරන් සමඟ සටන් කිරීමට ඔහු පෙළඹුණේ ඉන් අනතුරුවය. ඉක්බිති මෙවලම් නිපද වීමටය. මෙහි මුලදී සඳහන් කළ පරිදි මානව වානරයා පූර්ණ මිනිසෙකු බවට පත්වීම ආරම්භ කළේ අත, ශ්‍රමයේ ඉන්ද්‍රිය වූවාට පසුවය. දෙපා ගමනේ දී හිස සෘජුව පැවතීම නිසා මොළයේ එතෙක් නොවූ ඉන්ද්‍රිය සංවර්ධනයකුත් සිදුවිය. මිනිසාගේ බුද්ධි ඉන්ද්‍රිය වැඩුනේ ඒ නිසාය. කලින් සිතා බලා යමක් කිරීමේ හැකියාව ඇති වූයේ එහෙයිනි. එතෙක් මානව වානරයා වුවද ජීවත් වූයේ පරිසරයට අනුවය, යටත්වය. ශ්‍රමයත් එයට අනුරූපව බුද්ධියත් ක්‍රියාත්මක වත්ම මිනිසාගේ වර්ධනය ඉක්මන් හා ක්‍රමවත් විය. නියැන්ඩතාලයාගේ සිත මිනිසා දක්වා මානව වානරයාගේ ප්‍රගමනය ඉටුවීමට වසර දස ලක්‍ෂයක් පමණ ගත විනැයි සාමාන්‍යයෙන් සැලකේ. මේ පරිණාමය සිදුවූයේ එක් තැනක එකම කාලයක හෝ එකම කොටසකට පමණක් සීමා වී නොවේ. නියැන්ඩතාල් ඝනයේ කැළෑ මිනිසුන් ලොව විද්‍යාමාන වන බව සොයාගෙන තිබේ. ඔවුන්ගේත් ක්‍රොමනියොන් වරුන්ගේ ගති ලක්‍ෂණ සහිත මිනිසුන් ශිෂ්ඨ සමාජයේ දී දක්නට ලැබේ.

ශ්‍රමය මිනිසාගේ විශාලතම විප්ලවීය පරිවර්ථනය ඇති කරන ලදී. එදා ඔහු තුළ වූ ළඳරු බුද්ධිය මිනිසාගේ ශිෂ්ඨාචාර ගමන ඉක්මන් කළේය. ඔහුගේ පූර්ණ ජීවිතයට ඒ සමඟම බලපෑමේ සංක්‍රමණයයි. සංක්‍රමණයේදී වෙනත් මානව කණ්ඩායම් සමඟ එක්වූ අත්දැකීම් ද හුවමාරු කරගනිමින් මිනිස් පරපුර නව මාවතකට පිලිපන්නේය. මානව වානරයාගෙන් වෙන්වූ කැළෑවෙන් එළිමහනට එන්නට ගත වූ කාලය අතිවිශාලය. අර මූලික ක්‍ෂුද්‍ර ජීවියාගේ පටන් එම කාලය ගිනිය යුත්තේ අවුරුදු කෝටි වලිනි. එහෙත් කාල් ලින්නේ (1707) පවසන ලෙස මිනිසා (හෝමෝ) ගෙන් නුවණැති මිනිසා නැමැති එකම මානව විශේෂය ඇතිවීමට වසර විසි ලක්‍ෂයකට වඩා ගත වී නැත. ලින්නේ හෝමෝ මිනිසා තබන්නේ මානව වානරයා ලඟින්ය. නුවණැති මිනිසා ඊලඟටය. මේ හාස්කම සිදුවූයේ බුද්ධිය කරණ කොට ගෙනය.

15 පිටුවෙන්

**සිරිපාල කඳුමුල්ල මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පළ කෙරේ.**

රංගිරි ශ්‍රී ලංකා
සත්‍ය ගවේෂී බෞද්ධ හඬ
රංගිරි ශ්‍රී ලංකා 2020 අප්‍රේල් - 2563 බක් කලාපය

**යම් කෙනෙක් මිතුරන් හට ද්‍රෝහි නොවේද කෝප නොවී තම නිවසට පැමිණේද, පිරිස මධ්‍යයේ සතුටට පත්වූයේද, එබදු තැනැත්තා ඥාතීන්ට උතුම් වන්නේය.**

# ථූපාරාම දාගැබ් වහන්සේ



සිරිලක් දෙරණෙහි රාජ්‍ය කළ දෙවන පෑතිස් රජු දවස සිදුවූ මිහිඳු මහ රහතන් වහන්සේගේ ලංකාගමනයේ ප්‍රතිඵලයක් වශයෙන් උතුම් බෞද්ධ ශිෂ්ටාචාරයක් ශ්‍රී ලංකාවට උරුම විය. රුවන්වැලි සෑ රඳුන්ට උතුරු දෙසින් මහමෙව්නා උයනෙහි බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව නිධන්කර දෙවන පෑතිස් රජතුමා විසින් මෙම ථූපාරාම දාගැබ කරවූ බව වංශ කථාවෙහි සඳහන් වෙයි.

මෙම ස්ථානය මෙයට පෙර වැඩසිටි බුදුරජාණන් වහන්සේලාගේ පහසලත් පුණ්‍ය භූමියක් ලෙස සැලකේ. මෙහි වැඩ වෙසෙන භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා විහාරාංගයන් රාශියක් මෙම රජතුමා විසින් කරවා භික්ෂූන් වහන්සේලාට පූජා කළ බව ශාසන ඉතිහාසයෙන් පැහැදිළි වෙයි.

ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුරයක් මෙහි රෝපණය කරවූ රජතුමා අනෙකුත් විහාරාංගයන් ද ඇති කළේය.

අනුරාධපුර රජකළ වසභ රජතුමා මෙම ථූපාරාම දාගැබට වටදාගෙයක්ද, ස්ථූප ගෘහයක්ද කරවිය. දැනට ශේෂවී ඇති කැටයම් සහිත ගල්කණු ඊට සාක්ෂි දරයි.

මෙම ගෘහ නිර්මාණය සිදුකර ඇත්තේ ස්ථූපය අව් වැසි වලින් බේරා ගැනීමටත් සැදැහැවත් ජනයාට අපහසුතාවයකින් තොරව වන්දනාමාන කිරීමත් සඳහාය.

ගෝඨාභය රජතුමා මෙම ස්ථූපයට නැවත ගෘහයක් කරවූ බව වංශකථාවල දක්වේ. පළමුවන උපතිස්ස රජතුමා මෙම ථූපයට රන් ආලේප කරන ලද කොතක් සවිකල බව සඳහන් වේ. දෙවන අග්බෝ රජතුමා ථූපාරාමය අවට මළුව අලංකාර කර ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකළ බව ඓතිහාසික තොරතුරු වලින් සනාථ වෙයි.

ස්ථූපයේ ආරක්ෂාවට ශෛලමය ප්‍රාකාරයක්ද පියගැට පංතියක්ද වාමණ රූපයන්ගෙන්ද යුක්ත වන ලෙසට ප්‍රතිසංස්කරණය කරවූ බව වැඩි දුරටත් මෙහි සඳහන් වෙයි. පිහිටි භූමියේ සිට අඩි 12ක් පමණ උසින් සකස්කළ විශේෂ මණ්ඩපයක මෙම ස්ථූපය නිර්මාණය කර තිබීම විශේෂ සිද්ධියක් ලෙස සැලකේ. මෙම ස්ථූපය අසල කුඩාවට සාදන ලද ස්ථූපයක් දක්නට ලැබේ. මෙය පාද ලාංඡන ස්ථූපය වශයෙන් හැඳින්වේ.

මෙය ප්‍රධාන ථූපාරාම වෙහෙරට (ස්ථූපයට) සාදවන ලද පරිවාර ස්ථූපයක් බව විමසා බලන ඉතිහාසඥයින්ගේ මතයයි. ලිදක් වැනි ආවාටයක් මේ අසලින් දක්නට ලැබේ. නාගයන් මතු වූ ස්ථානයක් වශයෙන් සැලකෙන මෙය ජලය ලබාගත් පොකුණක් වශයෙන්ද සැලකේ.

විදේශීය ආක්‍රමණයන්ට හසුවී විනාශ වී ගියත් ප්‍රතිසංස්කරණය වී වර්තමානයේ ඉතා අලංකාර ලෙස පෙනෙන ථූපාරාම වෙහෙර සොළොස්මස්ථාන වන්දනාවට අයත් වේ. වන්දනාව සඳහා අනුරාධපුරයට පැමිණෙන සැදැහැවතුන්ගේ නෙතට ගැටෙන මෙම ස්ථූපය දෙස් විදෙස් සංචාරකයින්ගේ බුහුමන් ලබන ස්ථානයක් බව සඳහන් කළ හැකිය.

සැදැහැවතුන්ගේ විවිධ පූජාවන්ට පාත්‍රවන මෙම පිංබිම අපේ බෞද්ධ සංස්කෘතියේ ඉතා වැදගත් සිත් ගන්නා නිර්මාණයක් ලෙසින් දැක්විය හැකිය. ථූපාරාම විහාරයේ භාරකාරත්වය හා රජයෙන්ද විවිධ අවස්ථාවලදී මෙහි දියුණුව සඳහා ක්‍රියාකර ඇත. එහි ප්‍රතිපලයක් වශයෙන් වර්තමානයේ ථූපාරාම ස්ථූපය සිත් ඇදගන්නා ආකාරයක් දිස්වේ. මෙම ස්ථානයට වන්දනා කිරීමට පැමිණෙන බෞද්ධ ජනතාව ඉමහත් බැතියෙන් කටයුතු කරති. බෞද්ධ ජනතාවගේ මහාර්ඝ පූජනීය ස්ථානයක් වන මෙම ථූපාරාම දාගැබ් වහන්සේ සුරැකීම අප සැමගේ පරම වගකීම වන්නේය.

**ඇම්. ඞී. විජයවර්ධන**

## ධම්ම පද ගීතය

(''අරහත්ත වග්ගය'' 91.1 - 93.4 ඇසුරිණි)

### "විලහල හංසා"

**ගුවන සිසාරා යන විහඟුන් ගේ**
**පිය සටහන් ලොව කව්රුද දුටුවේ**
**නිවනට පිළිපන් මහ රහතුන් ගේ**
**වැඩි මඟ නැත කිසි සලකුණු රැඳුනේ**

**සිව් පියසටහන් නැත ලොව බැඳුනේ**
**තණ්හා ආශා සිඳ බිඳ දැමුවේ**
**සකල කෙළෙස් දානය අත්හැරියා**
**විල හැර පියඹන හසකු වගේ**

**සතර සතිපට්ඨාන පිහිටා**
**සමථ විදසුන් බවත් වඩවා**
**සියලු බැඳි බැමි පුපුරුවා හැර**
**ඒ අමා මඟ දිගේ වඩිනා**

*පී.එම්. අහංගම*

දඹුල්ල නුවර පාර, අංක 130 දරණ ස්ථානයේ පිහිටි රංගිරි දඹුල්ල සංවර්ධන පදනම විසින් 2020-04-06 දින අන්තර්ජාලයට එක් කරන ලදි.